## 2021/12/14 දින පැවති මහාසභා රැස්වීම් වාර්තාව

2021/12/14 දින පෙ.ව. 10.30 ට නාගොඩ ප්‍රදේශීය සභා රැස්වීම් ශාලාවේදී රැස්වීම පවත්වන ලදී.

**සහභාගී වූ**

| | | |
|---|---|---|
| 1. | නිමල් වික්ටර් නාගොඩවිතාන මහතා | ගරු සභාපති |
| 2. | එම්.කේ. ගාමිණී සුසන්ත මහතා | ගරු උප සභාපති |
| 3. | ඒ.එච්.වී. අජිත් කුමාර මහතා | ගරු මන්ත්‍රී |
| 4. | ඩබ්. ජී. නිශාන්ත මහතා | ගරු මන්ත්‍රී |
| 5. | සී.වී. සහබන්දු මහතා | ගරු මන්ත්‍රී |
| 6. | බන්දුල සමන්ත හිරිමුතුගොඩ | ගරු මන්ත්‍රී |
| 7. | එච්.ජී. තරංග සුදර්ශන මහතා | ගරු මන්ත්‍රී |
| 8. | කුමාරගේ වසන්ත මහතා | ගරු මන්ත්‍රී |
| 9. | එච්.කේ.ලක්රුවන් සම්පත් මහතා | ගරු මන්ත්‍රී |
| 10. | එන්.ජී. ගයාන් මධුෂංඛ මහතා | ගරු මන්ත්‍රී |
| 11. | ධර්මසිරි ගනේවත්ත මහතා | ගරු මන්ත්‍රී |
| 12. | පියල් හිරිමුතුගොඩ මහතා | ගරු මන්ත්‍රී |
| 13. | සුභාෂි මධුමාලි ඒකනායක මෙනවිය | ගරු මන්ත්‍රිනී |
| 14. | එඬේරආරච්චි වෙරංග ලක්මාල් මහතා | ගරු මන්ත්‍රී |
| 15. | නාපෙ විතානගේ සමන් මහතා | ගරු මන්ත්‍රී |
| 16. | සී. වනිගරත්න මහතා | ගරු මන්ත්‍රී |
| 17. | විල්ලේගේ අමර ධනංජය මහතා | ගරු මන්ත්‍රී |
| 18. | ප්‍රියන්තා ගුණසේකර මහත්මිය | ගරු මන්ත්‍රිනී |
| 19. | එම්.එම්.දිසානායක මහතා | ගරු මන්ත්‍රී |
| 20. | එන්.ඩබ්. පතිනායක මහතා | ගරු මන්ත්‍රී |
| 21. | විජිත් වීරගුණරත්න සහබන්දු මහතා | ගරු මන්ත්‍රී |
| 22. | කේ.කේ.අයි.නෙරංජලී මහත්මිය | ගරු මන්ත්‍රිනී |
| 23. | කේ.ඒ.සී. දිල්රුක්ෂි මහත්මිය | ගරු මන්ත්‍රිනී |
| 24. | එච්.එච්. ගයන්ති කුමාරි මහත්මිය | ගරු මන්ත්‍රිනී |
| 25. | ඩබ්. කේ. නෙලී මහත්මිය | ගරු මන්ත්‍රිනී |
| 26. | කේ.එච්.එම්.නදීකා දර්ශනී මිය | ගරු මන්ත්‍රිනී |
| 27. | පී.ජී. රංජිත් ජයවීර මහතා | ගරු මන්ත්‍රී |

**01. ආගම සිහි කිරීම**

2021.12.14 දින මහා සභාව ආරම්භ කිරීමට පළමුව පැමිණ සිටි සියලු දෙනා තම තමන්ගේ ආගම සිහි කිරීමෙන් අනතුරුව මිය ගිය ඥාතීන් රණවිරුවන් සිහිපත් කර විනාඩියක නිශ්ශබ්දතාවයක් පළ කළේය.

**02. මූලාසනයේ පිළිගැනීමේ කතාව**

ගරු උප සභාපතිතුමා ඇතුළු මන්ත්‍රීවරුනි, සියලු දෙනාගෙන් අවසරයි. අද අපට සුවිශේෂ දවසක්. මොකද 2022 වර්ෂය සඳහා අයවැය ඉදිරිපත් කිරීමට බලාපොරොත්තු වෙනවා. ඒ අනුව අද දින දැණුම් දීම පරිදි ගරු සභාවට සහභාගි වන ගරු උපසභාපතිතුමා ඇතුළු මන්ත්‍රීතුමන්ලා, මන්ත්‍රීතුමියන්ලා පිළිගනිමින්, සභාව ආරම්භ කරනවා.

**(අ)01. 2021.11.09 දින පැවති මහ සභා වාර්තාවේ නිවැරදි කිරීම් ඇත්නම් ඒවා නිවැරදි කර වාර්තාව ස්ථිර කිරීම.**

**(අ)02. පසුගිය වාර්තාවේ යෝජනා සඳහා ඉදිරිපත් කර ඇති සංශෝධන ඉදිරිපත් කිරීම**

2021.11.09 දින පැවති මහා සභාවේ සභා වාර්තාව සභාව පිළිගතයුතු සත්‍ය වාර්තාවක් ලෙස ගරු මන්ත්‍රී ධර්මසිරි ගනේවත්ත මහතා විසින් යෝජනා කළ අතර ගරු මන්ත්‍රී චන්ද්‍රසිරි වනිගරත්න මහතා විසින් ස්ථිර කිරීමෙන් අනතුරුව ඒකමතිකව සභා සම්මත විය.

**(ආ). සභාපතිතුමා විසින් කරනු ලබන විශේෂ නිවේදන**

**(ඇ). සන්දේශ පෙත්සම් පැමිණිලි ඉදිරිපත් කිරීම**

01. ජේ.ඒ.අබේසුන්දර, නාගොඩ ඉහළ, නාගොඩ විසින් යොමු කරන ලද වී.කේ.අනුර මහතාගේ නිවස අසළින් සළකුණු කර ඇති අකුලහේන මාර්ගය සම්බන්ධ ලිපිය සභාගත කරන ලදී.

02. ඩබ්.ඒ.ටී.කේ.වීරසිංහ, ජනඋදාන ගම්මානය, නියාගම , තල්ගස්වල විසින් 2021.11.15 දිනැතිව යොමු කරන ලද උඩුගම සඳුදා සති පොළ පැවැත්වීම සම්බන්ධ ලිපිය සභාගත කරන ලදී.

03. පළාත් පාලන දෙපාර්තමේන්තුව, ගාල්ල විසින් 2021.11.30 දිනැතිව යොමු කරන ලද පළාත් පාලන ආයතන තුළ කම්ටු ක්‍රමය ශක්තිමත් කිරීම සම්බන්ධ ලිපිය සභාගත කරන ලදී.

04. කේ.ඒ.කරුණාතිලක මයා, සමගිගම, උඩුගම විසින් 2021.12.11 දිනැතිව යොමු කරන ලද ජංගම වෙළඳ රථයක් මගින් වෙළදාම් කිරීම සඳහා අවසර ලබා ගැනීමේ ලිපිය සභාගත කරන ලදී.

05. සංවර්ධන නිලධාරී (ප්‍රජා), නාගොඩ ප්‍රාදේශීය සභාව විසින් 2021.12.10 දිනැතිව යොමු කරන ලද මන්ත්‍රී ප්‍රතිපාදන යටතේ නම් කර එවා ඇති පෙර පාසල්වලට උපකරණ ලබා දීම වෙනුවෙන් ලද මුදල් සඳහා පෙර පාසල්වලට අවශ්‍ය උපකරණ ඉල්ලුම් කිරීම සම්බන්ධවයි.

06. 219 බී උඩුගම දකුණ ලිපිනයේ පදිංචි කේ.ඒ.කරුණාතිලක මහතා විසින් 2021.12.11 දිනැතිව යොමු කරන ලද ජංගම වෙළඳ රථයක් මගින් වෙළදාම් කිරීම සඳහා අවසර ලබා ගැනීමේ ලිපිය සභාගත කරන ලදී.

**(ඈ). යථා පරිදි කල් දී ඇති ප්‍රශ්න**

නැත

**(ඉ). යථා පරිදි කල් දී ඇති යෝජනා**

**(ඉ). 1. ගරු සභාපති නිමල් වික්ටර් නාගොඩවිතාන මහතා ඉදිරිපත් කරන පරිපාලන යෝජනා.**

01. 2022 වර්ෂය සඳහා සකස් කරන ලද අයවැය වාර්තාව සහා අනුමැතිය සඳහා ඉදිරිපත් කිරීමට යෝජනා කරමි.

**ගරු සභාපතිතුමාගේ අයවැය පණිවිඩය**

ශ්‍රී ලාංකේය දේශපාලනයේ මෑත යුගයේ පාලක පක්ෂයට මුහුණ දෙන්නට සිදු වූ ප්‍රබලතම අභියෝගයන් රැසක් හමුවේ, ප්‍රාදේශීය දේශපාලන භූමිකාව මෙන්ම, එකී භූමිකාවන්ගෙන් සැදුම්ලත් ආයතන ව්‍යුහයද, යම් හුදෙකලා භාවයකට පත්ව ඇති බව නොරහසකි. විශේෂයෙන් දළ දේශීය නිෂ්පාදිතයේ මෙන්ම භාණ්ඩ හා සේවාවන්හි පසුබෑම හේතුකොටගෙන, මේ වන විට රටේ ආර්ථිකයේ අවගමනයක් පෙන්නුම් කළද, ඒ සියළු බාධක හමුවේ නොසැලී ක්‍රියාකරන්නට, වත්මන් රජය විවිධ සැලසුම් හා ක්‍රියාමාර්ග ගනිමින් සිටී. රටක යම් ජන කොටසක් විසින් මහජන ආයතන නඩත්තු කරන්නේත්, ඒවා සඳහා මහජන නියෝජිතයින් තෝරා ගත්තෙත් නානාවිධ අපේක්ෂාවන් පෙරදැරිකරගෙන බව අපි හොඳින් දන්නා කාරණයකි. පොදු උපයෝගීතා සේවාවක් වෙනුවෙන් පුරෝගාමී කාර්යභාරයක් ඉටුකරන රාජ්‍ය ආයතනයක් වශයෙන්, ප්‍රාදේශීය සභාව වඩාත් මහජනතාවට සමීප වූ ආයතනයකි. මේ නිසා විවිධ ජන කොටස් ඒ කෙරෙහි ලොකු විශ්වාසයක් තබා ඇති බව මම අවබෝධ කර ගත්තේ, අද ඊයේ නොව, නවක මන්ත්‍රීවරයෙකු වශයෙන් සභාව නියෝජනයට පැමිණි වකවානුවේ සිටය. සුරංගනා කතා කියමින්, ටොෆි, චොකලට්, කඩල, පෙන්වමින්, පවතින යථාර්ථයෙන් බැහැරව, මහජනතාවගේ මානසිකත්වය ඔවුන්ට නොපෙනෙන, කාල්පනික ලෝකයක් හා දේශයක් කරා රැගෙන යන්නට කිසිම විටක මා කටයුතු කර නැති බවත්, එසේ කිරීමට අපේක්ෂා නොකරන බවත්, මෙහිදී අවධාරණය කළ යුතුව තිබේ. මගේ නිල කාලය තුළ ප්‍රාදේශීය සභාවට පැහැදිලි, බහුතර බලයක් හිමි වූයේ, වත්මන් පාලනය ස්ථාපිත වූවායින් පසුව බව බොහෝ දෙනා දන්නා කාරණයකි. ඉන් පෙර කාල සීමාව, විවිධ හේතු නිසා, පසුගාමී ස්වරූපයක් පෙන්නුම් කළ බවද නොරහසකි. කෙසේ වෙතත් වර්තමානයේ අපි ලබාගත් ප්‍රගතිය පිළිබඳව හා යථා තත්ත්වය පැහැදිලි කිරීම ඉතා වැදගත් යැයි හැඟුණ බැවින්, ඉහත කරුණු කිව යුතුව තිබේ.

නානාවිධ දුෂ්කරතා මධ්‍යයේ සභාවේ ඉදිරි කටයුතු හා සැලසුම් සකස් කරන මේ අවස්ථාවේ, 2022 අයවැය වෙනුවෙන් යම් ධනාත්මක සුබ පැතුමක් එක් කරන්නට ලැබීම, අතිශය සොම්නසට කාරණයක් ලෙස මෙහිලා සඳහන් කරනු කැමැත්තෙමි. පසුගිය වර්ෂ වලට සාපේක්ෂව, මෙම වර්ෂය තුළ අත්කරගත් ප්‍රගතියත්, ඉදිරියේදී ක්‍රියාත්මක කිරීමට අපේක්ෂිත අරමුණුත් යන කාරණා විෂයෙහි, ඔබගේ අවධානය යොමු කරවීම කාලෝචිත යැයි හැඟේ. මින් පෙර නිකුත් කරන ලද අයවැය පණිවිඩ ඔස්සේ, අප විසින් ක්‍රියාවට නංවන ලද වැඩසටහන් හා ඉදිරියේ දී ක්‍රියාත්මක කරවීමට අපේක්ෂිත සංවර්ධන ක්‍රියාදාමයන් පිළිබඳව ඔබව දැනුවත් කරන්නට විය. එකී වැඩසටහන් කිහිපයක් අතපසු වුවත්, කල්ගත වී හෝ, ඒවා මල්ඵල ගැන්වීමට හැකිවීම පිළිබඳව, මා මෙන්ම ඔබද සතුටු විය යුතු කරුණකි.

ගෙවී ගිය කාලය තුළ, ප්‍රාදේශීය සභාව හා මධ්‍යම රජයේ මැදිහත්වීමෙන්, බල ප්‍රදේශයේ මහජන සේවාවන් රැසක් ක්‍රියාත්මක කරවීමට තරම් අපට හැකියාව ලැබුණෙමු. ඒ අතර තල්ගස්වල නගරය ආශ්‍රිතව රුපියල් ලක්ෂ 100ක වියදමින් (මිලියන 10) මේ වන විට වැඩ ආරම්භ කර ඇති වෙළඳ සංකීර්ණය ඉදිකරවීම, නාගොඩ වලකුඹුර ප්‍රදේශයේ ලක්ෂ 510 ක (මිලියන 51) වියදමින් ඉදිවන ආදාහනාගාරය සේම, කාලයක් තිස්සේ නවීකරණයකට බඳුන් නොවූ, උඩුගම ප්‍රාදේශීය සභා,

ශ්‍රවණාගාරය තිර රෙදි යොදා (පුරනැගුම වැඩසටහනට සමගාමීව) නවීකරණය කරවීම, තල්ගස්වල හා උඩුගම සතිපොළවල් දෙකෙහි වෙළඳ කුටි ඉදිකරවීම හා නවීකරණය කරවීම. එමෙන්ම ප්‍රදේශයේ තරුණ කොටස්, ක්‍රීඩාව විෂයෙහි වඩ වඩාත් නැඹුරු කරවීමේ අරමුණින්, ගරු ක්‍රීඩා අමාත්‍ය නාමල් රාජපක්ෂ මැතිතුමාගේ අමාත්‍යාංශයෙන් රු. ලක්ෂ 50 ක වියදමින් මාපලගම මහජන ක්‍රීඩාංගනය නවීකරණය කරවීම. (මේ වන විට සංවර්ධනය වෙමින් පවතී). එම ක්‍රීඩාංගනය ආශ්‍රිතව ප්‍රදේශයේ ළමා ළපටින්ගේ විනෝදය සහ විවේකය උදෙසා, ළමා උද්‍යානයක් ඇති කිරීම, විශේෂයෙන්ම උනන්විටිය පාසල් ක්‍රීඩා පිටිය තුළ, ක්‍රීඩා අමාත්‍යාංශ ප්‍රතිපාදන මත වොලිබෝල් ක්‍රීඩා ලෝලීන් වෙනුවෙන්, දිවා රාත්‍රී ක්‍රීඩා කළ හැකි වොලිබෝල් පිටියක් ඉදිකිරීම. (මේ වන විට 90%ක් වැඩ අවසන් වී ඇත.) උඩුගම දකුණ ක්‍රීඩා පිටිය ගරු පාර්ලිමේන්තු මන්ත්‍රී ඉසුරු දොඩන්ගොඩ මැතිතුමාගේ ප්‍රතිපාදන රුපියල් තුන්ලක්ෂ පනස් දාහක මුදලින් සහ සභා ප්‍රතිපාදන යොදා ක්‍රීඩාගාරය සහ ප්‍රධාන ක්‍රීඩා පිටිය සංවර්ධනය කිරීම ආදිය කැපී පෙනෙන කටයුතු ලෙස සඳහන් කරමි.

පසුගිය අයවැය ලේඛනවල සඳහන් අප යෝජනා කළ, ග්‍රාමීය මාර්ග බොහොමයි. මධ්‍යම රජයේ මැදිහත්වීම මත කොන්ක්‍රීට් අතුරා, සංවර්ධන කරවීම සහ අප සභාවේ සිටින කම්කරු සේවකයින් යොදවා ශුද්ධ පවිත්‍ර කරවීම්, (කොරෝනා වසංගතයත්, පවතින අයහපත් කාලගුණයත් නිසා බොහෝ මාර්ග ශුද්ධ, පවිත්‍ර කිරීමට නොහැකි වූ බව ද සඳහන් කරමි). මේ වන විට සභා බලප්‍රදේශයේ ග්‍රාමීය මාර්ග 207 ක් කොන්ක්‍රීට් කර, සංවර්ධනය කිරීම ගිවිසුම් ගත කොට, අදාල කොන්ත්‍රාත්, ප්‍රදේශයේ ලියාපදිංචි ස්වේච්ඡා සංවිධාන වලට ලබා දී ඇත. මේ වන විට මාර්ග කිහිපයක් වැඩ ආරම්භ කොට ඇති අතර, මෙම ව්‍යාපෘති සියල්ල නොවැම්බර් 15 දිනට ප්‍රථම වැඩ අවසන්වීමට ගිවිසුම්ගතව තිබුණද, පවතින අයහපත් කාලගුණය සහ වත්මන් කොවිඩ් වසංගතය හමුවේ, ගිවිසුම්ගත දිනට වැඩ නිමකිරීම අපහසු බවට, කොන්ත්‍රාත්කරුවන් විසින් ඉදිරිපත් කළ කරුණු අනුව, ගිවිසුම් කාලය දෙසැම්බර් 31 දක්වා දීර්ඝ කර ඇති බව ද ප්‍රකාශ කරමි.

- ❖ සභා බල ප්‍රදේශයේ අඛණ්ඩව සිදු කෙරෙන ප්‍රධාන මාර්ග හා අතුරු මාර්ගස්ථ වීථි ලාම්පු අලුත්වැඩියාව, නඩත්තුව හා අලුතින් සවි කරවීම.
- ❖ විශේෂයෙන්ම ගෝලීය වසංගතයක් වූ කොවිඩ් 19 මර්දනය කරවීම සඳහා, ඒ ඒ ආයතන හා නිවාස මුල්කරගනිමින්, විසබීජහරණ කටයුතු සිදු කරවීම.
- ❖ රජයේ අනුග්‍රහයෙන් පැවැත්වූ සහ පැවැත්වෙන කොවිඩ් එන්නත්කරන වැඩසටහන් සඳහා සක්‍රිය දායකත්වය ලබාදීම.
- ❖ මාපලගම නගරය ආශ්‍රිතව පිහිටුවා ඇති ආයුර්වේද බෙහෙත් ශාලාව හා එයට යාබදව ඇති පුස්තකාලය නවීකරණය කර වීම.
- ❖ එමෙන්ම නාගොඩ ප්‍රදේශීය සභාව යටතේ පාලනය වන ඇප්තොප්වත්ත සතු අක්කර 05ක පමණ භූමිය නීත්‍යානුකූලව සභාව වෙත පවරා ගැනීමට අවශ්‍ය සියලු කටයුතු සිදු කරවීම හා එහි අක්කර 02 ක භූමි ප්‍රමාණයක් කුරුඳු වගාවට හා පලතුරු වගාවට යොදා ගැනීම
- ❖ ප්‍රදේශයේ කටු මැටි නිවාසවල ජීවත් වූ අඩු ආදායම්ලාභී දිළිඳු පවුල් සඳහා නිවසක උරුමය ලබාදෙමින්, අලුතින් නිවාස ඉදිකරවීම වැනි සංවර්ධන වැඩසටහන් රැසකට දායකත්වය ලබාදී තිබීම, අභියෝග ජය ගැනීමක් ලෙස සඳහන් කළ හැකිය.

රට මුහුණ පා තිබෙන පවතින අයහපත් තත්ත්වය යටතේ මෙපමණකින් හෝ බල ප්‍රදේශයේ, යම් සංවර්ධනයක් ඉටුකරන්නට හැකිවීම, සතුටට කාරණයක් ලෙස පෙන්වා දෙන අතර, ඉදිරියේ දී ක්‍රියාත්මක වන වැඩසටහන් රැසක්ද, අප සතුව පවතින බව සිහිපත් කළ යුතුය.

2022 වර්ෂයේ අයවැය වෙනුවෙන් ප්‍රකාශයක් නිකුත් කරන, මේ අවස්ථාවේදී පෙරකී සංවර්ධන කටයුතු සඳහා මෙන්ම, ඉදිරියේදී ක්‍රියාවට නැංවීමට නියමිත සංවර්ධන වැඩසටහන් සඳහා උපරිම ශක්තිය ලබාදුන්, දකුණු පළාත්ආණ්ඩුකාරවර ගරු ආචාර්ය විලී ගමගේ මැතිතුමා හා අප සභාව අයත් හිනිදුම ආසනය සහ බද්දේගම ආසනයේ වර්තමාන සංවර්ධන නියමුවන් වන, ගාල්ල දිස්ත්‍රික් සංවර්ධන කමිටු සභාපති, නාගොඩ ප්‍රාදේශීය සංවර්ධන කමිටු සභාපති, ගරු පාර්ලිමේන්තු මන්ත්‍රී සම්පත් අතුකෝරල මැතිතුමාට මෙන්ම බද්දේගම ප්‍රාදේශීය සංවර්ධන කමිටු සභාපති ගරු පාර්ලිමේන්තු මන්ත්‍රී ඉසුරු දොඩංගොඩ මැතිතුමා මෙන්ම, අපගේ ඉදිවන ආදාහනාගාරයට, අමාත්‍යාංශ මුදල් ප්‍රතිපාදන වෙන් කර දීමේදී, ඒ වෙනුවෙන් මැදිහත් වී කටයුතු කළ අප දිස්ත්‍රික් නායක, වර්තමාන සම කැබිනට් ප්‍රකාශක, ගරු වැවිලි අමාත්‍ය වෛද්‍ය රමේෂ් පතිරණ මැතිතුමා, අනෙකුත් පාර්ලිමේන්තු මන්ත්‍රීතුමන්ලා මෙන්ම හිටපු පළාත් සභා මන්ත්‍රීවරුන්ට මෙන්ම පළාත් පාලන කොමසාරිස්තුමාට හා එකී ආයතන නිලධාරීන්ටද ප්‍රශංසාත්මක ස්තූතිය පුද කරන අතර, මෙම සියලු කාර්යයන් ඉටු කිරීමට මා හට ශක්තියක් වූ, උප සභාපති ගාමිණී සුසන්ත මැතිතුමා ඇතුළු සියලුම පක්ෂ, විපක්ෂ ගරු මන්ත්‍රීවරුන්ට, ගරු මන්ත්‍රීවරියන්ට, මෙන්ම සභාවේ වැඩබලන ලේකම්තුමිය ඇතුළු සියලුම කාර්ය මණ්ඩලයට හා සේවක මණ්ඩලයට මාගේ ප්‍රශංසාත්මක ස්තූතියක් පිරිනැමිය යුතුය.

**සභාපති,**
**නිමල් වික්ටර් නාගොඩවිතාන,**
**නාගොඩ ප්‍රාදේශීය සභාව**

**ගරු සභාපතිතුමා අදහස් දක්වමින්,**

අපේ මේ අවුරුදු හතරක කාලය තුළ අපි සතුටු වෙනවා මේ තරම් වැඩ කොටසක් සමාජයට ලබා දීමට හැකිවීම පිළිබඳව. ඒ අනුව අපේ පාලන කාලය තව දීර්ඝ කරයි ද යන්න දන්නේ නැහැ නමුත් අපි පත් වුණු මෙම කාලවකවානුව ඉතා දුෂ්කර වකවානුවක් වන අතර, ඉතා අසරණ වූ සභාපති කෙනෙක් ලෙසයි මා දකින්නෙ. වර්තමානයේ ඇති වී තිබෙන covid වසංගත තත්වය මීට හුඟක් බලපෑවා. ඒ වගේම කාලගුණය අයහපත් වීමත් සමග සභාවේ දේවල් කරගන්න අපට නොහැකි වුනා. අපේ අදහස තිබෙන්නේ අපේ බල ප්‍රදේශය තුළ ග්‍රාමසේවක වසම් 53 තුළ සංවර්ධන ක්‍රියාදාමයන් සිදු කරන්න. අපේ මූලිකත්වය මන්ත්‍රීවරුන්ගේ මූලිකත්වය. වෙනදා මන්ත්‍රීවරු 13යි හිටියෙ. දැන් මන්ත්‍රීවරු 27 දෙනකු ඉන්නවා. අපි සියලු දෙනාටම සහයෝගයෙන් කටයුතු කරන්න සිදුවුණා. අපි 27දෙනාම මොන අදහස් දැරුවත්, සියලු දෙනාම ලෙන්ගතුයි. එහෙමනම් මම ඉදිරිපත් කළ අයවැය වාර්තාව ඔබතුමන්ලාට සභා සම්මත කිරීමට අවස්ථාව ලබා දෙනවා. බොහොම ස්තූතියි.

**ගරු සභාපතිතුමා විසින් ඉදිරිපත් කරන ලද ඉහත සඳහන් යෝජනාව ගරු මන්ත්‍රී ලක්රුවන් සම්පත් මහතා විසින් ස්ථිර කරන ලදී.**

**ගරු මන්ත්‍රී රංජිත් ජයවීර මහතා**

ගරු සභාපතිතුමා ඇතුළු සමස්ත සභාවෙන් අවසරයි. මේ අයවැය බැලුවට පස්සේ, අපට ඇත්තටම සතුටු වීමට නම් කරුණක් නැහැ. මොකද මම ගිය සැරේ සභා වාර්තාවට දාපු යෝජනා ඉෂ්ට වුණේ නැහැ.මේ සැරෙත් මම යෝජනා දෙකක් ඉදිරිපත් කළා. ගරු සභාපතිතුමනි, මම හිතන්නේ ඒක ඇතුළත් වෙලා නැහැ. සභාපතිතුමනි, අතිගරු ජනාධිපතිතුමන්ගේ සංකල්පයකට අනුව, අපි සියලු

දෙනාම ගොවි පවුල්වල කොටස් කරුවන්. ලියාපදිංචි සමිතියකට කොම්පොස්ට් සාදා ගැනීමට බහුකාර්ය යන්ත්‍රයක් ලබා ගැනීම තමයි මම ඉල්ලීම් කළේ. දෙන ලෙස ඒ කිසිම දෙයක් මෙහි සඳහන් වෙලා නැහැ. ඒ වගේම තමයි 215B අලුත් පහල බටහිර පවුල් 35 වගේ පානීය ජලය නැතිව අසරණ වෙලා ඉන්නවා. පානීය ජලය ලබා දෙන්න පුළුවන් ජල මූලාශ්‍රයක්, අපි තෝරාගෙන තිබෙනවා. ඒ සම්බන්ධව යෝජනාවත් මෙයට ඇතුළත් කර නැහැ. ඒ නිසා සභාපතිතුමනි මේ සංවර්ධන යෝජනා නොමැති නිසා, මේ අයවැයට ඡන්දයක් ඉල්ලා සිටිනවා. ඒ සඳහා අපට අවස්ථාව ලබා දෙන්න කියලා ගෞරවයෙන් ඉල්ලා සිටිනවා.

**ගරු මන්ත්‍රී වසන්ත කුමාරගේ මහතා**

ගරු සභාපතිතුමා ඇතුළු සියලු දෙනාගේ අවසරයි. ජයවීර මන්ත්‍රීතුමා අයවැයට විරුද්ධව ඡන්දයක් ඉල්ලුවා. ඒ වගේම ඔබතුමාගේ පාලන කාලය, අවුරුදු හතර තුළ, අවුරුදු තුන අවසන් වෙලා හතරවන අවුරුද්ද අවසන් වෙන මේ වෙලාවේ, පසුගිය වර්ෂවල අයවැය වාර්තාවල් තුනක් ඉදිරිපත් කළා. ඒ එකකවත් ජයවීර මන්ත්‍රීතුමා කිව්ව වගේ, අපේ ප්‍රදේශයේ ජනතාවට කිසිම සහනයක් ලබා දෙන්නක් ලෙස නෙමෙයි ක්‍රියාත්මක වුණේ. පළාත් සභාවට අයත් පාරවල් අද පයින්වත් යන්න බැරි තත්වයට පත්වෙලා තියෙන්නේ. ඒ තරමට වල්බිහිවෙලා, අබලන් වෙලා තියෙන්නෙ. මට හිතුන විදියට ජනතාවගේ සිතුම් පැතුම් ඉටු කරන්න ඔබතුමාට හැකියාවක් ලැබුනෙ නැහැ. ඔබතුමා කිව්ව covid එක්ක යම් පසුබෑමකට ලක් වුණා කියලා. හැබැයි එහෙම වුණා කියලා මේවා කරඅරින්න බැහැ. ඔබතුමාලට ලොකු බලයක් දීලා සභාවට පත් කළේ ඒවා ඉටු කරන්න.

**ඒ අනුව ගරු මන්ත්‍රී රංජිත් ජයවීර මහතා විසින් අයවැයට විරුද්ධත්වය ප්‍රකාශ කරමින් යෝජනාවක් ඉදිරිපත් කරනු ලදුව ගරු මන්ත්‍රී වසන්ත කුමාරගේ මහතා එම යෝජනාව ස්ථිර කරන ලදී.**

අනතුරුව ගරු සභාපතිතුමා විසින් මෙම අයවැය යෝජනාව සම්බන්ධයෙන් ඡන්දයකට යාම සිදු කරන ලදී. එහිදී ගරු සභාපතිතුමා විසින් සභිකයන්ට අත් එසවීමෙන් ඡන්ද ප්‍රකාශ කරන ලෙස දැනුම් දෙන ලදී. මෙම යෝජනාවට පක්ෂව ඡන්ද 14 ක් ලැබුණු අතර, විපක්ෂව ඡන්ද 12 ක් ලැබිනි.

**ඒ අනුව වැඩි ඡන්ද දෙකකින් 2022 අයවැය යෝජනාව සභා සම්මත විය.**

**ඒ අනුව ගරු සභාපතිතුමා විසින් ඉදිරිපත් කරන ලද ඉහත සඳහන් යෝජනාව ගරු මන්ත්‍රී ලක්රුවන් සම්පත් මහතා විසින් ස්ථිර කරනු ලදුව ඒකමතිකව සභා සම්මත විය.**

**අයවැයට පක්ෂව ඡන්දය ලබා දුන් මහජන නියෝජිතයින්**

i. ගරු උප සභාපති එම්.කේ. ගාමිණී සුසන්ත මහතා
ii. ගරු මන්ත්‍රී එන්.ජී.ගයාන් මදුසංඛ මහතා
iii. ගරු මන්ත්‍රී පියල් හිරිමුතුගොඩ මහතා
iv. ගරු මන්ත්‍රී ධර්මසිරි ගනේවත්ත මහතා
v. ගරු මන්ත්‍රිනී සුභාෂි මධුමාලි ඒකනායක මෙනවිය
vi. ගරු මන්ත්‍රී ඊ.ඒ. වෙරංග ලක්මාල් මහතා
vii. ගරු මන්ත්‍රී නාපෙ විතානගේ සමන් මහතා

viii. ගරු මන්ත්‍රී චන්ද්‍රසිරි වනිගරත්න මහතා
ix. ගරු මන්ත්‍රී විලේගේ අමර ධනංජය මහතා
x. ගරු මන්ත්‍රිනී ප්‍රියන්තා ගුණසේකර මහත්මිය
xi. ගරු මන්ත්‍රී එච් කේ. ලක්රුවන් සම්පත් මහතා
xii. ගරු මන්ත්‍රී එම්.එම්.දිසානායක මහතා
xiii. ගරු මන්ත්‍රී එන්.ඩබ්. පතිනායක මහතා
xiv. ගරු මන්ත්‍රී විජිත් වීරගුණරත්න සහබන්දු මහතා

**අයවැයට විපක්ෂව ඡන්දය ලබා දුන් මහජන නියෝජිතයින්**

i. ගරු මන්ත්‍රී කුමාරගේ වසන්ත මහතා
ii. ගරු මන්ත්‍රී ඩබ්.ජී.නිශාන්ත මහතා
iii. ගරු මන්ත්‍රී එච්.ජී.තරංග සුදර්ශන මහතා
iv. ගරු මන්ත්‍රී චන්ද්‍ර වීරගුණරත්න.සහබන්දු මහතා
v. ගරු මන්ත්‍රිනී කේ.කේ.අයි.නෙරංජලී මහත්මිය
vi. ගරු මන්ත්‍රිනී කේ.ඒ.සී. දිල්රුක්ෂි මහත්මිය
vii. ගරු මන්ත්‍රිනී එච්.එච්. ගයන්ති කුමාරි මහත්මිය
viii. ගරු මන්ත්‍රී බන්දුල සමන්ත හිරිමුතුගොඩ මහතා
ix. ගරු මන්ත්‍රී ඊ.ඒ.වී. අජිත් කුමාර මහතා
x. ගරු මන්ත්‍රිනී ඩබ්.කේ.නෙලී මහත්මිය
xi. ගරු මන්ත්‍රිනී කේ.එච්.එම්.නදීකා දර්ශනී
xii. ගරු මන්ත්‍රී පී.ජී.රංජිත් ජයවීර

ගරු සභාපතිතුමා විසින් 2022 අයවැය යෝජනාවට පක්ෂව හා විපක්ෂව චන්දය ලබා දුන් මන්ත්‍රී මණ්ඩලයට ස්තුතිය පුද කරන ලදී.

02. තල්ගස්වල නගරයේ කඩකාමර ඉදිකිරීම කර්මාන්තයේ වැඩ කරගෙන යාමේදී අධික වර්ෂාව සහ මේ දිනවල පවත්නා සිමෙන්ති හිඟතාවය හේතුවෙන්, මෙම කර්මාන්තයේ කාල සීමාව දින 60 කින් දීර්ඝ කර දෙන ලෙස යෝජනා කරමි.

**ගරු සභාපතිතුමා විසින් ඉදිරිපත් කරන ලද ඉහත සඳහන් යෝජනාව ගරු මන්ත්‍රී අජිත් එඩේරආරච්චි මහතා විසින් ස්ථිර කරනු ලදුව ඒකමතිකව සභා සම්මත විය.**

03. 2022 වර්ෂය සඳහා ප්‍රසම්පාදන සැළැස්ම සභා අනුමැතියට ඉදිරිපත් කිරීමට යෝජනා කරමි.

**ගරු සභාපතිතුමා විසින් ඉදිරිපත් කරන ලද ඉහත සඳහන් යෝජනාව ගරු මන්ත්‍රී විජිත් සහබන්දු මහතා විසින් ස්ථිර කරනු ලදුව ඒකමතිකව සභා සම්මත විය.**

04. උඩුගම සතිපොළෙහි 2021 වර්ෂයට ටෙන්ඩරය ලබාගත් බදුකරුගේ ඉල්ලීම මත නැවත උඩුගම සති පොළ සභාවට පවරා ගැනීමට අදාල යෝජනාව කරමි.

**ගරු සභාපතිතුමා විසින් ඉදිරිපත් කරන ලද ඉහත සඳහන් යෝජනාව ගරු මන්ත්‍රී පියල් හිරිමුතුගොඩ මහතා විසින් ස්ථිර කරනු ලදුව ඒකමතිකව සභා සම්මත විය.**

05. අප ආයතනය මගින් පාලනය වන රන් කැකුළු පෙර පාසල හා කටඹුරාව ලහිරු පෙර පාසල් වල පෙර පාසල් පාලිකාවන් හට කොවිඩ් තත්ත්වය නිසා පාසල් වාරය වෙනස් වීම වෙනුවෙන් 2021 දෙසැම්බර් මාසය තුලදීද අධ්‍යාපන කටයුතු කරගෙන යන නිසා එම මාසයට හිමි දීමනාව ලබාදෙන ලෙස යෝජනා කරමි.

**ගරු සභාපතිතුමා විසින් ඉදිරිපත් කරන ලද ඉහත සඳහන් යෝජනාව ගරු මන්ත්‍රී අමර ධනංජය විලේගේ මහතා විසින් ස්ථිර කරනු ලදුව ඒකමතිකව සභා සම්මත විය.**

06. අප ආයතනය මගින් පාලනය වන නාගොඩ කැකුළු පෙරපාසල එල්.එල්.ආර් විජේතිලක මහතාට අයත් නාගොඩ පිහිටි රිවර් පෙයාර් ගොඩනැගිල්ලේ අවුරුදු 2 ක් සඳහා එළඹ තිබූ බදුකුලී ගිවිසුම 2021/12/31 දිනෙන් අවසන් වන බැවින් ඉදිරි වර්ෂ සඳහා අදාල කඩකුලී ගිවිසුම අලුත් කිරීමට යෝජනා කරමි.

**ගරු සභාපතිතුමා විසින් ඉදිරිපත් කරන ලද ඉහත සඳහන් යෝජනාව ගරු මන්ත්‍රී එන්.වී.සමන් මහතා විසින් ස්ථිර කරනු ලදුව ඒකමතිකව සභා සම්මත විය.**

**ගරු සභාපතිතුමා අදහස් දක්වමින්,**

පෙර පාසල පවත්වාගෙන යාම සඳහා එල්. එස්. ආර්. විජේතිලක මහතා මාසික කුලී මුදල වැඩි කරන මෙන් අපෙන් ඉල්ලීම් කරලා තියෙනවා.

**චන්ද්‍ර සහබන්දු මහතා අදහස් ප්‍රකාශ කරමින්,**

පවතින ආර්ථික තත්වයත් එක්ක, එල්. එස්. ආර්. විජේතිලක මහතා ගණන වැඩිකරන්න කියනවා නම්, සාකච්ඡා කරලා, ඒ මුදල වැඩි කරන්න. යම් සාධාරණ ගානකට එන්න.

**06. ඉදිරි ගෙවීම් වාර්තාව ඉදිරිපත් කිරීම**

**අංක 01 සිට 42 දක්වා ගෙවීම් සහා අරමුදල් මගින් ගෙවීම සුදුසු බව යෝජනා කරමි.**

**<u>2021.12.14 දින පවත්වනු ලබන මහසභා රැස්වීම සඳහා ඉදිරිපත් කළ යුතු ඉදිරි ගෙවීම් වාර්තාව.</u>**

**01. 2021 ඔක්තෝම්බර් මස දුරකථන බිල්පත්**
**ශ්‍රී ලංකා ටෙලිකොම් පී එල් සී**

| | | | |
|---|---|---|---|
| i. | 0912231201 | - සභාපතිතුමාගේ නිවස | - රු. 5645.13 |
| ii. | 0912296577 | - මාපලගම උප කාර්යාලය | - රු. 422.98 |
| iii. | 0912296537 | - සභාපතිතුමාගේ නිල කාමරය | - රු. 3484.76 |

iv. 0912296433 - ප්‍රධාන කාර්යාලය - රු. 3951.49

**02. සී/ස ලංකාබෙල් සමාගම**

i. 2021.02.16 සිට 2021.03.15 දක්වා උප සභාපතිතුමාගේ නිවසේ දුරකථන බිල්පත පියවීම (0915701722) - රු. 613.01

ii. 2021.05.16 සිට 2021.06.15 දක්වා උප සභාපතිතුමාගේ නිවසේ දුරකථන බිල්පත පියවීම (0915701722) - රු. 613.00

iii. 2021.10.16 සිට 2021.11.15 දක්වා උප සභාපතිතුමාගේ නිවසේ දුරකථන බිල්පත පියවීම (0915701722) - රු. 2023.36

**03.ජාතික ජල සම්පාදන හා ජලාපවාහන මණ්ඩලය**

33/53/003/009/10 - උඩුගම බහුකාර්ය මධ්‍යස්ථානය (2021.10.22 – 2021.11.19) - රු. 1279.86

33/53/003/008/11 - උඩුගම උප කාර්යාලය (2021.10.22 – 2021.11.19) - රු. 966.24

**<u>04.2021 නොවැම්බර් මස පරිවර්තිත ගමන් වියදම් ගෙවීම (ක්ෂේත්‍ර නිලධාරින් සඳහා)</u>**

| | | |
|---|---|---|
| ඩබ්.ජේ.ඒ.ශානක මයා | - ආදායම් පරීක්ෂක | -රු . 4000.00 |
| මානෙල් සුදර්ශනී මිය | - සංවර්ධන නිලධාරී | - රු. 6200.00 |
| කේ.ඒ.එදිරිසිංහ මයා | - තාක්ෂණ සේවා නිලධාරී | -රු . 5500.00 |
| නදුන් ප්‍රමෝද් මයා | - තාක්ෂණ සේවා නිලධාරී | -රු . 5500.00 |
| අනුෂා සමරවික්‍රම මෙය | - තාක්ෂණ සේවා නිලධාරී | -රු . 3000.00 |

**<u>05.2021 දෙසැම්බර් මස ගමන් වියදම්</u>**

| | | |
|---|---|---|
| කේ.ඩී.එස්.නිපුනිකා මිය | - සංවර්ධන නිලධාරී | - රු. 490.00 |
| කේ.කේ. අවන්ත පද්ම මයා | - කාර්යාල කාර්ය සහායක | - රු. 900.00 |

**<u>2021 නොවැම්බර් මස ගමන් වියදම්</u>**

**<u>ආයතනයේ රාජකාරි ගමන්වල නියලීම වෙනුවෙන්</u>**

| | | |
|---|---|---|
| නිමල් වික්ටර් නාගොඩවිතාන මයා | - සභාපති | - රු. 4000.00 |
| එම්. ඒ වසන්ත මයා | - රියදුරු | - රු. 5600.00 |
| කේ.ඩී.එස්.නිපුනිකා මිය | - සංවර්ධන නිලධාරී | - රු. 974.00 |

**පුහුණු සඳහා සහභාගී වීම වෙනුවෙන්**

එල්.එම්.චතුර ජයාත්ම මයා - කළමනාකරණ සේවා නිලධාරී - රු. 3310.00

(නාගොඩ ප්‍රාදේශීය සභාවට පැමිණ ගිණුම් සකස් කිරීම පිළිබඳ පුහුණු වැඩමුළුවක් කිරීම වෙනුවෙන්)

| | | |
|---|---|---|
| එන්.වී.නිසංසලා දිල්රුක්ෂි මෙය | - සංවර්ධන නිලධාරී | - රු. 800.00 |
| කේ.ජී.අනුෂා කුමාරි මෙය | - සංවර්ධන නිලධාරී | - රු. 860.00 |

**<u>2021 ඔක්තෝබර් මස ගමන් වියදම්</u>**

| | | |
|---|---|---|
| අනුර දිසානායක මයා | - රියදුරු | - රු. 2400.00 |
| ඩී.සමන් ප්‍රදීප් මයා | - සෞඛ්‍ය කම්කරු | - රු. 1400.00 |
| රංජිත් උදය කුමාර මයා | - වැඩ ක්ෂේත්‍ර තම්කරු | - රු. 570.00 |

**<u>06. අතිකාල දීමනා ගෙවීම්</u>**

**<u>2021 නොවැම්බර් මස</u>**

| | | |
|---|---|---|
| කේ.කේ. අවන්ත පද්ම මයා | - කාර්යාල කාර්ය සහායක | - රු. 1093.69 |
| එම්.ඒ.වසන්ත මයා | - රියදුරු | - රු. 9136.00 |
| ඩී.ටී.ආර්.ඒ. ගුණරත්න මයා | - මුරකරු | - රු. 5350.00 |
| ඩබ්.කේ. සම්පත් සංජීව මයා | - අනියම් රියදුරු | - රු. 8185.00 |
| යසරත්න විජේසේකර මයා | - මුරකරු | - රු. 8198.00 |
| කේ. එච්. එම්. කැළුම් චාමර මයා | - අනියම් රියදුරු | - රු. 4387.00 |
| එන්.එම්.රජිත් මයා | - අනියම් මුරකරු | - රු. 6161.00 |
| එස්.ඩී.එම්.කැටිපෙආරච්චි මයා | - විදුලි කාර්මික | - රු. 2100.00 |
| කේ.එම්.එම්.නිශාන්ත ඉඳුනිල් මයා | - රියදුරු | - රු. 8560.00 |
| එම්.ඩබ්.හර්ෂ කුමාර මයා | - සෞඛ්‍ය කම්කරු | - රු. 4494.00 |
| ඒ.එච්.ජී. සංජීව මයා | - වැඩ/ක්ෂේත්‍ර කම්කරු (මුර සේවයේ යෙදීම වෙනුවෙන්) | - රු. 3007.81 |
| කේ.ජී. හර්ෂ චාමර සම්පත් මයා | - සෞඛ්‍ය කම්කරු | - රු. 1515.00 |
| ඩබ්.ජී. දයානන්ද මයා | - සෞඛ්‍ය කම්කරු | - රු. 3992.18 |

**<u>2021 ඔක්තෝම්බර් මස</u>**

| | | |
|---|---|---|
| යූ.ජී.රංජිත් උදය කුමාර මය | - වැඩ/ක්ෂේත්‍ර කම්කරු | - රු. 3317.00 |
| අනුර දිසානායක | - රියදුරු | - රු. 5595.80 |

**07. සභාපති, නාගොඩ ප්‍රාදේශීය සභාව**

i. 2021 නොවැම්බර් මස මන්ත්‍රීවරුන් සඳහා ඉන්ධන ලබා ගැනීමේ බිල්පත - රු.81000.00

ii. සභාපතිතුමාගේ රාජකාරි අවශ්‍යතාවයන් සඳහා PF 7360 කැබ් රථය අධිවේගී මාර්ගයේ ගමන් කිරීම වෙනුවෙන් බිල්පත් මුදල් ගෙවීම් - රු. 1450.00

iii. 2021.11.15 දින නාගොඩ ප්‍රාදේශීය සභා ප්‍රධාන කාර්යාලයේදී පවත්වන ලද තාක්ෂණික ඇගයීම් කමිටුවේ සාමාජිකයින් වෙත දීමනා ගෙවීම (නිලධාරීන් 05)- රු. 2500.00

**08. එම්.ඒ.ඩිලානි චනද්‍රප්‍රභා මිය,**

රාජ්‍ය සේවා කොමිෂන් සභා ලේකම්ගේ අංක sp/psc/07/01/08(76) හා 2021.05.17 දිනැති ලිපිය අනුව ලේකම් තනතුරෙහි වැඩ බැලීම වෙනුවෙන් දීමනා ගෙවීම - 2021 නොවැම්බර් - රු. 10395.00

**09. ලංකා පිලිං ස්ටේෂන්, ගා/නාගොඩ**

**<u>2021 නොවැම්බර් මස ඉන්ධන ලබා ගැනීමේ බිලපත්</u>**

| | |
|---|---|
| PF 7360 කැබ්රථය ඩීසල් ලීටර් 599 ක් | - රු. 66489.00 |
| LL 7650 කෘ කැබ් රථය ඩීසල් ලීටර් 125 ක් | - රු. 13875.00 |
| LL 7366 ජල බවුසරය ඩීසල් ලීටර් 50 ක් | - රු. 5550.00 |

RA 8570 ට්‍රැක්ටරය ඩීසල් ලීටර් 200 ක් - රු. 22200.00
ගබඩා කර තබා ගැනීම සඳහා පෙට්‍රල් ලීටර් 25 - රු. 3925.00
2T Oil ලීටර් 1 - රු. 700.00
මාසික සභා වාර්තා බෙදා දීම සඳහා පෙට්‍රල් ලීටර් 5 - රු. 785.00
**එකතුව - රු.113524.00**

**10. ලංකා පිලිං ස්ටේෂන්, ගා/නාගොඩ**
**2021 ඔක්තෝම්බර් මස ඉන්ධන ලබා ගැනීමේ බිලපත්**
PF 7360 කැබ්රථය ඩීසල් ලීටර් 519 ක් - රු. 57609.00
LL 7650 කෘ කැබ් රථය ඩීසල් ලීටර් 260 ක් - රු. 28860.00
LL 7366 ජල බවුසරය ඩීසල් ලීටර් 110 ක් - රු. 12210.00
LL 7366 ජල බවුසරය පවර් ඔයිල් ලීටර් 1 ක් - රු. 2015.00
RA 8569 ට්‍රැක්ටරය ඩීසල් ලීටර් 40 ක් - රු. 4440.00
RA 8570 ට්‍රැක්ටරය ඩීසල් ලීටර් 95 ක් - රු. 10545.00
LL 7103 ටිපර් රථය සඳහා ඩීසල් ලීටර් 380 ක් - රු. 42180.00
ගබඩා කර තබා ගැනීම සඳහා පෙට්‍රල් ලීටර් 40 - රු. 6280.00
2T Oil ලීටර් 1 - රු. 700.00
**එකතුව - රු.164839.00**

**11. නීතිඥ හේමන්ත පී.ඩබ්ලිව් විතාරණ මයා, ලේන්බාන් වීදිය, කොටුව**
P 14658 දරණ නඩුවට අදාළව 2021.11.15 දින නීතිඥ පෙනී සිටීමේ ගාස්තු - රු. 3000.00
L 13814 නඩුවට අදාළව 2021.11.30 දින නීතිඥ පෙනී සිටීමේ ගාස්තු - රු. 3000.00
L 36 නඩුවට අදාළව 2021.11.29 දින නීතිඥ පෙනී සිටීමේ ගාස්තු - රු. 5000.00

**12. එච්.එල්.කේ.ශ්‍රීනිත් රුක්ෂාන් මයා, උඩුගම**
උඩුගම මහජන පුස්තකාලය සඳහා පුවත්පත් ලබාගැනීම වෙනුවෙන් ගෙවීම
2021 නොවැම්බර් - රු. 6040.00

**13. ඒ.ඩී. කරුණාරත්න මයා, සරත් ස්ටෝර්ස්, යටලමත්ත**
නාගොඩ මහජන පුස්තකාලය සඳහා පුවත්පත් ලබාගැනීම වෙනුවෙන් ගෙවීම
2021 නොවැම්බර් - රු. 6730.00

**14.බී.ජේ. කරුණාරත්න මයා, රත්නගිරි ස්ටෝර්ස්, මාපලගම**
මාපලගම මහජන පුස්තකාලය සඳහා පුවත්පත් ලබාගැනීම වෙනුවෙන් ගෙවීම
2021 අප්‍රේල් - රු. 4290.00
2021 මැයි - රු. 3360.00
2021 ජූලි - රු. 3580.00
2021 අගෝස්තු - රු. 2560.00

**15. උපාලි නිව්ස්පේපර්ස් ප්‍රයිවට් ලිමිටඩ්, කොළඹ**
නාගොඩ ප්‍රාදේශීය සභාවට අයත් සතිපොළවල් ප්‍රසම්පාදනය කිරීමට අදාළව දැන්වීම් පළකිරීම හා සැපයුම්කරුවන් ලියාපදිංචි කිරීමට අදාළ දැන්වීම් 2021/11/15 පුවත්පතේ පළකිරීමට අදාළ ගාස්තු ගෙවීම - රු. 39690.00

**16. A.J.G. ස්ටේෂනරි, කලුවැල්ල, ගාල්ල**

ප්‍රධාන කාර්යාලයේ ගබඩාව සඳහා ලිපිකවර හා පරිගණක කඩදාසි
ලබා ගැනීමේ බිල්පත - රු. 2475.00

**17. ජයන්ත ඉලේපෙරුම ආරච්චි, ජේ.පී.කමියුනිකේෂන් , නගොඩ**

2022 අයවැය ලේඛනය සකස් කිරීම සඳහා අවශ්‍ය වර්ණ මුද්‍රණ කටයුතු සිදුකිරීම හා
මුල් කවර හා පිටුපස කවර ලබා දීමට අදාළ බිල්පත් ගෙවීම - රු. 13050.00

**18. ඒ.එස්, මජීදා මිය, නාවින්න , උළුවිටිකේ**

2022 වර්ෂයට අදාළ ආදායම් ගැසට් නිවේදනය දෙමළ භාෂාවට පරිවර්තනය කොට
ගැසට් පත්‍රයේ මුද්‍රණය සඳහා යැවීම - රු. 10250.00

**19. එල්.එස්.ආර්. විජේතිලක මයා,ගා/නාගොඩ**

නාගොඩ ප්‍රාදේශීය සභා කැකුළු පෙර පාසල පවත්වා ගෙන යනු ලබන ගොඩනැගිල්ල
බදු පදනම මත පවත්වා ගෙන යන බැවින් ඒ සඳහා දෙසැම්බර් මස මාසික
කුලීය ගෙවීම - රු. 5000.00

**20. විගණකාධිපති, විගණන කාර්යාලය**

i. හිඟ විගණන ගාස්තු ගෙවීම - රු.10000.00

**21. යශෝධරා රශිනි නාගොඩවිතාන මෙය**

සභාපතිතුමාගේ මහජන සම්බන්ධතා නිලධාරී සඳහා දීමනා ගෙවීම
(2021 නොවැම්බර්) - රු.14500.00

**22. ඒ.කේ.නිලන්ති සජීවනී,ග්‍රාෆ් ටෙල් කමියුනිකේෂන්**

i. 2021 නොවැම්බර් මස පැවති සභාවාරය සඳහා මහජන නියෝජිතයන් වෙනුවෙන් දුරකථන කාඩ්පත් ලබා දීමේ බිල්පත් පියවීම - රු.28500.00
ii. 2021 නොවැම්බර් මස සභා වාර්තාව පිටපත් 30 ක් මුද්‍රණය කිරීම වෙනුවෙන් ගෙවීම් - රු. 1890.00
iii. 2022 වර්ෂයේ අයවැය ලේඛනයේ පිටපත් 45 ක් මුද්‍රණය කිරීම වෙනුවෙන් මුදල් ගෙවීම - රු. 10890.00

**23. විජේතුංග ගෲප් කම්පැනි ප්‍රයිවට් ලිමිටඩ්, ගාල්ල**

SPLL 7366 ට්‍රක් බවුසරය හා LL 7650 කෲකැබ් රථයේ ටයර් ඩැග් කිරීමේ බිල්පත - රු. 74838.00

**24.නිව් විජය මෝටර්ස්, ඕරොප්පුවත්ත, ගාල්ල**

PF 7360 කැබ් රථයේ එලයිමන්ට් සාදා ගැනීම සඳහා දරණ බිල්පත පියවීම - රු. 1000.00

**25.ඩී.ජී.කැළුම් පුෂ්පකුමාර මයා, උඩුගම**

i. LL 7103 ටිපර් රථය සඳහා දුනු පින් එකක් අලුතින් සවි කිරීම හා තට්ටුවේ දිරා ගිය කොටස් තාවකාලික තහඩු යොදා සවි කිරීමේ බිල්පත පියවීම - රු. 4800.00

**26. ටී.ඒ.සමන් කුමාර මයා, එදිරිසිංහ මෝටර්ස්, උඩුගම**

LL 7650 කෘ කැබ් රථයේ ඉදිරිපස සහ පිටුපස රෝද සඳහා බ්‍රේක් වොෂර්, බ්‍රේක් ඔයිල් සහ හබ් ග්‍රීස් , රබර් ග්‍රීස් දමා අළුත්වැඩියා කිරීමේ බිල්පත - රු. 12400.00

**27. කේ.ටී.ආර්.ජී. උමාල් කිරිඇල්ල මයා, ග්‍රෑන්ඩ් මෝටර්ස්, වදුරඹ**
PF 7360 කැබ් රථයේ බ්‍රේක් ලයිනර් සෙට් අලුතින් දැමීමේ බිල්පත - රු. 18400.00

**28. අබේනායක ඔටෝ සර්විස්, කලේගාන, ගාල්ල**
PF 7360 කැබ් රථය සේවා කිරීමේ බිල්පත - රු. 31610.00

**29. ආසිරි ටයර් ට්‍රේඩර්ස් ඇන්ඩ් ඔටෝ සර්විස්, මාපලගම**
LL 7650 දරණ කෘ කැබ් රථයේ දකුණු පස ඇතුල් රෝදය හා වම්පස රෝදයේ පැච් දෙකක් දැමීම සහ ටේප් එකක් යෙදීමේ බිල්පත පියවීම - රු. 1250.00

**30.කේ.එම්.ටී ඩිස්ට්‍රිබියුටර්ස්, යක්කලමුල්ල**
වීථි පහන් නඩත්තු කටයුතු සඳහා විදුලි උපාංග මිළදී ගැනීම වෙනුවෙන් ගෙවීම - රු.239400.00

**31. සඳරු ග්‍රොසරි ඇන්ඩ් ග්‍රයින්ඩින් මිල්ස්, නාගොඩ**

i. ප්‍රාදේශීය සභාවේ 2021.11.09 වන දින පැවැත්වූ මාසික මහා සභා රැස්වීමේ සංග්‍රහ බිල්පත - රු. 4745.00

**32. එම්.ටී.ජනිත් ඉරේෂ් කුමාර මයා, වදුරඹ**

i. ප්‍රාදේශීය සභාවේ 2021.11.09 වන දින පැවැත්වූ මාසික මහා සභා රැස්වීමේ සංග්‍රහ බිල්පත (කෑම සඳහා) - රු. 7440.00

**33. පී.පී. ඩිලාන් ප්‍රදීප් චින්තන මයා, කන්නැලිය**
2021 දෙසැම්බර් මස අයවැය විශේෂ සභා වාරය සඳහා දිවා ආහාර ලබා ගැනීමේ බිල්පත - රු.41650.00

**34. නානායක්කාර හාඩ්වෙයාර්, නාගොඩ**
ප්‍රධාන කාර්යාලය සහ උප කාර්යාලය සඳහා කොසු 06 ක් සහ ඉදල් 12 ක් ලබා ගැනීමේ බිල්පත පියවීම - රු. 3360.00

**35. දයානි ට්‍රේඩ් සෙන්ටර්, මාපලගම**

i. මාපලගම වෙලද සංකීර්ණයේ වැසිකිලි පිරිසිදු කිරීම සඳහා අවශ්‍ය උපාංග මිළදී ගැනීමේ බිල්පත - රු. 1020.00
ii. තල්ගස්වල සතිපොළ භූමියේ වැසිකිලි පිරිසිදු කිරීම සඳහා අවශ්‍ය උපාංග මිළදී ගැනීමේ බිල්පත - රු. 625.00

**36. ලියනගේ ට්‍රේඩ් සෙන්ටර්, නාගොඩ**
සෞඛ්‍ය කම්කරුවන් සඳහා ඩෙටෝල් සබන් කැට 76 ක් ලබා ගැනීමේ බිල්පත - රු. 4560.00

**37. එන්.එස්.ඩබ්.සිරිමාන්න මයා, විජයසිරි ට්‍රේඩ් සෙන්ටර්, යටලමත්ත**

කොවිඩ් රෝගය වැළඳීම වෙනුවෙන් යූ.ජී.රංජිත් මයාට සහන බඩු මල්ල ලබා දීම - රු. 5000.00

**පොදු අරමුදල්**

**38. පී.වානක රංග, වානක එන්ටර්ප්‍රයිසස්, කහඳූව**

යෝජිත වලකුඹුර ආදාහනාගාරයේ පිවිසුම් මාර්ගය හා භූමිය සකස් කිරීමට ජේ.සී.බී. යන්ත්‍රය යෙදවීම වෙනුවෙන් මුදල් ගෙවීම (අදියර 2) - රු. 99250.00

**39. ඩී.පී. සුගත් වීරසේකර මයා, බීඩී 5, තලාව පාර, වදුරඹ**

යෝජිත ආදාහනාගාර පිවිසුම් මාර්ගය සකස් කිරීමේදී බාධාවක් වූ කළු ගලෙහි මූලික කොටස ඉවත් කිරීම වෙනුවෙන් ගෙවීම - රු. 70200.00

**40. ඒ.කේ.ජී. ගයාන් මයා යටලමත්ත**

පියසෙන් ගම්මානයේ අතුරු මාර්ගය ජේ.සී.බී. යන්ත්‍රය යොදා සංවර්ධනය කිරීම වෙනුවෙන් මුදල් ගෙවීම - රු. 75000.00

**රජයේ ආධාර**

**41. පී.වානක රංග මයා, වානක එන්ටර්ප්‍රයිසස්, කහඳූව**

උඩුගම දකුණ ක්‍රීඩාංගණය JCB යන්ත්‍රයක් යොදා සංවර්ධනය කිරීමේ බිල්පත සඳහා මුදල් ගෙවීම - රු. 38500.00

**2021 පළාත් නිශ්චිත**

**42.කැප්පිටියාගොඩ දකුණ ග්‍රාම සංවර්ධන සමිතිය, කැප්පිටියාගොඩ**

තල්ගස්වල දෙමළ කණිෂ්ඨ විද්‍යාලයට ප්‍රවේශ වන මාර්ගය සංවර්ධනය කිරීමේ කර්මාන්තයට අදාළ මුදල් ගෙවීම - රු.855419.79

**ඒ අනුව ඉදිරි ගෙවීම් වාර්තාවේ සඳහන් ඉදිරි ගෙවීම් සහා අරමුදල් මගින් ගෙවීම සුදුසු බව ගරු සභාපතිතුමන් කල යෝජනාව ගරු මන්ත්‍රී ලක්රුවන් සම්පත් මහතා විසින් ස්ථිර කරන ලදුව ඒකමතිකව සභා සම්මත විය.**

**(ඉ).2 කර්මාන්ත යෝජනා**

**(ඉ) 2. ගරු සභාපතිතුමන් හා ගරු මන්ත්‍රීවරුන් විසින් ඉදිරිපත් කරන යෝජනා.**

**ගරු උප සභාපති එම්.කේ. ගාමිණී සුසන්ත මහතා ඉදිරිපත් කරන යෝජනා.**

01. අකුලහේන සුසිරි මහතාගේ නිවස දෙසට යන මාර්ගය j.c.b. යන්ත්‍රයක් යොදා සංවර්ධනය කිරිම හා සිලිංඩර් යෙදීමට යෝජනා කරමි.

**ගරු උප සභාපතිතුමා විසින් ඉදිරිපත් කරන ලද ඉහත සඳහන් යෝජනාව ගරු මන්ත්‍රී සමන් නාපෙ විතානගේ මහතා විසින් ස්ථිර කරනු ලදුව ඒකමතිකව සභා සම්මත විය.**

02. අකුලහේන ඩබ්.පී.ජී. උපුල් මහතාගේ නිවස දෙසට යන මාර්ගය j.c.b. යන්ත්‍රයක් යොදා සංවර්ධනය කිරිම.

**ගරු උප සභාපතිතුමා විසින් ඉදිරිපත් කරන ලද ඉහත සඳහන් යෝජනාව ගරු මන්ත්‍රී සමන් නාපෙ විතානගේ මහතා විසින් ස්ථිර කරනු ලදුව ඒකමතිකව සභා සම්මත විය.**

03. අකුලහේන බී.කේ අනුර මහතාගේ නිවස දෙසට යන මාර්ගයට සිළිංඩර් යෙදීම.

**ගරු උප සභාපතිතුමා විසින් ඉදිරිපත් කරන ලද ඉහත සඳහන් යෝජනාව ගරු මන්ත්‍රී සමන් නාපෙ විතානගේ මහතා විසින් ස්ථිර කරනු ලදුව ඒකමතිකව සභා සම්මත විය.**

04. අකුලහේන ධර්මදූත මධ්‍යස්ථානය විලමාවත මාර්ගය j.c.b. යන්ත්‍රයක් යොදා සංවර්ධනය කිරිම.

**ගරු උප සභාපතිතුමා විසින් ඉදිරිපත් කරන ලද ඉහත සඳහන් යෝජනාව ගරු මන්ත්‍රී සමන් නාපෙ විතානගේ මහතා විසින් ස්ථිර කරනු ලදුව ඒකමතිකව සභා සම්මත විය.**

05. තල්පෙගෙදරවත්ත අතුරු මාර්ගය සඳහා සිළිංඩර් යෙදීම.

**ගරු උප සභාපතිතුමා විසින් ඉදිරිපත් කරන ලද ඉහත සඳහන් යෝජනාව ගරු මන්ත්‍රී සමන් නාපෙ විතානගේ මහතා විසින් ස්ථිර කරනු ලදුව ඒකමතිකව සභා සම්මත විය.**

06. විලමාවත 4 පටුමග සඳහා සිළිංඩර් යෙදීම.

**ගරු උප සභාපතිතුමා විසින් ඉදිරිපත් කරන ලද ඉහත සඳහන් යෝජනාව ගරු මන්ත්‍රී සමන් නාපෙ විතානගේ මහතා විසින් ස්ථිර කරනු ලදුව ඒකමතිකව සභා සම්මත විය.**

07. යටලමත්ත වොලිබෝල් ක්‍රීඩාංගනයෙන් කපන පස් උඩලමත්ත ක්‍රීඩාංගනයට දැමීම.

**ගරු උප සභාපතිතුමා විසින් ඉදිරිපත් කරන ලද ඉහත සඳහන් යෝජනාව ගරු මන්ත්‍රී සමන් නාපෙ විතානගේ මහතා විසින් ස්ථිර කරනු ලදුව ඒකමතිකව සභා සම්මත විය.**

08. උඩලමත්ත අකුලහේන මාර්ගය කැඩී ඇති ස්ථානයේ කැඩී ඇති ස්ථානවලට ප්‍රිමික්ස් යෙදීම.

**ගරු උප සභාපතිතුමා විසින් ඉදිරිපත් කරන ලද ඉහත සඳහන් යෝජනාව ගරු මන්ත්‍රී සමන් නාපෙ විතානගේ මහතා විසින් ස්ථිර කරනු ලදුව ඒකමතිකව සභා සම්මත විය.**

**ගරු මන්ත්‍රී රංජිත් ජයවීර මහතා ඉදිරිපත් කරන යෝජනා**

01. 215 බී අලුත් පහළ බටහිර ග්‍රාම නිලධාරී වසමේ ගෙවල් 30 කට පානීය ජලය නොමැති බවත්, ජලපෝෂිත ස්ථානයක් සොයා ගත් බවත්, එබැවින්, එම ස්ථානයේ පානීය ජල නල ස්ථාපිත කර දීම.

**ගරු මන්ත්‍රී රංජිත් ජයවීර මහතා විසින් ඉදිරිපත් කරන ලද ඉහත සඳහන් යෝජනාව ගරු මන්ත්‍රීනී කේ.එච්.එම්.නදීකා දර්ශනී මහත්මිය විසින් ස්ථිර කරනු ලදුව ඒකමතිකව සභා සම්මත විය.**

02. ගරු ජනාධිපතිතුමාගේ සංකල්පයකට අනුව කාබනික පොහොර නිශ්පාදන (බහු කාර්ය යන්ත්‍රයක්) ලබා දී ගොවිතැන හා ගෙවතු වගාවන්ට දිරි ගැන්වීම සඳහා අප ලියාපදිංචි තරුණ සංවිධානයට ලබා දීම

**ගරු මන්ත්‍රී රංජිත් ජයවීර මහතා විසින් ඉදිරිපත් කරන ලද ඉහත සඳහන් යෝජනාව ගරු මන්ත්‍රීනී කේ.එච්.එම්.නදීකා දර්ශනී මහත්මිය විසින් ස්ථිර කරනු ලදුව ඒකමතිකව සභා සම්මත විය.**

**ගරු මන්ත්‍රීනී සුභාෂි ඒකනායක මෙනවිය ඉදිරිපත් කරන යෝජනා**

01. ගම්මැද්දේගොඩ කොකටියවෙල අතුරු මාර්ගය j.c.b. යන්ත්‍රයක් යොදා සංවර්ධනය කිරිම

**ගරු මන්ත්‍රීනී සුභාෂි ඒකනායක මෙනවිය විසින් ඉදිරිපත් කරන ලද ඉහත සඳහන් යෝජනාව ගරු මන්ත්‍රී වෙරංග ලක්මාල් මහතා විසින් ස්ථිර කරනු ලදුව ඒකමතිකව සභා සම්මත විය.**

02. පවතින වැසි තත්වය හමුවේ ජලය බැස යාම අවහිර වී ඇති පහත සඳහන් මාර්ගයන් සඳහා හියුම් පයිප්ප ලබා දීම

- බන්දුල විජේසේකර මාවත (ගම්මැද්දේගොඩ දකුණ)
- ගෝණලගොඩ අලවත්තහේන මාර්ගය
- ගෝණලගොඩ ගොම්මුල්ල මාර්ග

**ගරු මන්ත්‍රීනී සුභාෂි ඒකනායක මෙනවිය විසින් ඉදිරිපත් කරන ලද ඉහත සඳහන් යෝජනාව ගරු මන්ත්‍රී වෙරංග ලක්මාල් මහතා විසින් ස්ථිර කරනු ලදුව ඒකමතිකව සභා සම්මත විය.**

**ගරු මන්ත්‍රී ලක්රුවන් සම්පත් මහතා ඉදිරිපත් කරන යෝජනා**

01. කැප්පිටියාගොඩ උඩවැලිවිටිය ගිංගහ හරහා යොදා ඇති කොන්ක්‍රීට් පාලම අබලන් වී කඩා වැටීමට ආසන්න බැවින්, ජීවිත හානි සිදුවීමට පෙර ඒ සඳහා සුදුසු ක්‍රියාමාර්ගයක් ගැනීම

**ගරු මන්ත්‍රී ලක්රුවන් සම්පත් මහතා විසින් ඉදිරිපත් කරන ලද ඉහත සඳහන් යෝජනාව ගරු මන්ත්‍රී විජිත් සහබන්දු මහතා විසින් ස්ථිර කරනු ලදුව ඒකමතිකව සභා සම්මත විය.**

02. උඩවැලිවිටිය ප්‍රජා ශාලාවට විදුලිය ලබා ගැනීම

**ගරු මන්ත්‍රී ලක්රුවන් සම්පත් මහතා විසින් ඉදිරිපත් කරන ලද ඉහත සඳහන් යෝජනාව ගරු මන්ත්‍රී විජිත් සහබන්දු මහතා විසින් ස්ථිර කරනු ලදුව ඒකමතිකව සභා සම්මත විය.**

03. පවතින වැසි තත්වය හමුවේ සෝදා පාලුවට පත් වී ඇති පහත සඳහන් මාර්ග සඳහා හියුම් පයිප්ප දැමීම

- දවටගහදෙනිය පාර
- මිල්ලගහ උඩුමුල්ල පාර
- ගල්ලෙනමුල්ල කොණ්ඩුගොඩ මාර්ගය

- ගල්ලෙනමුල්ල දරඅකුල්කන්ද මාර්ගය
- ගම්මැද්දේගොඩ උඩවැලිවිටිය මාර්ගයේ රසිකා මහත්මියගේ නිවස අසළ
- මුත්තවිල මාර්ගය
- කුරුඳු කොළනිය රතු මිල්ලවල මාර්ගය

**ගරු මන්ත්‍රී ලක්රුවන් සම්පත් මහතා විසින් ඉදිරිපත් කරන ලද ඉහත සඳහන් යෝජනාව ගරු මන්ත්‍රී විජිත් සහබන්දු මහතා විසින් ස්ථිර කරනු ලදුව ඒකමතිකව සභා සම්මත විය.**

04.ගම්මැද්දේගොඩ උඩවැලිවිටිය යා කරන මාර්ගය කිලෝමීටර් 100000 යේ කාපට් ව්‍යාපෘතියට යෝජනා වී ඇති අතර, ඒ සඳහා ඇස්තමේන්තු සකස් කර ඇත. එය කඩිනම් කිරීමට අදාළ ආයතන දැනුවත් කිරීම.

**ගරු මන්ත්‍රී ලක්රුවන් සම්පත් මහතා විසින් ඉදිරිපත් කරන ලද ඉහත සඳහන් යෝජනාව ගරු මන්ත්‍රී විජිත් සහබන්දු මහතා විසින් ස්ථිර කරනු ලදුව ඒකමතිකව සභා සම්මත විය.**

**ගරු මන්ත්‍රී එම්.එම්.දිසානායක මහතා ඉදිරිපත් කරන යෝජනා**

01. ලෙහුවලකන්ද හෙන්රි දිසානායක මාවතේ, අලුත්වැඩියා කටයුතු සඳහා ලැබී ඇති ප්‍රතිපාදන වෙනස් කොට අවහිර මාර්ගයට ඉහළින් මාර්ගය කැපීම සඳහා දකුණු පලාත් මාර්ග සංවර්ධන අධිකාරියෙන් අවසර ගැනීම

**ගරු මන්ත්‍රී එම්.එම්.දිසානායක මහතා විසින් ඉදිරිපත් කරන ලද ඉහත සඳහන් යෝජනාව ගරු මන්ත්‍රිනී ප්‍රියන්තා ගුණසේකර මහත්මිය විසින් ස්ථිර කරනු ලදුව ඒකමතිකව සභා සම්මත විය.**

02. දකුණු පලාත් මාර්ග සංවර්ධන අධිකාරියට අයත්, කටඹුරාව උනන්විටිය මාර්ගයේ ශ්‍රී රේවත මහා විද්‍යාලය අසළ මාර්ගයේ තිබෙන බෝක්කුව ගිලා බැසීමට ලක්ව ඇති බවත්, ඉංජිනේරු අනුමැතිය අනුව එම මාර්ගයට හිමිවී ඇත්තේ පෙට්ටි බෝක්කුවක් නමුත්, ප්‍රදේශවාසීන්ගේ මතය අනුව එම ස්ථානයට පෙට්ටි බෝක්කුව නුසුදුසු බැවින්, එම ස්ථානයට කඩිනමින් පාලමක් ඉදිකිරීමට කටයුතු කිරීම.

**ගරු මන්ත්‍රී එම්.එම්.දිසානායක මහතා විසින් ඉදිරිපත් කරන ලද ඉහත සඳහන් යෝජනාව ගරු මන්ත්‍රිනී ප්‍රියන්තා ගුණසේකර මහත්මිය විසින් ස්ථිර කරනු ලදුව ඒකමතිකව සභා සම්මත විය.**

**ගරු මන්ත්‍රී එන්.ජී. ගයාන් මධුශංඛ මහතා ඉදිරිපත් කරන යෝජනා**

01. 214 ඒ මලාමුර ග්‍රාම නිලධාරී වසමට අයත් සෞඛ්‍ය කාර්යාලය අසළ සිංහගිරිය මාර්ගය j.c.b. යන්ත්‍රයක් යොදා සංවර්ධනය කිරීම

**ගරු මන්ත්‍රී එන්.ජී. ගයාන් මධුශංඛ මහතා විසින් ඉදිරිපත් කරන ලද ඉහත සඳහන් යෝජනාව ගරු මන්ත්‍රී රංජිත් ජයවීර මහතා විසින් ස්ථිර කරනු ලදුව ඒකමතිකව සභා සම්මත විය.**

02. 214 අලුත් ඉහළ කොහුලානවත්ත මාර්ගයේ කානු කපා සංවර්ධනය කිරීම.

**ගරු මන්ත්‍රී එන්.ජී. ගයාන් මධුශංඛ මහතා විසින් ඉදිරිපත් කරන ලද ඉහත සඳහන් යෝජනාව ගරු මන්ත්‍රී රංජිත් ජයවීර මහතා විසින් ස්ථිර කරනු ලදුව ඒකමතිකව සභා සම්මත විය.**

**(ඉ) 2. 1. 11(8) යටතේ ඉදිරිපත් කරන යෝජනා**

**ගරු සභාපතිතුමා විසින් ඉදිරිපත් කරන යෝජනා**

01. අප සභාවේ තල්ගස්වල මහජන බැංකවේ ජංගම ගිණුමෙන් නිකුත් කරන ලද වලංගු කාලය ඉක්මවන ලද චෙක්පත් සම්බන්ධයෙන් ආදායකයන් දැනුවත් කලද, මෙතෙක් ගෙවීම් කිරීම සඳහා ඉදිරිපත් වී නොමැති බැවින් එම චෙක්පත් මුදල් රෙගුලාසි අනුව ආදායමට ගැනීමට යෝජනා කරමි.

**ගරු සභාපතිතුමා විසින් ඉදිරිපත් කරන ලද ඉහත සඳහන් යෝජනාව ගරු මන්ත්‍රී විජිත් සහබන්දු මහතා විසින් ස්ථිර කරනු ලදුව ඒකමතිකව සභා සම්මත විය.**

02. දුරකථන කුළුණු සඳහා අනුමැතිය ලබා දීමේදී සංවර්ධන ගාස්තුවක් අය කිරීම සුදුසුද නැද්ද යන්න තීරණය කර, එසේ අයකිරීම සුදුසු නම්, එම ගාස්තුව තීරණය කිරීමට යෝජනා කරමි.

**ගරු සභාපතිතුමා විසින් ඉදිරිපත් කරන ලද යෝජනාව සභා සම්මත නොවුනි.**

**ගරු උප සභාපතිතුමා අදහස් දක්වමින්,**

මාස දෙකකට කලින් මම මේ සම්බන්ධව අදහස් දැක්වූවා. කුළුණ ඉදිකිරීම සම්බන්ධයෙන් ජනතාවගේ අප්‍රසාදයක් තිබෙන බවත්, ඒ සම්බන්ධව සොයා බලා කටයුතු කරන ලෙසත්ඉල්ලා සිටිනවා. අපේ ගමේ ජනතාව මේ කුළුණු ඉදිවීම නිසා ගොඩක් අපහසුතාවයන්ට ලක්වන බව මා සමඟ ප්‍රකාශ කරල තියෙනවා. එම ස්ථානයේ අකුණු සැර වැදිලා, එක් පුද්ගලයෙක් මරණයට පවා පත්වෙලා තියෙනවා. නිරතුරුව අකුණු ගහන කන්දක් නිසා, තියෙන අකුරු සැර එළියට ඉවත් කරනවා. ඒ නිසා තමන්ගේ විදුලි උපකරණ සියලු දේවල් හානි සිදුවේ යැයි මතයක් ගම් වාසීන් අතර පවතිනවා. කොහොම නමුත් මම දන්නෙ නැහැ. එහි විද්‍යාත්මක මතය. නමුත් එම ආයතනයෙන් කියන්නේ, සියලු අකුණුසැර අරගෙන පොළවට පතිත කරවන බව. අවට නිවාස වල ගුවන්විදුලි උපකරණ විනාශ වුණා. බාර්හංදිය හරියෙ, මේ කුළුණු ඉදිකරන්නේ ඩයලොග් ආයතනයට උවමනාවට නෙමේ. නිවෙස් දෙකකට විතරයි. මිදුලට සිග්නල් එන්නේ. අනෙක් සියලු තැන්වලට සිග්නල් තියෙනවා. ආයතනය සමග සම්බන්ධතාවය මත යම් පුද්ගලයෙක් මේ කුළුණු තමන්ගේ ඉඩමේ ස්ථාපිත කරගෙන ඊට බදු මුදලක් අය කර ගැනීමක් මෙතන වෙන්නේ. අනවශ්‍ය තැනකට කුළුණක් ගේන්නේ. සංඥා මගින් වන හානිය තවම හොයාගෙන යනවා. ඩයලොග් ආයතනයට අවශ්‍ය නම් මේ කුළුණු ඉදිකරන්න, එම ආයතනයෙන් ඉල්ලීමක් කරල නැහැ. එක එක්කෙනා තමයි ඉල්ලීම් කරන්නෙ. මම දන්නවා එක එක ආයතනවලින් කුළුණු ඉදිකිරීමේදි ගමේ සංවර්ධනයට යම් කිසි මුදලක් ප්‍රදානය කරනවා. ගමේ මේ වගේ කුළුණක් ඉදි වෙනවා නම්, ඔබතුමා පුද්ගලයත් එක්ක නෙමේ ඩයලොග් ආයතනය සමග කතා කරගන්න. ගමේ සංවර්ධනයට මුදලක් දායක කරගන්න. හිටපු සභාපතිතුමාලත් එසේ ගමේ පොදු අවශ්‍යතා සඳහා එවැනි උදව් ගන්න ඇති කියලා මම හිතනවා. ගමේ නිකං මනුෂ්‍යයෙකුගේ උවමනාවකට කුළුණක් ගහන්නෙ නැතුව, ගමේ පොදු කටයුතුවලට යම් දායකත්වයක් ගන්න කියලා කියනවා. කෝටි ගණන් හම්බකරගන්න ආයතනවලින් මුදලක් ගන්න පුළුවන් නම් ගන්න කියලා මම ඉල්ලා සිටිනවා.

**ගරු මන්ත්‍රී අමර ධනංජය විලේගේ මහතා අදහස් දක්වමින්**

මම උප සභාපතිතුමාට විරුද්ධව කතා කිරීමක් නෙමෙයි. ඇත්තටම අපි බස් එකේ යද්දි, අම්බලම ගාවින් පටන්ගත්තම, යටලමත්තට යනකන් ෆෝන් එක වැඩ කරන්නෙ නැහැ. ඒකට හේතුව ඇත්තටම සිග්නල් වල ප්‍රශ්නයක් තියෙනවා. විශේෂයෙන් බණ්ඩාරනායක ප්‍රදේශයට මගේ

බයිසිකලය සර්විස් කරන්න යන්නේ.  සර්විස්  එක කරල ඉවර වෙනකම් මම එම ස්ථානයේ රැඳී ඉන්නවා. ඒ වෙලාවෙදි මගේ පෝන් එකේ සිග්නල් නැහැ. ඊට අමතරව ඉගෙන ගන්න ළමයි ඉන්නවා. ඒ වගේම උප සභාපතිතුමා කිවූ දේවල් වලත් යම් සත්‍යතාවයක් තියෙනවා. අකුණුසැර සම්බන්ධව ඒ ප්‍රශ්නය තියෙනවා. නමුත් තාක්ෂණයත් එක්ක අපි ඉදිරියට යා යුතුයි සභාපතිතුමනි. ඒ වගේම මේ දුරකථන කුළුණු හොඳයි. ඒ දේවල් හරහා මේ ගම් වල මිනිස්සුන්ට යම් දෙයක් කරන්න පුළුවන් නම්, දරුවන්ට අන්තර්ජාල පහසුකම් ලබා දීම හොඳයි කියලා තමයි මා දකින්නේ.

**ගරු සභාපතිතුමා අදහස් දක්වමින්**

පසුගිය කාලයේ මේ කුළුණු ඉදිකිරීම සම්බන්ධයෙන් ජනතාවගේ විරෝධය ආවා. ඒ වගේම ආදාහනාගාරය හදනකොටත්ආවා.  මේ හැම විරෝධතාවයක්  අපි ප්‍රායෝගිකව අත් නොවින්ද නිසා එන්නේ.

**ගරු මන්ත්‍රී චන්ද්‍ර සහබන්දු මහතා අදහස් දක්වමින්**

අපගේ බල ප්රදේශය තුළ යම් ව්‍යාපාරිකයෙක්ගෙ ඉදිකිරීම් සම්බන්ධයෙන් යම්කිසි බදු මුදලක් අය කර ගැනීමේ හැකියාව අපට තියෙනවා.  දරුවන් සම්බන්ධයෙන් ඔන්ලයින්පංති තමයි මේ දිනවල පවතින්නෙ.  සභාව පොඩ්ඩක් හොයලා **බලන්න**, එයාලා කුළුණු ඉදිකරනවනම්, අනිවාර්යෙන් එයාලා කෝටි ගානක් හම්බ කරනවා. පලාතෙම සල්ලි ඇදලා ගන්නවා. එම කුළුණ පවත්වාගෙන යන්න  බදු අයකරනවා. ඩයලොග් කුළුණ එල්ලනවා. ඊට පසු මොබිටෙල්, එටිසලාට්, ලංකාබෙල්  ඒ කුළුණෙම එල්ලනවා. අර කුලුණ සවි කරන කෙනා කෝටි ගානක් ලබාගන්නවා. ගමේ ජනතාවට සේවයක් වෙනවා වගේම, අනෙක් පැත්තෙන් ජනතාවට මර බිය ඇති වෙනවා. ඒ නිසා මේ සභාවේ දී අපි ඒකමතික යෝජනාවක් ගේනවා. අපගේ බල ප්‍රදේශය තුළ මෙවැනි ඉදි කිරීමක් කරනවාද? එම නිසා මාසිකව බදු මුදලක් ගන්නවද? ඉදිරියේදී සාකච්ඡා කරලා බදු මුදල තීරණය කිරීම  සියලු දෙනාටම යහපතක් වේවි කියල මම හිතනවා.

**ගරු සභාපතිතුමා පිළිතුරු දෙමින්**

මෙවැනි කුළුණ සම්බන්ධව ගැටළු මතුවූ විට, මෙවැනි ගාස්තු අය කර ගැනීම සම්බන්ධයෙන් නීතිමය පහසුකම් සලකා නොමැති බව දන්වමි. (බෙන්තොට ප්‍රාදේශීය සභාවේ සභාපතිතුමාට  ආපු ලිපියක්, 2006)  මම මේ සම්බන්ධව සොයා බලා මේ ලිපිය ගෙනාවෙ. තවම අපට ඒ සම්බන්ධව නීතිමය බලතල නැහැ. නමුත් ආයතන සමඟ කතා කරලා අපි යම් එකඟතාවයකට එමු.

03. 2022 වර්ෂය සඳහා ප්‍රාදේශීය සභා අරමුදලේ ලැබීම් හා වියදම් සම්බන්ධයෙන් හා සභාවට අවශය උපදෙස් ලබාදීම සඳහාත් ඊට අදාළ කාර්ය කටයුතු පිළිබඳව මහා සභාවට ඉදිරිපත් කිරීම සඳහාත් මහා සභාව වෙත නිර්දේශ ඉදිරිපත් කිරීම සඳහාත්  අවසන් තීරණ සභාවට සළකා බැලීම සඳහා යොමු කිරීම සඳහා පහත නම් සඳහන් ගරු මන්ත්‍රීතුමන්ලා හා මන්ත්‍රීතුමියන්ලාගෙන් සමන්විත සංයුතිය 05 ක් වන කාරක සභාවක් පත් කිරීමට යෝජනා කරමි.

04.

**I. මුදල් හා ප්‍රතිපත්ති කමිටුව**

ගරු සභාපති නිමල් වික්ටර් නාගොඩවිතාන මහතා, - කමිටු සභාපති
ධර්මසිරි ගණේවත්ත මන්ත්‍රීතුමා,

ප්‍රියන්තා ගුණසේකර මන්ත්‍රීතුමිය
තරංග සුදර්ශන මන්ත්‍රීතුමා
අජිත් එඩ්රිරආරච්චි මන්ත්‍රීතුමා

**ගරු සභාපතිතුමා විසින් කරන ලද යෝජනාව ගරු මන්ත්‍රී අමර ධනංජය විලේගේ මහතා විසින් ස්ථිර කරනු ලදුව ඒකමතිකව සභා සම්මත විය.**

2022 වර්ෂය සඳහා ප්‍රාදේශීය සභාවේ බලතල කාර්යයන් හා කර්තවය කිසිවකට හෝ සභාවෙහි සැළකිල්ලට භාජනය වී පවතින යම් කරුණකට හෝ අදාළව උපදෙස් දීමේ කාර්යය සඳහා මහා සභාව වෙත නිර්දේශ ඉදිරිපත් කිරීම සඳහාත් අවසන් තීරණ සභාව වෙත සළකා බැලීම සඳහාත් පහත නම් සඳහන් මන්ත්‍රී මණ්ඩලයෙන් සමන්විත සංයුතිය 06 ක් වන කාරක සභාවක් පත් කිරීමට යෝජනා කරමි.

**II. කාර්මික සේවා කමිටුව**

ගරු සභාපති නිමල් වික්ටර් නාගොඩවිතාන මහතා, - කමිටු සභාපති
ගරු මන්ත්‍රී ලක්රුවන් සම්පත් මහතා
ගරු මන්ත්‍රී පියල් හිරිමුතුගොඩ මහතා
ගරු මන්ත්‍රී එම්.එම්. දිසානායක මහතා
ගරු මන්ත්‍රී වසන්ත කුමාරගේ මහතා
ගරු මන්ත්‍රිනී ඉනෝකා විජේවර්ධන මහත්මිය

**ගරු සභාපතිතුමා විසින් කරන ලද යෝජනාව ගරු මන්ත්‍රී වෙරංග ලක්මාල් මහතා විසින් ස්ථිර කරනු ලදුව ඒකමතිකව සභා සම්මත විය.**

2022 වර්ෂය සඳහා ප්‍රාදේශීය සභාවේ බලතල කාර්යයන් හා කර්තවය කිසිවකට හෝ සභාවෙහි සැළකිල්ලට භාජනය වී පවතින යම් කරුණකට හෝ අදාළව උපදෙස් දීමේ කාර්යය සඳහා මහා සභාව වෙත නිර්දේශ ඉදිරිපත් කිරීම සඳහාත්, අවසන් තීරණ සභාව වෙත සළකා බැලීම සඳහාත් පහත නම් සඳහන් මන්ත්‍රී මණ්ඩලයෙන් සමන්විත සංයුතිය 06 කින් යුත් මන්ත්‍රී මණ්ඩලයක් පත් කිරීමට යෝජනා කරමි.

**III. නිවස හා ප්‍රජා සංවර්ධන කමිටුව**

ගරු සභාපති නිමල් වික්ටර් නාගොඩවිතාන මහතා, - කමිටු සභාපති
ගරු උප සභාපති ගාමිණී සුසන්ත මහතා
ගරු මන්ත්‍රී වෙරංග ලක්මාල් මහතා
ගරු මන්ත්‍රී සමන් විතානගේ මහතා
ගරු මන්ත්‍රී රංජිත් ජයවීර මහතා
ගරු මන්ත්‍රිනී කේ.එච්.එම්. නදීකා දර්ශනී මහත්මිය

**ගරු සභාපතිතුමා විසින් කරන ලද යෝජනාව ගරු මන්ත්‍රී චන්ද්‍රසිරි වනිගරත්න මහතා විසින් ස්ථිර කරනු ලදුව ඒකමතිකව සභා සම්මත විය.**

2022 වර්ෂය සඳහා ප්‍රාදේශීය සභාවේ බලතල කාර්යයන් හා කර්තවය කිසිවකට හෝ සභාවෙහි සැළකිල්ලට භාජනය වී පවතින යම් කරුණකට හෝ අදාළව උපදෙස් දීමේ කාර්යය සඳහා මහා සභාව වෙත නිර්දේශ ඉදිරිපත් කිරීම සඳහාත්, පරිසර විෂයෙහිලා බලපත්‍ර ලබාදීමේදී නිර්දේශ ඉදිරිපත් කිරීම සඳහාත් පරිසර ගැටළු සම්බන්ධව උපදෙස් ලබා දීම හා නිර්දේශ ලබා දීම සඳහාත්

සංයුතිය 05 කින් යුත් මන්ත්‍රී මණ්ඩලයක් සහා නිලධාරීන්ගන් සමන්විත කාරක සහාවක් පත් කිරීමට යෝජනා කරමි.

**IV. පරිසර කමිටුව**

ගරු සභාපති නිමල් වික්ටර් නාගොඩවිතාන මහතා, - කමිටු සභාපති
ගරු මන්ත්‍රී චන්ද්‍රසිරි වනිගරත්න මහතා
ගරු මන්ත්‍රී විපිත් සහබන්දු මහතා
ගරු මන්ත්‍රිනී සුභාෂී ඒකනායක මහතා
ගරු මන්ත්‍රී රංජත් ජයවීර මහතා
ගරු මන්ත්‍රී නිශාන්ත නන්දන මහතා
මහජන සෞඛ්‍ය පරීක්ෂක (කොට්ඨාශයට අදාළ)
මධ්‍යම පරිසර අධිකාරියේ නිලධාරී
අවශ්‍යතාවය මත බාහිර ආයතනික නිලධාරීන්

**ගරු සභාපතිතුමා විසින් කරන ලද යෝජනාව ගරු මන්ත්‍රිනී ප්‍රියන්තා ගුණසේකර මහත්මිය විසින් ස්ථිර කරනු ලදුව ඒකමතිකව සහා සම්මත විය.**

2022 වර්ෂය සඳහා ප්‍රාදේශීය සභාවේ බලතල, කාර්යයන් හා කර්තවය කිසිවකට හෝ සභාවෙහි සැළකිල්ලට භාජනය වී පවතින යම් කරුණකට හෝ අදාළව උපදෙස් දීමේ කාර්යය සඳහා මහා සභාව වෙත නිර්දේශ ඉදිරිපත් කිරීම සඳහාත්ල ප්‍රසම්පාදන කටයුතු සම්බන්ධ අවසන් තීරණ සභාව වෙත සළකා බැලීම සඳහා ඉදිරිපත් කිරීමටත්, සංයුතිය 06 කින් යුත් පහත නම් සඳහන් මන්ත්‍රී මණ්ඩලයක් පත් කිරීමට යෝජනා කරමි.

**V. ටෙන්ඩර් කමිටුව**

ගරු සභාපති නිමල් වික්ටර් නාගොඩවිතාන මහතා, - කමිටු සභාපති
ගරු උප සභාපති ගාමිණී සුසන්ත මන්ත්‍රීතුමා
ගරු මන්ත්‍රී ලක්රුවන් සම්පත් මහතා
ගරු මන්ත්‍රී එම්. එම්. දිසානායක මහතා
ගරු මන්ත්‍රී චන්ද්‍ර සහබන්දු මහතා
ගරු මන්ත්‍රී අජිත් එඩේරආරච්චි මහතා

**ගරු සභාපතිතුමා විසින් කරන ලද යෝජනාව ගරු මන්ත්‍රී සමන් විතානගේ මහතා විසින් ස්ථිර කරනු ලදුව ඒකමතිකව සහා සම්මත විය.**

2022 වර්ෂය සඳහා ප්‍රාදේශීය සභාවේ බලතල, කාර්යයන් හා කර්තවය කිසිවකට හෝ සභාවෙහි සැළකිල්ලට භාජනය වී පවතින යම් කරුණකට හෝ අදාළව උපදෙස් දීමේ කාර්යය සඳහාත්, මහා සභාව වෙත නිර්දේශ ඉදිරිපත් කිරීම සඳහාත්, ප්‍රසම්පාදන ක්‍රියාවලියේදී අවශ්‍ය නිර්දේශ ලබාදීම සඳහාත් සංයුතිය 06 කින් යුත් පහත නම් සඳහන් මන්ත්‍රී මණ්ඩලයක් පත් කිරීමටත්ල අවශ්‍යතාවය මත තාක්ෂණ දැණුම ඇති බාහිර ආයතනික පුද්ගලයින්ගෙන්ද සමන්විත කමිටුවක් පත් කිරීමට යෝජනා කරමි.

**VI.තාක්ෂණ ඇගයුම් කමිටුව**

ගරු සභාපති නිමල් වික්ටර් නාගොඩවිතාන මහතා, - කමිටු සභාපති

ගරු මන්ත්‍රී සමන් විතානගේ මහතා
ගරු මන්ත්‍රී ගයාන් මධුෂංක මහතා
ගරු මන්ත්‍රී වෙරංග ලක්මාල් මහතා
ගරු මන්ත්‍රිනී ගයන්ති කුමාරි මහත්මිය
ගරු මන්ත්‍රී තරංග සුදර්ශන මහතා

**ගරු සභාපතිතුමා විසින් කරන ලද යෝජනාව ගරු මන්ත්‍රී ලක්රුවන් සම්පත් මහතා විසින් ස්ථිර කරනු ලදුව ඒකමතිකව සභා සම්මත විය.**

2022 වර්ෂය සඳහා ප්‍රාදේශීය සභාවේ බලතල කාර්යයන් හා කර්තවය කිසිවකට හෝ සභාවෙහි සැළකිල්ලට භාජනය වී පවතින යම් කරුණකට හෝ අදාළව උපදෙස් දීමේ කාර්යය සඳහාත් මහා සභාව වෙත නිර්දේශ ඉදිරිපත් කිරීම සඳහාත් පුස්තකාල කටයුතු සම්බන්ධයෙන් අවසන් තීරණ සබාව වෙත සළකා බැලීම සඳහා ඉදිරිපත් කිරීමටත් සංයුතිය 05 කින් යුත් මන්ත්‍රී මණ්ඩලයක් පත් කිරීමටත් පාඨක සමාජ සාමාජිකයන් ඇතුළුව කමිටුවක් පත් කිරීමට යෝජනා කරමි.

**VII. පුස්තකාල උපදේශන කමිටුව**

ගරු සභාපති නිමල් වික්ටර් නාගොඩවිතාන මහතා, - කමිටු සභාපති
ගරු මන්ත්‍රිනී ප්‍රියන්තා ගුණසේකර මහත්මිය
ගරු මන්ත්‍රිනී සුභාෂි ඒකනායක මහත්මිය
ගරු මන්ත්‍රී ධර්මසිරි ගනේවත්ත මන්ත්‍රීතුමා
ගරු මන්ත්‍රිනී කේ. ඒ. චන්දිමා දිල්රුක්ෂි මහත්මිය
ගරු මන්ත්‍රිනී නෙලී වක්වැල්ල මහත්මිය

**ගරු සභාපතිතුමා විසින් කරන ලද යෝජනාව ගරු මන්ත්‍රිනී කේ.කේ.අයි.නෙරංජලී මහත්මිය විසින් ස්ථිර කරනු ලදුව ඒකමතිකව සභා සම්මත විය.**

2022 වර්ෂය සඳහා ප්‍රාදේශීය සභාවේ බලතල කාර්යයන් හා කර්තවය කිසිවකට හෝ සභාවෙහි සැළකිල්ලට භාජනය වී පවතින යම් කරුණකට හෝ අදාළව උපදෙස් දීමේ කාර්යය සඳහා මහා සභාව වෙත නිර්දේශ ඉදිරිපත් කිරීම සඳහාත් ප්‍රසම්පාදන කටයුතු සම්බන්ධ අවසන් තීරණ සභාව වෙත සළකා බැලීම සඳහා ඉදිරිපත් කිරීමටත් සංයුතිය 06 කින් යුත් පහත නම් සඳහන් මන්ත්‍රී මණ්ඩලයක් පත් කිරීමට යෝජනා කරමි.

**VIII . ප්‍රසම්පාදන කමිටුව**

ගරු සභාපති නිමල් වික්ටර් නාගොඩවිතාන මහතා, - කමිටු සභාපති
ගරු උප සභාපති ගාමිණී සුසන්ත මන්ත්‍රීතුමා
ගරු මන්ත්‍රී ලක්රුවන් සම්පත් මහතා
ගරු මන්ත්‍රී එම්. එම්. දිසානායක මහතා
ගරු මන්ත්‍රී චන්ද්‍ර සහබන්දු මහතා
ගරු මන්ත්‍රී අජිත් එඩේරආරච්චි මහතා

**ගරු සභාපතිතුමා විසින් කරන ලද යෝජනාව ගරු මන්ත්‍රිනී සුභාෂි ඒකනායක මෙනවිය විසින් ස්ථිර කරනු ලදුව ඒකමතිකව සභා සම්මත විය.**

05. නාගොඩ ප්‍රාදේශීය සභාවේ වැඩ බලන ලේකම් ලෙස කටයුතු කරන එම්.ඒ.ඩිලානි චන්ද්‍රප්‍රභා මහත්මිය සෞඛ්‍ය හේතූන් මත වැඩ බලන ලේකම් තනතුරේ කටයුතු කිරීම අපහසු බැවින් එම තනතුරෙන් ඉවත් කර වෙනත් නිලධාරියකු වැඩ බලන ලේකම් තනතුරට පත් කර ගන්නා ලෙස කරන

ලද ඉල්ලීමට අනුව, සභාවේ ප්‍රධාන කළමනාකරණ සහකාර සේවයේ කටයුතු කල චන්දිමා සෙනවිරත්න මහත්මිය නාගොඩ ප්‍රාදේශීය සභාවේ වැඩ බලන ලේකම්ධූරයට පත් කිරීමට යෝජනා කරමි.

**ගරු සභාපතිතුමා විසින් ඉදිරිපත් කරන ලද ඉහත සඳහන් යෝජනාව ගරු මන්ත්‍රී අමර ධනංජය විලේගේ මහතා විසින් ස්ථිර කරනු ලදුව ඒකමතිකව සභා සම්මත විය.**

06. ප්‍රාදේශීය සභා පනතේ 12 වන වගන්තිය ප්‍රකාරව පිහිටුවන ලද මුදල් හා ප්‍රතිපත්ති කමිටුව වෙත, 1988 ප්‍රාදේශීය සභා මූල්‍ය හා පරිපාලන රීති 101 ප්‍රකාරව පැවරී ඇති ගෙවීම් බලතල ඉහත වගන්තිය යටතේ මුදල් හා ප්‍රතිපත්ති කමිටුව වෙත පැවරීමට යෝජනා කරමි.

I. ඒ අනුව රු. 100000.00 ක් දක්වා වූ සියළු පුනරාවර්තන වියදම් ගෙවීමේ බලය මුදල් හා ප්‍රතිපත්ති කමිටුව වෙත පැවරීමට යෝජනා කරමි.

**ගරු සභාපතිතුමා විසින් කරන ලද යෝජනාව ගරු මන්ත්‍රී චන්ද්‍රසිරි වනිගරත්න මහතා විසින් ස්ථිර කරන ලදී.**

**ගරු සභාපතිතුමා අදහස් දක්වමින්,**

මුදල් කමිටුවේ අනුමැතිය අරගෙන පසුව සභාවට දාන්නේ. දැනටමත් රුපියල් 10000.00 ක් ආවරණ අනුමැතිය යටතේ ගෙවන්න තියෙනවා. යම් යම් අවස්ථාවලදී 15000.00, 20000.00 මුදල් ගෙවන්නත් වෙනවා. මුදල් කමිටුවේ ඔබතුමාලා ඉන්නවා. ඒ වගේම වෙනත් සභාවල ලක්ෂ 5 වෙන තෙක් ගෙවීම් සම්මත කර ගෙන තිබෙනවා. ඒ මුදල් තිබෙන සභාවල. නමුත් අපේ සභාවෙ එතරම් මුදල් නොමැති නිසා ලක්ෂයක් දක්වා අඩු ගණනක් අපි තීරණය කළා.

තවද රුපියල් 100000.00 වැඩි වියදම් සභා අනුමැතියෙන් ලබාදීමට යෝජනා කරමි.

**ගරු මන්ත්‍රී චන්ද්‍ර සහබන්දු මහතා අදහස් දක්වමින්**

ලක්ෂයක් කියනකොට, රුපියල් 75000.00 චෙක් එකක් එනකොට, සමහර වෙලාවට කමිටුවල නිලධාරීන් සියල්ලම පැමිණෙන්නේ නැතිලු. එම අවස්ථාවලදී නිවැරදිව තීරණය වනවද? සභාවේ අවසාන වෙනකොට ඇදගෙන නාගන්න ලැස්ති වෙන්න එපා. මේ මොහොතේ මෙතුමා ලක්ෂයක් කිව්වම මම 50000.00ට යම් සාධාරණ ගානක් නිසා එකඟ වුණා. ඒ නිසා අපි මෙයට විරුද්ධයි. මේකට ඡන්දයක් ඉල්ලනවා.

**ගරු මන්ත්‍රී ලක්රුවන් සම්පත් මහතා අදහස් දක්වමින්,**

ගරු සභාපතිතුමනි, මෙය කාලීන යෝජනාවක් හැටියට මා දකිනවා. සංවර්ධන යෝජනා හෝ කුමන හෝ වැඩපිළිවෙලක් සභාව තුල ක්‍රියාත්මක වෙලා යද්දි, මුදල් ගෙවීම් කරන්න ඊළඟ සභාව වෙනකම් ඉන්න ඕන. ඒ වගේම මුදල් කමිටු වලත් මන්ත්‍රීවරුන්, නිලධාරීන් ඉන්නවා. ඒ නිසා කාලෝචිත යෝජනාවක් ලෙස දකිනවා. උදාහරණයක් ලෙස සමහර අවස්ථාවලදී විදුලි බිල් ගෙවීමේදී, විදුලිය කපා හරිනකම්, විදුලි බිල් ගෙවීමට බැරි අවස්ථා තිබුණා. ඒ නිසා මේ යෝජනාව සම්බන්ධයෙන් අපේ විපක්ෂය ඡන්දයක් ඉල්ලුවත්, මේක විනිවිද භාවයකින් යුක්තව, අපේ ධර්මසිරි මන්ත්‍රීතුමා යෝජනාව ස්ථිර කළා. මමත් නැවතත් මේ යෝජනාව ස්ථිර කරනවා.

**ගරු මන්ත්‍රී අමර ධනංජය විලේගේ මහතා අදහස් දක්වමින්**

ගරු සභාපතිතුමනි, මමත් යෝජනා කරනවා එම ලක්ෂයේ මුදල කමිටුවල අනුමැතිය යටතේ ගෙවීම් කරන්න. නමුත් සහබන්දු මන්ත්‍රීතුමා කිව්ව කතාවෙත් යම්කිසි සත්‍ය භාවයක් තියෙනවා. නමුත් ප්‍රායෝගික වැඩ කටයුතු කරද්දී සභාවක මෙවැනි යම් කිසි මුදලක් තියෙන්න ඕන. උදා -: ලෙස මම දන්න පොලොන්නරුව ප්‍රාදේශීය සභාවේ මේ මුදල ලක්ෂ පහක්. නමුත් ගෙවීම් කටයුතු සිදු කිරීම සහ විනිවිද භාවයෙන් යුක්තව මේ කටයුත්ත කරන්න අවශ්‍යයි. කමිටුවට සහභාගී නොවී, උදේ ඇවිත් හවස අත්සන් කරලා ගිහිල්ලා, වැනි කටයුතු නොකර, නිවැරදි විදියට රැස්වෙලා කරන්න කියලා මම ඉල්ලමින්, නැවතත් මමත් මේ යෝජනාව ස්ථිර කරනවා.

**ගරු සභාපතිතුමා අදහස් දක්වමින්**

ගරු මන්ත්‍රීතුමනි, මෙම කමිටුවල දී යම් කිසි අපහසුතා මත, රැස්වීමට සහභාගී වීමට අපහසු බව ප්‍රකාශ කරන වෙලාවල් තියෙනවා. නමුත් මේ මුදල්, නීතිමය ක්‍රමවේදය තුළ ගෙවනවා මිසක්, සතයක්වත් වංචා සහගත ලෙස ගෙවීම් කරන්නේ නැහැ.

**ගරු මන්ත්‍රී තරංග සුදර්ශන මහතා අදහස් දක්වමින්,**

ගරු සභාපතිතුමාගෙන් අවසරයි. මම මුදල් කමිටුව නියෝජනය කරන විපක්ෂය හැටියට, පහුගිය දවස් වල මුදල් කමිටුවට සහභාගී වුණා. නමුත් මෙතැන කිසිම සූදානමක් නැහැ. නිලධාරීන් දන්නෙත් නැහැ. තාක්ෂණ නිලධාරී මහත්වරු දන්නෙත් නැහැ. සමහර අවස්ථාවල සභාපතිතුමත් නැහැ. අපි සමහර කාරණා සම්බන්ධයෙන් විරුද්ධත්වය ප්‍රකාශ කරලා, අත්සන් කරලා ගිහිපු අවස්ථා තියෙනවා. මම හිතන්නෙ මේ සම්බන්ධයෙන් ප්‍රියන්තා මන්ත්‍රීතුමිය සාක්ෂි දරාවි. සමහර වෙලාවට මන්ත්‍රීවරු දවස පුරා සහභාගී වෙනවා. සභාවේ අවසාන මාස දෙකට රුපියල් 100,000.00 නෙවෙයි. 50,000.00 දක්වා අතරමැදි අවස්ථාවකට තමයි එකඟ වුනේ. අපේ සහබන්දු මහත්මයත් එහෙම තමයි එකඟ වුනේ.

**ගරු සභාපතිතුමන් විසින් ඉදිරිපත් කරන ලද ඉහත සඳහන් යෝජනාවට විරුද්ධත්වය ප්‍රකාශ කරමින් ගරු මන්ත්‍රී චන්ද්‍ර සහබන්දු මහතා යෝජනාවක් ඉදිරිපත් කල අතර, ගරු මන්ත්‍රී වසන්ත කුමාරගේ මහතා එම යෝජනාව ස්ථිර කරන ලදී.**

අනතුරුව ගරු සභාපතිතුමා විසින් මෙම යෝජනාව සම්බන්ධයෙන් ඡන්දයකට යාම සිදු කරන ලදී. එහිදී ගරු සභාපතිතුමා විසින් සභිකයන්ට අත් එසවීමෙන් ඡන්ද ප්‍රකාශ කරන ලෙස දැණුම් දෙන ලදී. මෙම යෝජනාවට පක්ෂව ඡන්ද 14 ක් ලැබුණු අතර, විපක්ෂව ඡන්ද 09 ක් ලැබිනි. 02 නෙක් ඡන්දය දීමෙන් වැළකී සිටි අතර, එම අවස්ථාව වන විට එක් අයෙක් සභා ගර්භයෙන් පිටව ගොස් තිබුනි.

**යෝජනාවට පක්ෂව ඡන්දය ලබා දුන් මහජන නියෝජිතයින්**

i. ගරු උප සභාපති එම්.කේ. ගාමිණී සුසන්ත මහතා
ii. ගරු මන්ත්‍රී එන්.ජී.ගයාන් මදුසංඛ මහතා
iii. ගරු මන්ත්‍රී පියල් හිරිමුතුගොඩ මහතා
iv. ගරු මන්ත්‍රී ධර්මසිරි ගනේවත්ත මහතා
v. ගරු මන්ත්‍රිනී සුභාෂි මධුමාලි ඒකනායක මෙනවිය
vi. ගරු මන්ත්‍රී ඊ.ඒ. වෙරංග ලක්මාල් මහතා
vii. ගරු මන්ත්‍රී නාපෙ විතානගේ සමන් මහතා
viii. ගරු මන්ත්‍රී චන්ද්‍රසිරි වනිගරත්න මහතා
ix. ගරු මන්ත්‍රී විලේගේ අමර ධනංජය මහතා
x. ගරු මන්ත්‍රිනී ප්‍රියන්තා ගුණසේකර මහත්මිය
xi. ගරු මන්ත්‍රී එච් කේ. ලක්රුවන් සම්පත් මහතා
xii. ගරු මන්ත්‍රී එම්.එම්.දිසානායක මහතා
xiii. ගරු මන්ත්‍රී එන්.ඩබ්. පතිනායක මහතා
xiv. ගරු මන්ත්‍රී විජිත් වීරගුණරත්න සහබන්දු මහතා

**යෝජනාවට විපක්ෂව ඡන්දය ලබා දුන් මහජන නියෝජිතයින්**

i. ගරු මන්ත්‍රී කුමාරගේ වසන්ත මහතා
ii. ගරු මන්ත්‍රී ඩබ්.ජී.නිශාන්ත මහතා
iii. ගරු මන්ත්‍රී එච්.ජී.තරංග සුදර්ශන මහතා
iv. ගරු මන්ත්‍රී චන්ද්‍ර වීරගුණරත්න.සහබන්දු මහතා
v. ගරු මන්ත්‍රිනී කේ.කේ.අයි.නෙරංජලී මහත්මිය
vi. ගරු මන්ත්‍රිනී කේ.ඒ.සී. දිල්රුක්ෂි මහත්මිය
vii. ගරු මන්ත්‍රිනී එච්.එච්. ගයන්ති කුමාරි මහත්මිය
viii. ගරු මන්ත්‍රිනී කේ.එච්.එම්.නදීකා දර්ශනී
ix. ගරු මන්ත්‍රී පී.ජී.රංජිත් ජයවීර

**යෝජනාවට ඡන්දය ලබා නොදුන් මහජන නියෝජිතයින්**

x. ගරු මන්ත්‍රී ඊ.ඒ.වී. අජිත් කුමාර මහතා
xi. ගරු මන්ත්‍රිනී ඩබ්.කේ.නෙලී මහත්මිය

**එම අවස්ථාවේ සභා ගර්භයේ නොසිටි මහජන නියෝජිතයින්**

i. ගරු මන්ත්‍රී බන්දුල සමන්ත හිරිමුතුගොඩ මහතා

**ඒ අනුව වැඩි ඡන්ද 05 කින් එම යෝජනාව ස්ථිර කරන ලදී.**

**ඒ අනුව ගරු සභාපතිතුමා විසින් ඉදිරිපත් කරන ලද ඉහත සඳහන් යෝජනාව ගරු මන්ත්‍රී ලක්රුවන් සම්පත් මහතා විසින් ස්ථිර කරනු ලදුව ඒකමතිකව සභා සම්මත විය.**

II. තවද රු. 100000.00 ට වැඩි සියළු පුනරාවර්තන වියදම් සහ සියළු ප්‍රාග්ධන වියදම් සභා අනුමැතියෙන් පසුව ගෙවීම් කිරීමට යෝජනා කරමි.

**ගරු සභාපතිතුමා විසින් ඉදිරිපත් කරන ලද ඉහත සඳහන් යෝජනාව ගරු මන්ත්‍රී ලක්රුවන් සම්පත් මහතා විසින් ස්ථිර කරනු ලදුව ඒකමතිකව සභා සම්මත විය.**

07. වළකුඹුර නව ආදාහනාගාරය ඉදිකිරීම ව්‍යාපෘතියේ අනුමත ප්‍රතිපාදන සීමාවේ උපරිමය වන රු. 50,800,000.00 දක්වා ඇස්තමේන්තුව සංශෝධනය කිරීමට අනුමැතිය ලබා දීමට යෝජනා කරමි.

**ගරු සභාපතිතුමා විසින් ඉදිරිපත් කරන ලද ඉහත සඳහන් යෝජනාව ගරු මන්ත්‍රී චන්ද්‍රසිරි වනිගරත්න මහතා විසින් ස්ථිර කරනු ලදුව ඒකමතිකව සභා සම්මත විය.**

08. තල්ගස්වල නගරයේ වෙළඳ සංකීර්ණය ඉදිකිරීම අදියර 1 ව්‍යාපෘතියේ ඉදිකිරීම් භූමියෙහි පාංශු ස්ථරවල පවතින වෙනස්කම් හා ගොඩනැගිල්ල තෙමහල් ගොඩනැගිල්ලක් දක්වා ඉදිරි අදියරයන්හිදී සංවර්ධනය කිරීමේ අරමුණින්ද ඉදිරි අවශ්‍යතාවයන්ද සැළකිල්ලට ගෙන ගොඩනැගිලි සැළසුම පළාත් ප්‍රධාන ඉංජිනේරුතුමාගේ උපදෙස් පරිදි වෙනස්කිරීමේ අවශ්‍යතාවයක් මතු වී ඇත. ඒ අනුව නව ගොඩනැගිල්ල සැළසුම හා අනුමත ප්‍රතිපාදන සීමාවේ උපරිමය වන රු. 10,000,000.00 දක්වා ඇස්තමේන්තුව සංශෝධනය කිරීමට අනුමැතිය ලබා ගැනීමට යෝජනා කරමි.

**ගරු සභාපතිතුමා අදහස් දක්වමින්**

ලක්ෂ 100 ක ඇස්තමේන්තුව හැදුවට එම ස්ථානයේ බිම හැරීමේදි විශාල වශයෙන් වෙනස්කම් කිරීමට සිදුවුනා. ස්ථානයේ වටිනාකම අනුව මුළු භූමියම ප්‍රයෝජන ගත යුතු නිසා මේ සැළසුම් යම් යම් වෙනස්කිරීම් කළා. මේ පිළිබඳව ප්‍රධාන ඉංජිනේරුතුමා සහ කොමසාරිස්තුමා අධීක්ෂණය කළා. වඩා, වෙනත් ක්‍රමයක් අනුගමනය කරන්න වුණා. මුළු භූමියම ප්‍රයෝජනයට ගැනීමේ හැකියාව නැහැ. විශාල වශයෙන් හැරීමට සිදුවුනා. කොමසාරිස්තුමා ඇවිල්ලා සියල්ල නිරීක්ෂණය කරලා ගියා.

**ගරු සභාපතිතුමා විසින් ඉදිරිපත් කරන ලද ඉහත සඳහන් යෝජනාව ගරු මන්ත්‍රී චන්ද්‍රසිරි වනිගරත්න මහතා විසින් ස්ථිර කරනු ලදුව ඒකමතිකව සභා සම්මත විය.**

09. නාගොඩ ප්‍රාදේශීය සභාවේ අභ්‍යන්තර විගණන සැළැස්ම 2022 වර්ෂයට අදාළව ක්‍රියාත්මක කිරීමට යෝජනා කරමි.

**ගරු සභාපතිතුමා විසින් ඉදිරිපත් කරන ලද ඉහත සඳහන් යෝජනාව ගරු මන්ත්‍රීනී නෙලී වක්වැල්ල මහත්මිය විසින් ස්ථිර කරනු ලදුව ඒකමතිකව සභා සම්මත විය.**

09. 2021.12.31 න් අවසන් වර්ෂය සඳහා සිදු කල යුතු භාණ්ඩ සමීක්ෂණය 2022.01.03 දින ආරම්භ කරන බැවින් ප්‍රාදේශීය සභා ප්‍රධාන කාර්යාලය, ප්‍රධාන කාර්යාලයේ පුස්තකාලය, මාපලගම උප

කාර්යාලය හා ආයුර්වේදය, උඩුගම උප කාර්යාලය ,කොම්පෝස්ට් අංගනය හා පෙර පාසැල් 15 හි සමීක්ෂණ කටයුතු සිදු කිරීම සඳහා පහත නිළධාරී මණ්ඩලය පත් කොට ඇති අතර එම සමීක්ෂණ මණ්ඩලය සඳහා සුදුසු සභා නියෝජිතයින් තිදෙනෙකු පත් කර ගැනීම සඳහා යෝජනා කරමි.

| | | |
|---|---|---|
| 1.යුරේකා මල්කාන්ති මිය | - | සංවර්ධන නිලධාරී |
| 2.කේ.ජී.මානෙල් සුදර්ශණී මිය | - | සංවර්ධන නිලධාරී |
| 3. කේ.ඩී.එස්.නිපුනිකා මිය | - | සංවර්ධන නිලධාරී |
| 4. නිලන්ති වේරගොඩ මිය | - | සංවර්ධන නිලධාරී |
| 5. ජී.තරංගා ඉෂාරි | - | සංවර්ධන නිලධාරී |
| 6. එන්.නිසංසලා දිල්රුක්ෂි | - | සංවර්ධන නිලධාරී |
| 7. කේ.ජී.අනුෂා කුමාරි | - | සංවර්ධන නිලධාරී |
| 8.සදමාලි සේනාධීර මිය | - | සංවර්ධන නිලධාරී |
| 9.එන්.එච්.ඩී.නිරෝෂණී මිය | - | කළමණාකරණ සහකාර |
| 10.මසිදා අන්වර් මෙය | - | කළමණාකරණ සහකාර |
| 11.මදූෂානි වාසනා මෙය | - | කළමණාකරණ සහකාර |
| 12.රුවිනි චතුරිකා මිය | - | කළමණාකරණ සහකාර |
| 13. කේ.එල්.එන්.ප්‍රමෝද් මයා | - | තාක්ෂණ නිළධාරී |
| 14.කුසල් එදිරිසිංහ මයා | - | තාක්ෂණ නිළධාරී |
| 15.අනූෂා සමරවික්‍රම මෙය | - | තාක්ෂණ නිළධාරී |
| 16.අයේෂ් ශානක මයා | - | ආදායම් පරීක්ෂක |
| 17.චතුරානි පතිනායක මිය | - | වැඩ ක්ෂේත්‍ර කම්කරු |
| 18.සන්ධ්‍යා මල්කාන්ති මිය | - | වැඩ ක්ෂේත්‍ර කම්කරු |
| 19.ඉෂානි දීපිකා මිය | - | පරිගණක ක්‍රියාකරු |
| 20.යූ.වී.මදූර ප්‍රභාත් මයා | - | කාර්යාල කාර්ය සහයක |
| 21.අවන්ත පද්ම මයා | - | කාර්යාල කාර්ය සහයක |
| 22.ඩබ්.ඒ.චමරි මධූෂානි මිය | - | කාර්යාල කාර්ය සහයක |
| 23. ජී.ඩී.ධනපාල මෙය | - | සංවර්ධන නිළධාරී ප.පා.සහ.කො.කාර්යාලය |

2021.12.31 න් අවසන් වර්ෂයේ භාණ්ඩ සමීක්ෂණ මණ්ඩලය සඳහා පත් වූ සභිකයින්

1.ගරු මන්ත්‍රී රංජිත් ජයවීර මහතා

2. ගරු මන්ත්‍රී සුභාෂී ඒකනායක මෙය

3.ගරු මන්ත්‍රී කුමාරගේ වසන්ත මහතා

**ගරු සභාපතිතුමා විසින් ඉදිරිපත් කරන ලද ඉහත සඳහන් යෝජනාව ගරු මන්ත්‍රීනී නෙලී වක්වැල්ල මහත්මිය විසින් ස්ථිර කරනු ලදුව ඒකමතිකව සභා සම්මත විය.**

**ගරු මන්ත්‍රී සමන් නාපෙවිතානගේ මහතා ඉදිරිපත් කරන යෝජනා**

01. හෝමදොල නො.02 කටුපොල් තවාන අසළ සිට හොරගස්පහ මාර්ගය J.C.B. යන්ත්‍රයක් යොදා සංවර්ධනය කිරීම

**ගරු මන්ත්‍රී සමන් නාපෙව්තානගේ විසින් ඉදිරිපත් කරන ලද ඉහත සඳහන් යෝජනාව ගරු මන්ත්‍රී අමර ධනංජය විලේගේ මහතා විසින් ස්ථිර කරනු ලදුව ඒකමතිකව සභා සම්මත විය.**

02. උඩුගම ගුණානන්ද මාවතේ කාණු පද්ධතිය පිළිසකර කිරීම

**ගරු මන්ත්‍රී සමන් නාපෙව්තානගේ විසින් ඉදිරිපත් කරන ලද ඉහත සඳහන් යෝජනාව ගරු මන්ත්‍රී අමර ධනංජය විලේගේ මහතා විසින් ස්ථිර කරනු ලදුව ඒකමතිකව සභා සම්මත විය.**

**(ඉ) 3. ඇස්තමේන්තු ඉදිරිපත් කිරීම**

01. 212 කැප්පිටියාගොඩ ග්‍රාම සේවා වසමට අයත් අත්කම් නිවාස ආදාහනාගාරය සඳහා ගමන් කරන මාර්ගය කොරිපස් යොදා සංවර්ධනය කිරීම රු. 40000.00

02. අළුත්වත්ත 18 කන්ද මාර්ගය J.C.B. යන්ත්‍රයක් යොදා සංවර්ධනය කිරීම රු. 30000.00

03. රතුමිල්ලවල කුරුඳුකොළනිය ෆයිනස් කන්ද දක්වා මාර්ගය J.C.B. යන්ත්‍රයක් යොදා සංවර්ධනය කිරීම රු. 37500.00

04. ශ්‍රමදාන මාවත සංවර්ධනය කිරීම රු. 60000.00

05. උඩවැලිවිටිය ගම්මැද්දේගොඩ යා කරන මාර්ගය කොරිපස් යොදා සංවර්ධනය කිරීම රු. 35000.00

06. උඩවැලිවිටිය ගල්ලෙනමුල්ල ප්‍රධාන මාර්ගය පැති කාණු කපා සංවර්ධනය කිරීම රු. 75000.00

07.යෝජිත වළකුඹුර ආදාහනාගාරයේ පිවිසුම් මාර්ගය හා භූමිය සකස් කිරීම අදියර 4 රු. 500000.00

08. යෝජිත වළකුඹුර ආදාහනාගාරයේ පිවිසුම් මාර්ගය හා භූමිය සකස් කිරීම අදියර 3 රු. 150000.00

**ඉහත සඳහන් ඇස්තමේන්තු සභාව පිළිගත යුතු බවට ගරු මන්ත්‍රී ලක්රුවන් සම්පත් මහතා විසින් යෝජනා කල අතර, ගරු මන්ත්‍රීනී ප්‍රියන්තා ගුණසේකර මහත්මිය විසින් ස්ථිර කරන ලදුව ඒකමතිකව සභා සම්මත විය.**

**(ඉ).4 මිළ ගණන් ඉදිරිපත් කිරීම**

**(ඊ) කාරක සභා වාර්තා**

**(උ). ලැබීම් හා ගෙවීම් වාර්තා**

**වෙනත් කරුණු**

**ගරු මන්ත්‍රිනී ඉනෝකා නෙරංජලී මහත්මිය**

උඩවැලිවිටිය කැප්පිටියගොඩ මාර්ගය පැති ගඟ හරහා ඇති මාර්ගය පිළිබඳව කතා කරනවා නම්, එය ඉතා අබලන් තත්ත්වයක තියෙන්නෙ. මම හිතන්නේ පිළිසකර කරල නෙවෙයි නව පාලමක් ඉදි වෙන්න ඕන අවස්ථාවක තමයි තියෙන්නේ. තව ටික දවසක් ගියොත් කින්නියා පාලමට වෙච්ච දේ තමයි වෙන්න යන්නේ. එනිසා ඔබතුමාගේ අවධානය ඒ සඳහා විශේෂයෙන් යොමු කරන්න කියලා ඉල්ලා සිටිනවා.

අනෙක් කාරණය තමයි. මේ දිනවල උඩවැලිවිටිතලාව පාර සංවර්ධනය කරමින් පවතිනවා. ඒ අවස්ථාවේ උඩවැලිවිටිතලාව පාසල අසල යම් ස්ථානයක වැඩ කිරීම නැවතිලා තියෙනවා. ඒ පාරේ වතුර බස්සව ගන්න බැරි තත්වයකට ඇවිල්ලා. මම හිතන්නේ සභාවේ මහත්තයෙක් එම ගැටලුව නිරාකරණය කරන්න ගිහිල්ලා තිබුණා. ඒ පිළිබඳව වුණේ මොකක්ද කියලා දැනගන්න කැමතියි. එම ඉඩම් අයිතිකාරයො මෙතෙක් කල් වතුර බස්සපු ස්ථානය අවහිර කරලා තියෙනවා. අල්ලපු ඉඩමෙන් වතුර බස්සවන්න දෙන්නෙත් නැහැ. තාක්ෂණ නිලධාරි මහත්තයා කියලා තියෙනවා. අනෙක් පැත්තෙන් වතුර බස්සවන කතාවක්. නමුත් අනෙක් පැත්තෙ තියෙන්නෙ ජනතාව යන මාර්ගයක්. මේ වන විට එම මාර්ගයෙන් යන්න බැහැ. ඒ මාර්ගය දැනටමත් මඩවගුරක්. අපි ඒ ගැන සැලකිල්ලෙන් බලා ඉන්නවා. එමෙන්ම සෞඛ්‍ය මධ්‍යස්ථානයේ වැටක් ඉදි වෙමින් පවතිනවා. පටන්ගන්න විට කිව්වේ පැති බැම්මක් ඉදි වෙනවා කියලා. මෙම ස්ථානයේ පැති බැම්මක් නම් ඉදි වෙමින් පවතින්නේ නැති බවයි පෙනෙන්නේ. කොන්ක්‍රීට් කනු වගයක් හිටවල තිබුණා. මම හිතන්නේ වෛද්‍ය මධ්‍යස්ථානයටම කඩාගෙන වැටෙයි. දැන් ගෙදර වුණත් අර්බුදකාරී තත්ත්වයක් තියෙන්නේ. බඩු මිල ඉහළයි. පොහොර ඉහළයි. රුපියල් 6300 වගේ මිලකට තමයි පොහොර ගන්න වෙලා තියෙන්නෙ. මහාචාර්යවරියක් ආහාර හිගයක් එනවා කියලා තියෙනවා. ඒ වගේම වගා කිරීම සඳහා බීජ ටිකක් හෝ ලබා දෙන්න කියලා ඉල්ලා සිටිනවා. මොකද මාර්තු අප්‍රේල් වන විට ආහාර හිගයට යමක් කරන්න කියලා ඉල්ලා සිටිමින්, මම නිහඬ වෙනවා. ස්තුතියි.

**ගරු මන්ත්‍රී සමන් නාපෙ විතානගේ මහතා**

ගරු සභාපතිතුමනි, හෝමදොල පොලීසිය අසල පාර ජලසම්පාදන එකෙන් කඩපු අවස්ථාවෙ ඉඳලා අවුරුදු කිහිපයක් තිස්සේ ඔබතුමාගෙන් ඉල්ලීම් කරනවා. මේ වන විට ලොකු වලවල් ටිකක් හැරිලා. ගරු සභාපතිතුමනි, ඔබතුමත් ගිහින් බැලුවා. තවම කිසිඳු පියවරක් අරගෙන නැහැ. හෝමදොළ ජනඋදාන ගමේ බෝක්කුවක් කැඩිච්ච එකක් බැලුවා. ඇස්තමේන්තු කරලා, පාරට දාන්න කියලා, තාක්ෂණ නිලධාරීන් මහත්මයට ඔබතුමා එවෙලෙම නියෝග කලා. දැනටමත් මාස හත අටක් වෙනවා මේ වන විටත් තාක්ෂණ නිලධාරි මහත්මයා ඇස්තමේන්තු කරල නැහැ. මම දන්නෙ නෑ මොකද කියලා. මේ වන විටත් එක පුද්ගලයෙක් වැටිලා, කකුල කැඩිලා, එම ස්ථානය ඉතා අවධානම් ස්ථානයක්. මොනවා හරි කරලා කොන්ක්‍රීට් ටිකක් එම ස්ථානයට දාලා දෙන්න කියලා ඉල්ලීම කරනවා. විශේෂයෙන් අවධානය යොමු කරනවා. පොලීසිය අසල කඩපු පාර අවුරුදු කිහිපයක් තිස්සේ ඔබතුමාගෙන් ඉල්ලීම් කළාට කිසිදු උත්තරයක් ලැබුනෙ නැහැ. ඒ වගේම ජන උදාන ගම්මානය පාලම කැඩුණු එකට කිසි උත්තරයක් නැහැ. ඒ වගේම මේ ප්‍රශ්න තුනට පිළිතුරු සපයා දෙන්න කියලා ඉල්ලීමක් කරනවා. සම්බන්ධීකරණ කමිටුවේ දී ඔබතුමා කතා කළා මේක සභාවට තියෙන පාරක් කියලා. ඒ නිසා rd එකෙන්වත් මේ දේ කරගන්න බැරි වුණා. ගරු සභාපතිතුමනි, මේ පිළිබඳව අවධානය යොමු කරන්න කියලා ඉල්ලා සිටිනවා. ඒ වගේම අයවැයට ඡන්දය ලබා දුන්නා. ඒ පිළිබඳවත් මතක් කරමින්, මම නිහඬ වෙනවා.

**ගරු මන්ත්‍රී තරංග සුදර්ශන මහතා**

සිමෙන්ති බෝක්කුව ගාව නම් අපිත් දන්නවා. එතුමාගේ යෝජනාව ගැන අවධානය යොමු කරනවානම්, වඩාත් හොඳයි කියලා මමත් හිතනවා. ඉතා කෙටියෙන් අත්‍යාවශ්‍යම දේවල් ටිකක් කතා කරන්න ඕන. අපේ සමන් මන්ත්‍රීතුමා නියෝජනය කරන කොට්ඨාසයේමයි, එතුමාගේ ගමේ උඩුගම හෝමදොල 750 හරියේ NKTS කොන්ඩගලවත්ත වතු යාය අතර දොළ, පෙත්තදොළ ආසන්නයේ රක්ෂිතයේ අනවසර ඉදිකිරීමක් කරනවා කියලා ආරංචියි. camp inside කියන්නේ කිතුල්ගල වගේ ප්‍රදේශවල වැඩක් කියලා තමයි කියන්නේ. නමුත් මේ ගැන දන්න කිසි කෙනෙක් නැහැ. දන්න මිනිස්සු කතා කරන්නෙත් නැහැ. මේක පොලිස් නිලධාරීන්ගේ සිට හැමෝම දන්නවා. ඔබතුමා දන්නවා ඇති. කරන්නේ කවුද කියලා කවුරුවත් දන්නෙ නැහැ. එකේ හමුදාවේ වගේ පිරිසක් ඇවිල්ලා වැඩ කරනවා කියලා තමයි කියන්නේ. ගම්වාසීන්ගේ සැකයක් තියෙනවා. ඉතිහාසයේ නිධානයක් එතන තියෙනවා කියලා කතාවක්. කාටවත් යන්න දෙන්නේ නැහැ. කැලෑව ඇතුළෙ දොළක් ආසන්නයේ තමයි මේ සිද්ධිය වෙන්නේ. ප්‍රාදේශීය ලේකම්තුමා දන්නවා. වතු සමාගම් වලට අයත් මේ ප්‍රදේශයේ දැවැන්ත ව්‍යාපෘතියක් වෙනවනම් ඔබතුමා දැනගන්න ඕන. මම හිතුවා ඔබතුමා දන්නවා ඇති කියලා. මේ කර්තව්‍යයට හමුදාව කියලා කිහිපදෙනෙක් විතරයි සම්බන්ධ වෙන්නේ. කාගේ හරි බලපෑමක් මත කරන දෙයක්. මේ කටයුතු කරන්න සම්බන්ධවෙලා වැඩ කරන්න එන නිලධාරීන් එන්නේ වත්තේ සහකාර වතු අධිකාරි ගේ බංගලාවේ ඉඳලා. එතනින් ඇවිල්ලා වාහන යොදවලා, ඒ අය තමයි සහයෝගය ලබා දෙන්නේ. ඒ අය උත්තර දෙන්නෙත් නැහැ. වතු සමාගම කරන දැවැන්ත ව්‍යාපෘතියක්. ඒ වගේම වහාම සොයා බලා අවශ්‍ය කටයුතු කරන්න කියලා ඉල්ලීම් කරනවා.

ඒ වගේම ගරු සභාපතිතුමනි, මුදල් වියදම් කරලා, උඩුගම රෝහලේ දැඩි සත්කාර ඒකකය පිහිටුවලා, අද දිනයේ ඒක විවෘත කරන්න තමයි යෝජනා වෙලා තිබුනේ. ඒ නිසා අද සභාව කල් තිබ්බා. නමුත් ඒක සති 2කට කල්ගියා. ඒ ගැන සභාවට සඳහනක් කලාද දන්නෙ නැහැ. රෝහලෙන ගමට සලසන සේවාව පිළිබඳව සතුටු වෙනවා.

ගරු සභාපතිතුමනි ඒ වතුයායෙ රෝහලක් තිබිලා තියෙනවා. දැන් රෝහල වහලා. ඇම්බියුලන්ස් තිබිලා තියෙනවා. ඒ වගේම හෝමදොල දිස්පැන්සරි, නාකියදෙනිය වතුවල තිබෙන මේ දේවල් නැතිකරලා තමයි, මේ වගේ දේවල් කරන්නේ. වත්තෙ තණකොළ කපන මැෂින් එකකට කැපිලා කාන්තාවක් රෝහල් ගත කරලා, ප්‍රතිකාර කරන්න කලින් මැරුණා. ඒ වගේ අත්‍යවශ්‍ය දේවල් නොකර මේ දේවල් කරනවා. වතු සේවකයන්ගෙ හා නිලධාරීන්ගේ පහසුකම් නැති කරලා, මේවට වියදම් කරපු රජයේ හරි ගොඩනැගිලි අභාවයට යනවා. මේ ප්‍රදේශයට දැඩි ලෙස පරිසර හානිය තියෙන්නෙ වතු සමාගමෙන්. 1991 සිට හැමදෙනාම ඒ සම්බන්ධව කතා කරනවා. කිසිම සභාපතිවරයකුගේ යටතේ ඒවට පිළියමක් ගත්තෙ නැහැ. මේක වතු සමාගම් වලට අවශ්‍ය ආකාරයෙන් කරන්න දෙන්න එපා. ඒ මැදිහත්වීම කරන්න. oilpalm කපන අය උද්සෝෂණ කරනවා. පහසුකම් වරප්‍රසාද නොදීම නිසා, වතු ජනතාව පත්වන අපහසුතාවය නැති කරන්න අදාල අමාත්‍යවරයා සමඟ කතා කරලා කටයුතු කරන්න, කියලා ඉල්ලා සිටිනවා. දැන් සියලූ වතු සමාගම්වලින් වැඩ දෙන්නෙ කොන්ත්‍රාත් ක්‍රමයට. අර්ථසාධකයක්වත් නැහැ. දික්ඔය ප්‍රදේශවලින් ගෙන ගොම වතුර සීල් තියලා ගේන්නේ. නමුත් අද නාකියාදෙණිය හොමදොල වත්තට විශාල ගණනක් වැය කරලා අපද්‍රව්‍ය ගේනවා පරිසර ආයතන ඒ ගැන සැලකිල්ලක් දක්වන්නෙ නැහැ. මහජන සෞඛ්‍ය පරීක්ෂක පොලීසිය සහ නීතිය සභාව කිසිම නිලධාරියෙක් සොයන්න වතු සමාගම් වලට උදව් කරනවා කියලා තමයි මහජන මතය ඔබතුමා ලියුම්ගැහුවාත් ක්‍රියාත්මක වෙන්නැ.

ඒවගේම සභාවේ සන්දේශ ලිපිවලට ගන්න තීරණය ගැන සඳහන් වෙන්නේ නැහැ. ඒවා මොනවද වුනේ කියලා වත් සඳහන් වෙලා ඒ ගැනත් අවධානය යොමු කරන්න කියලා අවසාන වශයෙන් අනුර දිසානායක කියන රියදුරු කම්කරු සේයැම අවශ්‍යතාවය මත කියලා ස්ථිර රියදුරෙක් එසේ කරන්න පුළුවන්ද කියලා මම දන්නෙ නැහැ. හැබැයි ලේකම්තුමිය අත්සන් කරලා නැහැ. අද දින ලේකම්තුමිය

ඉල්ලා අස්වුනෙත් ඒකද කියලා මට හිතෙනවා. තාවකාලික රියදුරෙකුට වාහනය දීලා ස්ථිර සේවකයෙකු වෙන දේකට යොමු කරන්න පුළුවන්ද කියලා හම්බ තුමාගෙන් අහනවා.

**ගරු සභාපතිතුමා පිළිතුරු දෙමින්**

ඔය කියන රියදුරු සභාවේ පරන කැබ් රථයේ රියදුරා හැටියට වැඩ කරන්නේ මේ දින වල එම රථය අලුත් වැඩියා සඳහා ගරාජයට දමා ඇති බැවින් ඔහු උප කාර්යාලයේ නිකරුනේ කාලය ගත කරන බැවින් සේවා අවශ්‍යතාවය මත තමයි ලේකම්තුමිය ගෙනුත් අහලා, විමර්ෂණ නිලධාරී මිස්ගෙන් උපදෙස් අරගෙන ඒ දේ කළේ. ඇප්තොප්වත්තෙ කටයුතු වලට යොදවමු කියලා.

**ගරු මන්ත්‍රී තරංග සුදර්ශන මහතා**

අධික වර්ෂාව නිසා නම් නොම්මර එක කොටසේ ශිවගුරු ලෝගේෂ්වරන් මැතිතුමාගේ ගෙය කඩන් වැටිලා ළමයි තුන්දෙනත් එක්ක පල්ලියේ ඉන්නේ. එතුමාගේ ගම මයියොක්කාහේන. ප්‍රාදේශීය ලේකම්වත් ඒ ගැන හරියට සොයා බලා නැහැ. ග්‍රාම නිලධාරී ගියා. නමුත් අද වෙනකන් එතුමා ඉන්නේ පල්ලියෙ. මේ ගැන සොයා බලා අවශ්‍ය බලධාරීන් දැනුවත් කරන ලෙස ඉල්ලමින්, මම නිහඬ වෙනවා.

**ගරු මන්ත්‍රී සමන් විතානගේ මහතා**

ගරු සභාපතිතුමනි පැන්ෂන් ගිය හමුදා නිලධාරීන් පිරිසක් තමයි එම කර්තව්‍යය කරන්නේ පැහැදිලිවම වටවල වැවිලි සමාගම තමයි කරන්නේ දැනට ප්‍රාදේශීය ලේකම්තුමා තහනම් කරලා තිබුනත් ග්‍රාම නිලධාරි මම ඉදිරිපිටමදීම කතා කළ විට තහනම් නියෝගයක් ගෙන ඇවිල්ලා පුළුවන්නම් නවත්තන්න කියල තමයි කිව්වෙ. එවිට පැහැදිලිවම මට පෞද්ගලිකව කතා කරලා කිව්වේ සමන් මන්ත්‍රිතුමා අපේ වත්තේ කරන වැඩ වලට ඔබතුමාලා නිතරම විරුද්ධ වෙනවා. අපේ වත්තෙත් කරන වැඩක් ඒක අපට නවත්තන්න බැහැ. කියන එක තමයි කිව්වේ නමුත් දොල රිසිවේෂන් තමයි තිබුණේ සභාපති තුමනි එක පැත්තක කටු පොල් කැල්ලක් මැද දොළ පාර තියෙන්නෙ එතන පොඩි ගස් ටිකක් තියෙනවා ඒ ගස් අස්සෙ තමයි හට් ටික ගහන්න සූදානම් කරලා තියෙන්න. කැම්ප් එකක් වගේ තමයි කරන්න බලාපොරොත්තු වෙන්නේ අපේ ඉසුරු මන්ත්‍රීතුමාත් දැනුවත් කලා ප්‍රාදේශීය ලේකම් තුමාත් දැනුවත් කළා අපේ ගෙවල් ගාව ඉඳලා කිලෝ මීටර් 7-8 දුරින් තමයි කැලෑව තියෙන්නෙ ඇත්තටම අපි ගම්වාසීන් සමග විරුද්ධවෙන්න බැලුවා නමුත් හේතුව තමයි ඔප්පුවේ තියෙන්නෙත් වත්තට දොල රිසිවේශන් නෑ කියලා තමයි කියන්නේ. ඒ නිසා දැනට පරීක්ෂණයට ප්‍රාදේශීය ලේකම්තුමා යොමු කරල තියනවා දෙයක් උනාට පස්සේ කැගහලා වැඩක් නැහැ. කොතලාවල නිධානයක් තිබේද යන්න අපි දන්නෙත් නැහැ.

**ගරු සභාපතිතුමා පිළිතුරු දෙමින්**

ඔබ කියනකං මම දැනුවත් නැහැ. මම දිසාපතිතුමාට කතා කරල ඔය පිලිබඳව විස්තර දැනගන්නම්. වතු සමාගම කොහොමත් ඉදිරියේදී කැඳවීමට කටයුතු කරනවා.

**ගරු මන්ත්‍රී රංජිත් ජයවීර මහතා**

සභාපතිතුමා ඇතුළු සමස්ත සභාවෙන් අවසරයි මගේ යෝජනා දෙකක් ස්ථිර වුණා ඒ සම්බන්ධව මා ස්තූතිය පුද කරනවා. ඒ වගේම 215B අලුත් පහළ ග්‍රාම නිලධාරී වසමේ අත්‍යවශ්‍යම කාරණයක් තමයි පානීය ජලය ගෙවල් තිහකට වගේ ජලය නැහැ ජල පෝෂිතයක් තියෙනවා ටැංකිය තියෙනවා අපට තියෙන්නෙ බට ටික එලල දාන්න විතරයි. ගරු සභාපති ඒ සඳහා ඔබතුමාගේ අවධානය යොමු කරන්න කියලා ඉල්ලා සිටිනවා ඒ වගේම අතිගරු ජනාධිපති තුමාගේ සංකල්පයකට අනුව කොම්පෝස්ට් හදමු කියලා කිව්වා නමුත් එක්ක ගොවිජන සේවා එකකටවත් මෙතෙක් කල් කොම්පෝස්ට් යන්ත්‍රයක් දීලා නැහැ සියලු මන්ත්‍රීවරු දැනුවත් ඇති යූරියා කිලෝ එකක් රුපියල්

දෙදාහක් වෙනවා ගොවිතැන් අස්වද්දන්න බැහැ. රුපියල් 1800 දෙන්නම් කිව්වා බහුකාර්ය යන්ත්‍රයක් ලබා දෙන්න ඔබතුමා කිව්වා ලක්ෂ සීයක් දීල සති පොල සංවර්ධනය කරනවා කියලා තවම නැහැ. මම ඉස්සෙල්ල කිව්වා. යකඩ දොර ගලවන් ගිහිල්ලා තල්ගස්වල සති පොළ නමුත් තව ඒ සම්බන්ධව වග විභාගයක් නැහැ. වැසිකිළි වලට යන්න බැහැ කියලා වෙළෙන්දන් කියනවා. සභාවෙන් පොල බදු මුදල් එකතු කිරීමේදී එක බිලක් වත් දෙන්නැ. හිතෙන හිතෙන ගානවල් අරගන්නවා කියල කියනවා. වාර්තා මොනවත් නැහැ ගිහිල්ලා සල්ලි එකතු කරන්නේ සභාවෙන්. නමුත් එක බිලක් වත් දෙන්නේ නැතිලු. නීතිමය වශයෙන් කරනවනම්, අනිවාර්යෙන් බිලක් දෙන්න ඕන. ඒ කිසිම දෙයක් නැහැ. දැන් ගැස් ප්‍රශ්නයත් ඒ වගෙයි. තල්ගස්වල සතිපොල පිළිබඳව සොයා බලන්න. ඒ වගේම සභබන්දු මහත්තයා කිව්වා වගේ ප්‍රියන්ත මහත්මයාට ශෝකය පළ කර සිටිනවා. අපේ දරුවන්ටත් ඒ වීඩියෝව බලන්න බැරි තරම් අමානුෂික පහරදීම් හා එය හෙළා දකිනවා.

**ගරු සභාපතිතුමා පිළිතුරු දෙමින්**

ජයවීර මන්ත්‍රීතුමා ප්‍රකාශකරන යම් යම් ප්‍රශ්න ගැන පුන පුනා කතා කියන්න ඕන නෑ කවුරුත් දන්න කාරණා ඕවා.නමුත් පොළ පිළිබඳ  කල ප්‍රකාශය වැරදියි.ලක්ෂ 100 ක් නොව ලක්ෂ 13 යි.වැසිකිලි ප්‍රශ්න නෑ යකඩ දොර පිළිබඳව සොයා බලනවා.

**ගරු මන්ත්‍රිනි ප්‍රියන්තා ගුණසේකර මහත්මිය**

ආදාහනාගාරයට ප්‍රවිශ්ට වන මාර්ගය කොරි පස් දෙකක් දමා සංවර්ධනය කර දීම යෝජනාව සම්බන්ධයෙන් රුපියල් 40,000 ක ඇස්තමේන්තුවක් ඉදිරිපත් කළා ඒ සම්බන්ධව මා බෙහෙවින් සතුටු වෙනවා. ඒ වගේම ඉතා ඉක්මනින් මේ කටයුත්ත කර දෙන ලෙස ඉල්ලා සිටිනවා. හෙලෝ කිඩ්ස් පෙරපාසල අසල බස් නැවතුම්පොළ ඉවත් කරලා වෙනත් ස්ථානයක හදන්න තීරණය කලා. ඒ පිළිබඳව මාර්ග සංවර්ධන අධිකාරිය විසින් අපේ සභාවට ලිඛිතව ඉල්ලීමක් කරල තියෙන්නෙ ඒ පිළිබඳවත් අවධානය යොමු කරන්න කියලා ගෞරවයෙන් ඉල්ලා සිටිනවා. විශේෂයෙන් කැප්පිටියාගොඩ උනන්විටිය යාකරන පාළම පිළිබඳව ඉනෝකා මන්ත්‍රීතුමිය මෙතන සඳහන් කළා. ඇත්තටම අපි කවුරුත් ඒ පිළිබඳව අවධානය යොමුකරමින් සිටිනවා. විශේෂයෙන් ලක්රුවන් මන්ත්‍රීතුමා පසුගිය කාලවල අපි දෙන්න මේ සම්බන්ධව සාකච්ඡා කළා. විශාල මුදලක් වැය කරන්න සිද්ධ වෙලා තියෙනවා. ඉනෝකා මන්ත්‍රීතුමිය කිව්ව අප්‍රේල් වෙනකොට ආහාර හිගයක් ඇති වෙනවා කියලා. නමුත් ඉදිරියේ උත්සව කාලයක් තියෙන්නෙ ඕනවටත් වඩා ආහාර ලැබේවි කියලා ප්‍රකාශ කරමින් මම නිහඬ වෙනවා බොහොම ස්තූතියි.

**ගරු මන්ත්‍රිනී ගයන්ති කුමාරි මහත්මිය**

ගරු සභාපතිතුමනි, සභාවේ පොල් කැඩුවද? විකුණුවද? ආදායමක් දැක්කේ නැති නිසා තමයි මම ඔබතුමාගෙන් ඇහුවේ. ඒවගේම ගැස් ප්‍රශ්නය ගැන ජයවීර මන්ත්‍රීතුමා කතා කරන විට අදාළ නැහැ කිව්වා.

**ගරු සභාපතිතුමා පිළිතුරු දෙමින්**

පොල් කැඩුවා. විකුණා ආදායමක් සභාවට දුන්නා. දස දහස් ගානක් ඇති. ලොකු පොල් රුපියල් 60යි. පොඩි පොල් 40 යි ගානේ කවලමේ රු. 50 ගානෙත් පොල් විකුණුවා.

ඒ වගේම, මන්ත්‍රීතුමිය මම අදාල නෑ කියලා නෙවෙයි කිව්වෙ. මම කිව්වේ ඔය කතන්දර අද පොඩි ළමයෙකුගේ ඉඳන් හැමෝම දන්නවා. එවැනි කරුණු සම්බන්ධයෙන් කතා කරලා, නිකරුණේ කාලය නාස්ති කරන්න එපා.

**ගරු මන්ත්‍රිනී ගයන්ති කුමාරි මහත්මිය**

අපි ඊයෙ මාධ්‍යයෙන් දැක්කා. අවුරුදු 18 -19 ළමයෙක් උඩ තට්ටුවේ ඉඳල පහලට පනිනවා. ගෑස් එක පුපුරනකොට කොච්චර බියකින් ඉන්න ඇත්තේ. මමත් බියෙන් ඉන්නේ. මගේ නිවස තුළත් කොයිවෙලෙත් ගෑස් ටැංකි දෙකක් දැල්වෙනවා. ඒ වගේම කාන්තා අමාත්‍යාංශයක් නැති එක ප්‍රශ්නයක් වෙලා තියෙනවා. මොකද මෙම ගෑස් පිපිරීමෙන් කාන්තාවන් දෙදෙනෙක් නැති වෙලා තියෙනවා. ඒ සම්බන්ධව මා මේ අවස්ථාවේ ශෝකය ප්‍රකාශ කරනවා. මේ සම්බන්ධව, අමාත්‍යාංශයෙන් කිසිම කතාවක් නැහැ. අපි ඒ ගැන කණගාටු වෙනවා. මේ ආණ්ඩුව නිසා ඇත්තටම මිනිස්සු හරිම අසරණ වෙලා ඉන්නේ. මම හිතනවා ඔබතුමාලා මේ සම්බන්ධයෙන් දැනුවත් වෙලා, ඉහළට කතා කරලා, යම් සහනයක් මිනිසුන් වෙනුවෙන් දෙනව නම් හොඳයි කියලා. ස්තුතියි.

**ගරු මන්ත්‍රී ධර්මසිරි ගනේවත්ත මහතා**

සියලුම මන්ත්‍රීවරුන්ගෙන් අවසරයි. ගරු සභාපතිතුමනි, අද දවසේ අපට අමතක වෙලා යන රණවිරුවා ගැන. වසර 30 යුද්ධය කාලය තුළ, එක් සමයක දරුණුවටම යුද්ධය තිබුණා. කෙසේ වෙතත් නායකත්වයක් නැති ව රට කොයි පැත්තට දෝලනය වෙනවාද? එල්.ටී.ටී.ඊ එකට දෙනවාද? සිංහල හමුදාව ජයග්‍රහණය කරනවා ද යන්න තීරණාත්මක මොහොතක හිටියෙ. 1996 ජුනි 18 මුලතිව් යුද හමුදා කඳවුරට දැවැන්ත ප්‍රහාරයක් එල්ල වුණා. ඒක ශ්‍රී ලංකා යුද හමුදාවට මර්දනය කරගන්න බැරි වුණා. ඒ නිසා එක් දහස් හාරසිය ගණනකට ජීවිත අහිමිවුණා. එම කාලයේ පැවති දේශපාලන නායකත්වයන් දුර්වලතාවය නිසා තමයි එතරම් සංඛ්‍යාවක් ජීවිතක්ෂයට පත්වුණේ. එම කඳවුරක ජීවිතය බේරාගත් සෙබළකු ගැන ලියවුණු පොතක් "මරණය මැදින් මුලතිව් සිට" යන කෘතිය. මෙම රණවිරුවා අපේ ප්‍රදේශයේ මගේ ඥාතියෙක්. ඩබ්.එල් ගුණරත්න කියලා. මෙහි කර්තෘ මේජර් සුජත් චමින්ද එදිරිසිංහ කියන පුද්ගලයෙක්. මෙම පොත් දෙක නාගොඩ සහ මාපලගම පුස්තකාල 2 ක පරිත්‍යාග කරනවා. අනෙකුත් පුස්තකාල සඳහා මෙම පොත මිලට ගන්නා ලෙස ඉල්ලා සිටිනවා. පොතේ මිල රුපියල් 950.00 යි.

ඒ වගේම තරංග මන්ත්‍රීතුමා කතා කලා. වතුකරයේ ජනතාවට සිදු වන අසාධාරණය ගැන. පහුගිය දවසක අප ප්‍රදේශයේ ඇළ මාර්ගයක, තනිකර කළු පාටින් වතුර යනවා කියලා මට දැනගන්න ලැබුණා. මම ගිහිල්ලා බැලුවා. පසුව මම එම වතු අධිකාරීතුමාට කතා කරලා කිව්වත්, එතුමා පිළිගත්තේ නැහැ. පසුව මම සභාපතිතුමාට කතා කළත් දුරකථනයෙන් සම්බන්ධ කර ගැනීමට නොහැකි වුනා. පසුව මම මහජන සෞඛ්‍ය පරීක්ෂකතුමන්වත්, ප්‍රාදේශීය ලේකම්තුමන්වත් මේ සම්බන්ධයෙන් දැනුවත් කළා. එයාලගේ උපදෙස් මත වතුර සාම්පල් එකක් අරන් තියලා තිබුණා. නමුත් අධික වර්ෂාව ආපු නිසා, පොලීසියට, අපට සහ අනෙකුත් නිලධාරීන්ට මේ සිද්ධිය ඔප්පු කරන්න බැරි වුණා. ඒ නිසා පරීක්ෂණයෙන් බැහැර වුණා. ඊට පසුව දිනත් මහජන සෞඛ්‍ය පරීක්ෂකතුමා, නිලධාරීන් හතර දෙනෙක් සහ වෛද්‍යතුමන් ඒ කටයුතු නිරීක්ෂණය කරලා, ෆොටෝ ගහගෙන ගියා. ඒ අනුව ප්‍රාදේශීය ලේකම්තුමා දැනුවත් කරලා, සියලු දෙනා එකතු වෙලා, කමිටුවත් තියලා මෙයට යම් විසඳුමක් දෙන්න ඕන කියලා තීරණය කලා. නැවත දවසක් මම දැක්කා. මේ අපද්‍රව්‍ය වලවල් වලට පම්ප් කරනවා. ප්‍රාදේශීය ලේකම්තුමා ට කතා කළා. එතුමාගේ උපදෙස් පරිදි, ගම්වාසීන් සමඟ එකතු වී බවුසරය අල්ලගන්න කිව්වා. මම කෙසේ හෝ ඒ බවුසරය අත්අඩංගුවට පත් කළා. ගරු සභාපතිතුමනි එතනින් ඒ දේ නැවතුනා. මේ සම්බන්ධව කිසිදු තොරතුරක් නැහැ. කෙසේ වෙතත් වත්ත නිලධාරීන් අල්ලසට ගන්නවද කියලා අපි දන්නේ නැහැ. මොන දේකින් හරි යටපත් වෙනවා. එවිට වත්ත තමයි ප්‍රබල වෙන්නේ. වලවල් වලට නිකන් කොන්ක්‍රීට් ලෑලි තියලා තියෙන්නෙ. අපි එය නිරීක්ෂණයට යනවිට, එක් ගම්වැසියෙක් කොන්ක්‍රීට් වලට තිබූ ලෑල්ලට අඩිය තැබූ විට, වල ඇතුලට ගියා. නිසි ක්‍රමවේදයකවත්, ආරක්ෂිතවත් එම කුණු වල් හදලා නැහැ. ගම්වාසීන්ගේ හා සත්වයින්ගේ ජීවිත අනතුරේ. මේ වලවල් වල හරක් හතර දෙනෙකුත් වැටිලා ගොඩ

ගත්ත කියලා ආරංචි වුණා. සභාපතිතුමනි, මම කිව්වා මෙම අපද්‍රව්‍ය වලවල් වටා ආරක්ෂිත වැටක් ගහන්න කියලා. නමුත් අද වෙනකම් කිසිම දෙයක් වෙලා නැහැ. ඔබතුමාටත් කිව්වා. ඔබතුමත් මේ වෙනකන් කිසි පියවරක් ගත්තේ නැහැ. එදා අල්ලලා දීපු බවුසරයට මොකද කළේ. ඔය ගව මුත්‍රා විතරක් නෙවෙයි. කිසිම දේකට අද වෙනකන් ක්‍රියාමාර්ගයක් අරගෙන නැහැ. අප ප්‍රදේශයේ කුඹුරු වලට වතුර ගන්න ජල පෝෂිතය තමයි කැකුණුදොළ. මෙම ජල පෝෂිතය අපවිත්‍ර නොවීමට මෙතරම් උත්සහ කලත්, ඊට ප්‍රතිඵලයක් ලැබුණේ නැහැ. මහජන නියෝජිතයෙක් ලෙස වත් ඔබතුමා මේ සඳහා මැදිහත් වෙලා කටයුතු කරන්න කියලා ඉල්ලා සිටිනවා.

ඒ වගේම තමයි. මේ සභාවේ කාලය කළමනාකරණය කරලා දෙන්න. තවත් කරුණක් තමයි. ගරු පාර්ලිමේන්තු මන්ත්‍රී සම්පත් අතුකෝරල මැතිතුමා අපේ ගම් ප්‍රදේශයට පුදුමාකාර සංවර්ධනයක් කරලා තියෙන්නේ. ජල යෝජනා ක්‍රම දෙකක් මේ වන විට පරණතානායම්ගොඩට ලබා දීලා තියෙනවා. කිලෝමීටර 13ක කාපට් මාර්ග පරණතානායම්ගොඩට ලබා දීලා තියෙනවා. මේ සියලුම දේට නායකත්වය දැක්වුවේ එතුමා තමයි. ඒ වගේම මෙම සංවර්ධනය පිළිබඳ සතුටු වෙමින්, මට සවන් දුන් සියලු දෙනාට ස්තුතිවන්ත වෙමින්, මම නිහඬ වෙනවා. ස්තුතියි.

**ගරු මන්ත්‍රී අමර ධනංජය විලේගේ මහතා**

ගරු සභාපතිතුමා ඇතුළු සියළු දෙනාගෙන් අවසරයි. පළමුවෙන්ම කියන්න ඕන. ගරු සභාපතිතුමනි, ඔබතුමා ඉදිරිපත් කළ අයවැය, ජයග්‍රහණය කිරීම සම්බන්ධයෙන් සුභ ප්‍රාර්ථනා කරනවා. නමුත් ගරු සභාපතිතුමනි, පක්ෂයක් ගැන හිතලා තමයි අපි ඡන්දය දුන්නේ. නැතුව ඔබතුමාගේ අයවැය ගැනවත්, මෙපමණ කාලයකට ඔබතුමාගේ ක්‍රියාත්මක වීම ගැනවත් 100% ක් පැහැදීමකින් නෙවෙයි. ප්‍රාදේශීය සභාවෙදි 80%ක් ඔබතුමාගෙන් ඒ දේ ඉටු වෙන්නෙ නැහැ. නමුත් ප්‍රාදේශීය සභාවෙන් ජනතාවට මීට වඩා සේවාවක් විය යුතුයි කියන තැන අපි ඉන්නවා. අපේ පොහොට්ටුවේ මන්ත්‍රීවරුන්ගේ මතය ඒක. නිසැකයි. කණ්ඩායමක් ලෙස අපට එකට ඉන්න ඕන නිසා තීරණ ගත්තට අසීරු තත්වයක දැන් ඉන්නේ. කිසිම ආණ්ඩුවකට, කිසිම ජනාධිපතිවරයෙකුට මුහුණදෙන්න නොවූ තත්ත්වයක් තියෙන්නේ. ලෝක අර්බුදයකට මුහුණ දෙන්න ඉන්න වෙලාවක, අපට ඒ වෙනුවෙන් පෙනී සිටින්න සිදුවෙනවා. අපට මේ තනතුරු වලින් කිසි දෙයක් රකින්න නැහැ. අපි බැඳිලා ඉන්නේ ජනතාවට පමණයි. අද විජිතාරාම විහාරස්ථානයේ කොවිඩ් තුන්වැනි එන්නත ලබා දෙනවා. අපි කොවිඩ් එක්ක දැඩි පීඩනයකින් හිටියේ. අනෙක් රටවල් එක්ක ගත්තම අපි සෑහෙන දුරට කොවිඩ් මර්දනය කරලා තියෙන්නේ. ආර්ථික ප්‍රශ්න ගත්තම, ලෝකයේ තෙල් ප්‍රශ්නය, ආහාර අර්බුදය ලෝකෙත් එක්ක එකට යද්දී, සංචාරක ව්‍යාපාර, ඇඟලුම් ව්‍යාපාර ඇතුළු සියල්ල නිෂ්පාදන කඩන් වැටිලා, විදේශ ආයෝජන නැහැ. විදේශිකයෝ එන්නෙ නැහැ. රෙදිපිළි නිෂ්පාදනය වෙන්නේ නැහැ. ණය වාරික වලට මුහුණ දෙමින් අපි ඉදිරියට යමින් ඉන්නවා. මන්ත්‍රීතුමියක් කතා කළා. ඛනිජ තෙල් ප්‍රශ්නය පිළිබඳ.ව මීට වඩා බලපෑවේ ගෑස් පුද්ගලීකරණය කරපු නිසා, ලංකා ඛනිජ තෙල් සංස්ථාව 49% ක් පුද්ගලික අංශයට තියෙනවා. මුදල් නැතිවුනාම පුද්ගලික අංශයට තෙල් ගෙන්නන්න භාර දෙනවා. එහෙම වුනහම තමයි මෙවන් ප්‍රශ්න ඇතිවෙන්නෙ. නමුත් ලෝකයේ බොරතෙල් මිල සහ ගෑස් මිල පහුගිය දිනවල තමයි ඉහළ අගයක් වාර්තා වීම ශ්‍රී ලංකාවටත් බලපෑවා. මෙය පාලනය කරගෙන යමින් ක්‍රමවේදයකට රට සකස් කරගෙන යමින් පවතිනවා. මේ පටන් ගත්තා විතරයි. ආණ්ඩුව මාස හතරක් විතර තමයි සම්පූරණයෙන් මිදිලා කරගෙන යන්නේ. ලබන අවුරුද්දේ අයවැයෙන් ග්‍රාම නිලධාරී වසමකට මුදලක් වෙන් වෙනවා. ජනතා ජීවනෝපායට. සංවර්ධනයට, මන්ත්‍රී කෙනෙකුට ලක්ෂ හතළිහක් ලැබෙනවා. ඒවත් වෙන් කරන්නේ ජීවනෝපාය සංවර්ධනයට. මෙම ප්‍රශ්න විසඳන විට, මේ රටේ මිනිස්සුන්ගේ ආර්ථිකය ශක්තිමත් කරන වැඩපිළිවෙළක් කරනවා. මම හිතන්නේ නැහැ. ඔය කියන මැසිවිලි කාටවත් නගන්න පුළුවන් වෙයි කියලා. ඉදිරි වර්ෂය නිදුක්, නිරෝගී සුබ වාසනාවන්ත වසරක් වේවායි ප්‍රාර්ථනා කරමින්, මම නිහඬ වෙනවා.

**ගරු මන්ත්‍රී වසන්ත කුමාරගේ මහතා**

ගරු සභාපතිතුමා ඇතුළු සමස්ත සභාවෙන් අවසරයි. ඔබතුමාගේ හතර වැනි අයවැය මේ යන්නේ. ඔබතුමා අවුරුදු හතරක් මේ සභාවේ හිටියා. මුල ඉඳලම මා සඳහන් කළා. නාගොඩට පෙර පාසලක් අවශ්‍ය බව. ඔබතුමාට නොහැකියාව නිසාදෝ, තාමත් ඒ දේ කරගන්න බැරිවෙලා තියෙනවා. ඔබතුමාගේ කාලය තුළ නාගොඩටත් යමක් කරන්න ඕන. ස්ථානයක් නැතිවුණා කියලා පරක්කු කරන්න හොඳ නැහැ. අපි බද්දට ඉන්න ඕන නැහැ. දැන් සෞභාග්‍යයේ දැක්ම පිරිලා, ඉතිරිලා යන මොහොත. සියලු දෙවල්වල මිල ඉහළ ගිහිල්ලා. මිනිසුන්ට ජීවන බර දරාගන්න බැහැ. මේක අභාග්‍යයේ දැක්ම. සියලු රාජ්‍ය සේවකයෝ පාරට බැහැලා. නාගොඩ, මාපලගම ගොවිජන සේවා ආයතනයේ, පොහොර වංචාවක් වෙලා කියලා, පහුගිය දවස්වල කතාවක් තිබුණා. රාජ්‍ය දේපළ පොහොට්ටුවේ හෙන්වයියලා ගසා කනවා. මේක තමයි ඉහල සිට පහලට යන්නේ. මේ සභාවේත් බිල් සම්බන්ධව වංචනික තැන් තියෙනවා. ඒවා ඔප්පු කරල පෙන්නනන්නම්. ආදාහනාගාරයේ ගල ඉවත් කිරීම සඳහා මේ වන විට රුපියල් 70000.00 ක් වැය වෙලා. මේ සභාවේ වන අයථා මුදල් ගණුදෙනු වලට ඔබතුමාලා අත උස්සලා ඡන්දය දුන්නා. ඒත් අපි විරුද්ද වෙනවා. මාපලගම පිට්ටනියෙ, ළමා උද්‍යානය ඉදිකිරීම සම්බන්ධයෙන්, සතුටු වෙනවා.

**ගරු මන්ත්‍රී චන්ද්‍ර සහබන්දු මහතා**

ගරු සභාපතිතුමා ඇතුළු මන්ත්‍රීවරුණි, මම ගිය සභාවේදී, කොම්පෝස්ට් පොහොර සම්බන්ධව වාර්තාව ඉදිරිපත් කරන්න කියලා ඉල්ලීමක් කළා. නමුත් මාසයක් යද්දී නිලධාරීන්ට එක අමතක වෙලාද කොහෙද ඉදිරිපත් කරන්න.

**ගරු සභාපතිතුමා පිළිතුරු දෙමින්**

ගරු මන්ත්‍රීතුමනි, ඒ වාර්තාව සකස් කරලා. නමුත් ඒ විෂයභාර නිලධාරීතුමියගේ තාත්තා නැතිවෙලා. එනිසා අද එතුමිය නැහැ.

**ගරු මන්ත්‍රී චන්ද්‍ර සහබන්දු මහතා**

නාගොඩ ප්‍රාදේශීය සභාවට ආදායමක් වශයෙන් දර කොපමණ ප්‍රමාණයක් විකුණුවද? කුණු කොපමන ප්‍රමාණයක් එකතු කරනවද? එහි අලෙවිය නිෂ්පාදනය මෙතන වාර්තා වෙන්න ඕන. දිනක නිශ්පාදනය, දිනක වියදම-ආදායම, මේ පොත් අරගෙන බැලුවම, බොහොම ලස්සනට, සරලව කරන්න හැකියාව තියෙන්න ඕන. සභාපතිතුමා දොස් අහන්නේ ඔය තැන්වලදී. මම අසාධාරණ ඉල්ලීමක් ඉල්ලුවේ නැහැ. සේවකයෝ දහයක් දොළහක් ඉන්නවා. කුණු එන්නේ සොච්චමලු. අලෙවිය පිළිබඳ වාර්තාවක් ඉදිරිපත් කරලා නැහැ. සමහර විට පොදු ගිණුම යටතේ ආදායම් වියදම් පෙන්නලා ඇති. නමුත් මේ ගිය අය- වැය සම්බන්ධයෙන්, තමුන්නාන්සේට කිව්වා. කොම්පෝස්ට් එකට වියදම් කළා හෝ නොකළා හෝ අනිවාර්යෙන් සභාවේ නිලධාරීන් දැනුවත් කරන්න.

අයවැය පිළිබඳව මම කතා කරන්නෙම නැහැ. අවුරුදු හතරක් තමුන්නාන්සෙත් එක්ක, පාර්ලිමේන්තුවටත් ආදර්ශයක් වන පරිදි සභාව පවත්වන්න හැකිවීම පිළිබඳව පුංචි ආඩම්බරයක් අපට තියෙනවා. විපක්ෂය හැටියට අපි ගෞරවනීය සභාවක් කළේ කියලා තමුන්නාන්සේලා සාක්ෂි දරනවා. අද පාර්ලිමේන්තුවෙත් ඔය තත්වෙ නැහැ. ඔබතුමා අවුරුදු හතරක් සභාවේ හිටියා නමුත් ඔබතුමාව අපහාසුතාවයට පත් කළේ නැහැ. නමුත් සෑහීමකට පත්වෙන්නේ නැහැ. අපට වෙච්ච දෙයක් නැහැ. මම අද සතුටු වෙනවා. ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ කණ්ඩායම හොඳ තීරණයක් ගත්තා.

අවුරුදු හතරක් තිස්සේ අපි අත උස්සලා යනවා. ඔවුන්ට තේරිලා. එහෙමනම් අපි අත උස්සන එකේ තේරුමක් නැහැ. අද ජනතාවත් එක්ක අත ඉස්සුවේ.

ඒ වගේම පහුගිය දවසක නාගොඩ ඉඳලා මම මාපලගම දෙසට ගමන් කරද්දී, මගේ වාහනය මම බේරගත්තේ යන්තමින්. මොකද. සභාපතිතුමනි, අත්‍යවශ්‍ය යෝජනාවක් හැටියට මම දකිනවා. නාගොඩ මංසන්ධියේ වෙනදා බැරල් එකක් තියලා තිබුණා. ඒකත් හොඳ රවුන්දබෝඩ් එකක් වුණා. ඒ නිසා අනතුරු වළක්වා ගන්න නම්, සභාපතිතුමනි, එම ස්ථානයට පොඩි රවුන්ද බෝඩ් එකක් හරි හදන්න.

ආදාහනාගාරය හදන එක හොඳයි නමුත් ප්‍රවිශ්ය වන මාර්ගය JCB එකක් දාලා කළා නම්, ඔය තරම් කාලයක් සහ වියදමක් නොයන්න තිබුණා. මට දින දාහතරක් දුන්න නම් මට කිසිම නිලධාරියෙක් ඕනෙ නැහැ. මගෙ දායකත්වයෙන්, මම කරල දෙනවා. රුපියල් හැත්ත දාහක් වියදම් කරලා තියෙනවා. ඔබතුමාලා අත ඉස්සුවා. නමුත් මේ යන වියදම් මේ විදිහට කරන්න ගියොත්, එය අයථා පාලනයක්. මෙච්චර ශක්තිමත්ව මේ ගමන යන්න තියෙද්දි, අද අපරාදේ JCB යන්ත්‍රයක් වැඩ කරනවා. වෙන තැන්වලත් වැඩ කියලා ආරංචි වුණා. ඒක හිටිහැටියේ තියෙනවා. හිටිහැටියේ නැහැ. කොහාට යනවද මම දන්නේ නැහැ. මොන නිලධාරිය ද එම JCB යන්ත්‍රය පිටත්වන වෙලාව, අවසන් වෙන වෙලාව, එම පැය ගණන දන්නෙ. රියදුරු මහත්තයම කොලේ ගෙනැල්ලා දෙනවා. මේවා නිලධාරීන්ට සත්‍ය තොරතුරු. මම නිලධාරීන් පාවාදෙන්නෙ නැහැ. හරි කියලා එම අවස්ථාවේම චෙක් එක ලියලා දෙනවා. අන්න ඒ නිසයි අපි මේ විරුද්ධ වෙන්නේ. ඇප්තොප් එකෙත් ඒ වගේ වැඩලු සිදුවෙන්නේ. මම නම් දන්නෙ නැහැ. ගිය සැරෙත් තුන් හාර ලක්ෂයක් ඒකට ගෙව්වා.

**ගරු සභාපතිතුමා විසින් පිළිතුරු දෙමින්**

ඇප්තොප් වත්තේ අක්කර 02 ක කුරුඳු වගාවට දෙලක්ෂ පන්දාහක් අනුමත වෙලා තියෙනවා. එහි බිම සකස් කිරීමට ස්කැවේටර් යන්ත්‍රය යොදවා තිබෙනවා.නිළධාරී අධීක්ෂණය යටතේ ,

**ගරු මන්ත්‍රී චන්ද්‍ර සහබන්දු මහතා**

ඒ වගේම ගෑස් පුපුරනවා. දියර පොහොර පුපුරනවා. මේ රටට මොන ශාපයක්ද වැදුනේ. ගෝඨාභය මහත්තයාගේ එක හොඳක් තියෙනවා. පාතාලයට නම් හොඳ ගේමක් දුන්නා. ඒ සඳහා පමණයි අපි එතුමාගේ හොඳ දකින්නේ. දළු නැහැ. කිරිපිටි නැහැ. ජීවන වියදම දරන්න බැරි තරමට. බංකොලොත් රාජ්‍යයක් බවට රට පරිවර්තනය කළොත්, රටම අනතුරේ. වෙනසකට යන්න ඕන. එහි එකම නායකත්වය රනිල් වික්‍රමසිංහ විතරයි. අපි කවුරු ආවත් තමුන්නාන්සේලාට වෙනස පෙන්වනවා. උගන්ඩාවේ ගුවන්තොටුපල වීනය අත්පත් කරගත්තා. අපේ හම්බන්තොටත් අත්පත් කරගන්න වැඩි දවසක් නැහැ.

ඒ වගේම අපි සභාවේ එන යෝජනාවලදී, අත උස්සන්න පුළුවන් දේවල් වල දී එකට හිට ගන්නවා. මේක ආදර්ශමත් සභාවක්. එහෙමනම් , ලබන්නාවූ නව වසර දුර්භික්ෂයෙන් මිදිලා, ස්වයංපෝෂිත, වාසනාවන්ත නව වසරක් වේවා කියා ප්‍රාර්ථනා කරමින්, මම නිහඬ වෙනවා. ස්තුතියි.

**ගරු මන්ත්‍රී එන්.වී.පතිනායක මහතා**

ගරු සභාපතිතුමනි, මට ලිඛිත යෝජනාවක් කරන්න බැරි නිසා, මම මේ වෙලාවේ මේ ගැන කතා කරනවා. ඌරල ළිඳ ගැන. ඒ වැඩේ කෙරෙන්නෙත් නැති නිසා, මම ප්‍රජා ජල ව්‍යාපෘතියක්,

කොතේගොඩ කන්ද ඌරල මිදැල්ල පොදු නාන ළිඳ භාවිතයට නොගන්නා නිසා, තිබෙන ස්ථානයේම නාන ලිඳක් ඉදිකර, මෙම නාන ළිඳ පවුල් 130 පමණ පිරිසකට භාවිතයට ගන්න පුළුවන්. තාක්ෂණ නිලධාරී මහත්වරු පරික්ෂා කරන්න ආවා. ලබන සභා වාරය වන විට ලිඛිත ඉල්ලීමක් කරන්නම්. ඔබතුමාගේ සභාවේ අවසරය ලබාදෙන්න. ඌරල පොදු නාන ලිඳත් ප්‍රතිසංස්කරණය කරලා දෙන්න.

**ගරු මන්ත්‍රී ලක්රුවන් සම්පත් මහතා**

සියලුම දෙනාගෙන් අවසරයි. මම හිතන්නේ මේ වෙලාවේ කාල වේලාව ඉක්මව ගියත්, ඉනෝකා මන්ත්‍රීතුමිය, ප්‍රියන්තා මන්ත්‍රීතුමිය යන දෙදෙනා කතා කළා වගේ, උඩවැලිවිටිය පාලම ඉතා විශාල පිරිසක් ගමන් කරන පාලමක්. මහා මාර්ග අමාත්‍යාංශයෙන් එම ස්ථානයට එවලා, විශේෂයෙන්ම මා නියෝජනය කරන බල ප්‍රදේශය සහ නාගොඩ ප්‍රදේශය සම්බන්ධ කරන ප්‍රධාන පාලමක් මෙය. නාගොඩ හැම ඉදිකිරීමකටම ප්‍රථම මෙම පාලම තමයි සියළු දෙනාගේ අවශ්‍යතාවය. මේ වන විට මෙම පාලම ඉතාම අබලන්. මේ වන විට මෙම පාලම ඉතාම අවධානම්. මේ පිළිබඳව මෙම සභාවේ මෙන්ම, ඉහළ දේශපාලන අධිකාරිය දැනුවත් කොට තියෙන්නෙ. ඒ අනුව මහා මාර්ග අමාත්‍යාංශය මෙන්ම, කුඩා පාලම් ව්‍යාපෘතිය මගින් මෙම ස්ථානය පරික්ෂා කර මේ වන විට ඇස්තමේන්තු සකස් කර ගෙන යනවා. දැනට මෙම පාලම අනාරක්ෂිත නිසා විකල්ප මාර්ගයක් හැටියට ගඟ අද්දර සිට නාගොඩ දක්වා ඇති මාර්ගය සංවර්ධනය කර දෙන බව ආර්.ඩී.ඒ ඉංජිනේරුතුමා පවසා තිබෙන බව සභාපතිතුමා මා සමඟ ප්‍රකාශ කර සිටියා.

**ගරු මන්ත්‍රී අජිත් එඩේරආරච්චි මහතා**

ගරු සභාපතිතුමා, උප සභාපතිතුමා ඇතුළු සමස්ත සභාවෙන් අවසරයි. කිව යුතු කාරණා රැසක්, අද පක්ෂ, විපක්ෂ මන්ත්‍රීවරුන් කතාකරපු කතාවලින් කියවුනා. ඒ වගේම අද අයවැයෙන් ඔබතුමාට ජයග්‍රණනය කරන්න හැකිවීම පිළිබඳව අපි සතුට පළ කරනවා. ඒ වගේම අපි අයවැයට විරුද්ධ වුණ කාරණය පැහැදිලිවම ප්‍රකාශ කරන්න කැමතියි. අපට ඔබතුමාට මේ මාස කිහිපයකට හෝ අවුරුද්දකට පරාජය කරලා, වෙන කෙනෙක්ව මේ පුටුවට ගේන්න කිසිම අවශ්‍යතාවයක් ඇතිව නෙමෙයි ඡන්දය ප්‍රකාශ කළේ. අනෙක් මන්ත්‍රීවරු දුරකථනයෙන් දන්වලා ගෙන්ව ගත්තේ. අපට අවශ්‍යතාවය තිබුණේ විරෝධතාවයක් දක්වන්න. ඒකට හොඳම අවස්ථාව මේක. නමුත් ඔබ අපට හොඳ මිත්‍රයෙක්. නමුත් දේශපාලනයේදී නෙමෙයි. මෙතන සඳහන් වුණා බද්දේගම ප්‍රාදේශීය සභාවේ තිස් හතර දෙනාම අයවැයට පක්ෂව ඡන්දය ප්‍රකාශ කරන්න ඉදිරිපත් වුණා කියලා. ගැටලුව තමයි. ඒ සභාවේ හැම පක්ෂයම මන්ත්‍රීවරු ඇයි එහෙම කළේ. ඡන්දය ගන්න අවශ්‍ය නිසා නෙමෙයි. හැම අවුරුද්දකම යම් මුදලක්, ලක්ෂ 03ක් හා වීථි ලාම්පු පහක් සියළුම මන්ත්‍රීවරුන්ට ලබාදුන්නා. එතනදි, පාට, පක්ෂ නොබලා, හැම දෙනාටම එක වගේ දුන්න නිසා, ගාලු මහ නගර සභාවේ, උප සභාපති එක්සත් ජාතික පක්ෂයේ. සභාපති පොහොට්ටුවෙන්. ඒ නිසා එකට කරගෙන යනවා. අපට බෙදන්න, නැහැ කියනවා. පිට කොන්දක් නැති පක්ෂයක් එක්ක ඉන්න එක ගැන අපි ලැජ්ජ වෙනවා. අපේ සභාපතිතුමාට විරුද්ධව නෙමෙයි ඡන්දය ප්‍රකාශ නොකලේ. අපිට යමක් නොලැබෙනවා නම්, අපේ ප්‍රදේශයේ ජනතාවට යමක් කලේ නැත්නම්, වීථි ලාම්පුවක්වත් දීලා නැත්නම්, විරෝධතාවයක් පළ කළ යුතුයි. එනිසා හැමදාම විරෝධතා පළ කරනවා. කිසිම දෙයක් කරලා නැහැ කියලා බනිනවා. අපි විරෝධතාවයක්වත් පළකරලා තියෙයි කියලා කියාවි. ඒ නිසා විරුද්ධත්වය ප්‍රකාශ කරන්න, සදාචාරාත්මක අයිතියක් තියෙනවා.

රටතුල අර්බුදයක් තියෙනවා. කෙසේ හෝ රට අර්බුදයෙන් ගලවා ගෙන, රටක්, ශ්‍රී ලාංකිකයෝ හැටියට, මේ රටට යථා තත්ත්වයට පත් කරන්න වාසනාව ලැබෙන්න කියලා. රජයට ධෛර්යය, ශක්තිය ලැබෙන්න කියලා ප්‍රාර්ථනා කරනවා. ලංකාව ගොඩක් දරුණු තැනක තියෙන්නේ. අපි මේවට හිනා වෙලා වැඩක් නැහැ. ඇත්තටම වෙන්න ඕන. රට මේ උග්‍ර ප්‍රශ්නයෙන් ගොඩ ගන්න එක.

සභාවේ තත්ත්වය සතුටුදායක ලෙස පවත්වාගෙන යන්න. ගමට මීට වඩා යමක් කරන්න ශක්තිය ලැබෙන්න කියලා ප්‍රාර්ථනා කරනවා. මේ ඔබේ, මගේ ගම. ඔබට ගමට මීට වඩා යමක් කරන්න ශක්තිය ලබෙන්න කියලා ප්‍රාර්ථනා කරනවා. ඔබතුමාලා පරිත්‍යාගශීලී පවුලක්. විලේගේ මන්ත්‍රීතුමාගේ ස්වාධීන අදහස් පිළිබඳ ගරු කරනවා. පක්ෂය ගැන හිතලා, ඡන්දය දෙනවා කියලා. සමහර සභාවල ඉන්ධන දීමනාව දීලා තියෙනවා. අනික් සභාවල මුදල් නෑ කියලා දීලා නැහැ. ඒ පිළිබඳව සතුටු වෙනවා. ඒ වගේම අපේ සියලු සභාපතිවරුන්ට සිහිනයක් තිබුණා. ආදාහනාගාරයක් හදන්න. නමුත් ඒ දේ බැරි වුණා. ඔබතුමා ඒ දේ කළා. අද යම් යම් අඩුපාඩු ගැන කතා කරනවා. පාරත්, ගලක් ගැනත් කතා කළා. ඒ සියල්ල ගැන කතා කරන්නෙත් ඔබතුමා ඒ දේ කළ නිසා. ඒ වගේම සභාපතිතුමනි, අපට අවුරුදු 30 ක් ඉදලත් හොඳ ප්‍රාදේශීය සභා ගොඩනැගිල්ලක් හදා ගන්න බැරිවෙලා තියෙනවා. සියලු පහසුකම් සහිතව, ඔබතුමාට පුළුවන් නම්, ඒ දේට අඩිතාලමවත් දමා යන්න ශක්තිය ලැබෙන්න කියලා ප්‍රාර්ථනා කරනවා.

ඒ වගේම ආණ්ඩුවට මේ අවස්ථාවේ කෘෂිකර්මයට බර දාන්න ඕන අවස්ථාවක, කෘෂිකර්මය නැති වෙන්න වැඩ කරලා, ඩොලරයේ හා ඒ වැඩපිළිවෙළ බ්ලොක් කරගෙන ඉන්නැතිව, ලෝක ආහාර අර්බුදයට ලෝකය පත්වෙච්ච අවස්ථාවක, අපේ කෘෂිකර්මය විනාශ වෙලා. එහෙම වෙන්න නොදී, මොනවා හරි පොහොරක් දීලා, කෘෂිකර්මාන්තය නගා සිටුවලා, කොවිඩ් අඩු වීමත් සමග, මේ කාබනික පොහොර තත්වයට යමු කියලා, ඔබතුමාලගේ ඉහළ බලධාරීන් දැනුවත් කිරීමට උත්සාහ ගන්න. ගරු සභාපතිතුමනි, ඒ වගේම ඔබතුමාට ඉදිරි වර්ෂය මේ සභාව ඉතා හොඳින් කරගෙන යාමට හැකියාව ලැබේවා. ඒ වගේම නිලධාරීන්ටත් ඒ කටයුතු කරගෙන යාමට හැකියාව, ධෛර්යය, ශක්තිය ලැබේවා. සුභ අලුත් අවුරුද්දකට ආශිර්වාද පතමින්, මම නිහඬ වෙනවා.

**ගරු උප සභාපති එම්.ක්.ගාමිණී සුසන්ත මහතා**

ගරු සභාපතිතුමා ඇතුළු සමස්ත සභාවෙන් අවසරයි. අද මාතෘකාව අයවැය සම්මත කරන දිනය. නමුත් අයවැය ඡන්දයකට ගිහිල්ලත්, අපි බෙදිලා, වෙන් වෙලා නැහැ. ඒ බව මේ කතා වලින් තේරුනා. අද අයවැය සම්මත වුණා. අදහස් හා යෝජනා තමයි අද සලකුණු ලකුණු වශයෙන් යෝජනා වුණේ. අපට කිසිදු බලපෑමක් නැහැ. ස්වාධීනව තීන්දු තීරණ ගන්න අවස්ථාව ලැබිලා තියෙනවා. අපේ මන්ත්‍රීවරු කිව්ව වගේ, රටේ අර්බුදයක් පවතිනවා. අපි ගම් මට්ටමේ, බිම් මට්ටමේ නායකයෝ හැටියට, අපි අපේ ආණ්ඩු පක්ෂයේ ප්‍රබල මන්ත්‍රීවරුන්ට, ඇමතිවරුන්ට කතා කරලා තියෙනවා. මේ වගේ පවත්වාගෙන යන්න බැහැ කියලා. අජිත් මහතා, සහබන්දු මහතා ප්‍රකාශ කලා වගේ, අපිත් මේවට විසඳුම් සොයන්න ඕන. අපේ දේශපාලන නායකත්වය නම් කියලා තියෙන්නේ. තව මාස කිහිපයකින් 2022 රජයේ වැඩපිළිවෙළ බැලුවම පේනවා. ගම් මට්ටමේ අපේ ජනතාවට විශාල ආර්ථික වැඩපිළිවෙළක් කරන්න, බැසිල් රාජපක්ෂ මැතිතුමා ලක්ෂ 40, ලක්ෂ 100 වැඩ පිළිවෙලවල් තියෙනවා. අතිගරු ජනාධිපතිතුමාගේ හා රජයේ දර්ශනය ක්‍රියාත්මක කරලා, විෂමතා නැති කරන්න බලාපොරොත්තු වෙනවා. උඩුගම බහුකාර්යය ගොඩනැගිල්ල ගැන කතා කලා. එම ශාලාව නොමිලේ දීලා, ශාලාවේ සිවිලින් කඩාවැටිලා, නිසි නඩත්තුවක් නැතිවෙලා, විනාශ වෙනවා. ඒ නිසා නොමිලේ දෙනවට වඩා, ගොඩනැගිල්ලේ නඩත්තු කටයුතු සඳහා වත් යම් මුදලක් අය කරන්න කියලා ඉල්ලනවා. සහන මුදලක් හෝ නඩත්තු මුදලක් අරගන්න.

වටවල වැවිලි සමාගම, අපි මුලා කරන, අපිව අනාථ කරන වැඩ කරනවා. පහුගිය දිනවල මගේ ඉල්ලීම් තිබුණා. වටවල වතු සමාගම විසින් මාමණ්ඩදොළ පාරට එන ජලය හා මාමණ්ඩදොළ ඇළට දාන අපද්‍රව්‍ය ඉවත් කරලා දෙන්න කියලා. ඒ පිළිබඳව දැනුවත් කරලා, ලිපියක් දාලා, පිටපතක් මටත් එවලා තිබුනා. නමුත් ඒ සමාගමෙන් කිසිදු පිළිතුරක් නැහැ. කෝටි ගණන් වලින් වැඩ කරනවා. නමුත් පරිසරය විනාශ කරලා, වටවල වැවිලි සමාගම ගැන අප්‍රසාදය පළ කර සිටිනවා. බොහොම ස්තූතියි.

**ගරු මන්ත්‍රී නිශාන්ත නන්දන මහතා**

ගරු සභාපතිතුමා ඇතුළු සමස්ත සභාවෙන් අවසරයි. අපි අයවැයට විරුද්ධව ඡන්දය දුන්නා. මොකද ඒකත් සාමාන්‍ය වෙලා තියෙනවා. මොකද ඔබතුමා අපට සලකන විදිහට. අපේ අජිත් එඩේරආරච්චි හිටපු සභාපතිතුමා ප්‍රකාශ කළා. ඔබතුමා බලයට ආපු දින සිට මා දන්නා තරමින්, අද දක්වා මේ විපක්ෂයේ මන්ත්‍රීවරයෙකුට කිසිම දෙයක් දීලා නැහැ. ඒ නිසා අයවැය හොඳද, නරක ද කියලා අපට බලන්න ඕන නැහැ. සමහර විට පෞද්ගලික හේතු මත මේ මන්ත්‍රීවරු අපට ඡන්දය දෙන්න එපා කියනවා ඇති. මොකද ඡන්දය දුන්නා කියලා වැඩකුත් නැහැ. පිරිහෙන කොට පිරිහෙනවා. නැගිටිනකොට නැගිටිනවා. ඒක තමයි දේශපාලන ක්‍රමය. අයවැයේ අංක ටිකක් පමණයි වෙනස් වෙලා තියෙන්නෙ. මේ සැරේ ගෑස් මිල එකතු වෙලා තියෙනවා. නමුත් සභාපතිතුමනි, ඔබතුමාට කෝටි එකහමාරක් ලැබුණා. ඊට පෙර මුද්දර ගාස්තු, උසාවි දඩ මුදල්, ඔප්පු අලුතින් ලියවුනෙත් නැහැ. උසාවි දඩත් නැහැ. ඔබතුමා ආවට පස්සේ කෝටි දෙක තුනක් ආවා. නමුත් පහුගිය අවුරුදු දෙක තුන තුළ ආදායම අඩු වෙලා. වියදම වැඩි වෙලා. නමුත් ඔබතුමාටවත්, මටවත් ඒවා නවත්වන්න බැහැ. මේ තියෙන ආර්ථිකයත් එක්ක, අයවැය වැඩි කරගන්න ක්‍රමවේදයක් අපි කාතුළවත් නැහැ. ඒ නිසා ජේ.සී.බී යන්ත්‍රය වගේ ඔය තියෙන වාහන නවත්වන්න වෙයි. ඊට අමතරව ආදායම එකතු කරගන්න ක්‍රමවේදයක් නැහැ. මේ දවස් වල ගනේවත්ත මහත්මයා පාර හදනවා. එතුමා සභාවෙ නැහැ. නමුත් 2010දී ෆොන්සේකා මහත්මයා මාපලගමට එනවිට කාබිල් පාර වැහුවා. හේතුව තමයි. එම පාරේ කිලෝමීටර් 25 බැගින්, තුන් පලකින්, වංගු තුනක් කාපට් කළා. අවුරුදු 11ට එක පලුද්දක් නැහැ. මෙවර පාර හදනවා. ගල් කියුබ් එක 3800.00 යි. ගරු සභාපතිතුමනි, තුනී කරලා කාපට් එක ගහන්නේ. ඇත්තටම කරනවානම්, ඊට අඩුවෙන් කරන්න තිබුණා. ප්‍රායෝගිකව උදේ හවස යන පාර නිසා මම කිව්වේ. කිසිම පළුද්දක් තිබුණේ නැහැ. මෙම පාර කාපට් කරන්න යන වියදම බලන්න. තාක්ෂණය අඩු කරල හරි, මොකද මීට පෙරත් මේ පාරේ බර වාහන ගමන් කලා. දැන් රටේ සල්ලි යන්නේ මේ තත්වෙට. මේවා පිළිබඳව අපි සභාව හැටියට දිස්ත්‍රික් සංවර්ධන කමිටු, ඔබ නියෝජනය ආයතන, මොනවට හරි ගිහිල්ලා, මේ අදහස් ප්‍රකාශ කරන්න කියලා ඉල්ලා සිටිනවා. මොකද මේ රටේ සල්ලි ඒ විදියට අවභාවිතා වෙන්නේ. උප සභාපතිතුමා කිව්ව වගේ, වටවල වැව්ලි සමාගම අපි සෙල්ලමකට අරගෙන, ඔවුන් හිතුමතේ වැඩ කරනවා. ඔවුන් මේ සභාවේ නීතිය ගණන් ගන්නේ නැහැ. මීට කලින් හිටපු සභාපති වරු මුලා කරලා, ඔවුන්ගේ අරමුණු කරා යනවා. ඒත් කමක් නැහැ. ඔය කියන ප්‍රදේශය විදේශිකයෝ පිනවන තැනක් හදන්න යනවද දන්නේ නැහැ. නමුත් සභාවේ මන්ත්‍රීවරු ලෙස ඔවුන් කරන දේවල් වලට අපි ඇත්තටම කණගාටු වෙනවා. ජනතාව සූරාකන ආයතනයක් තමයි වටවල වැව්ලි සමාගම. රුපියල් 1000.00 ට මිනිස්සු යොදවලා හොරාට අදටත් කටුපොල් හිටවනවා. රටේ එක නීතියක් ක්‍රියාත්මක වෙන්නේ නැහැ. තහනම් කරපු කටුපොල් වගාව සක්‍රියව කරගෙන යනවා. ඔවුන් පිළිබඳ සභාව මීට වඩා සොයා බැලිය යුතුයි. සභාව ගනන් ගන්නෙ නැති තත්ත්වයක ඉන්නේ. ඔවුන්ගෙන් ගන්න පුළුවන් දෙයක් තියෙනවනම්, මේ පිළිබඳව සලකා බලන්න. මොකද ඉස්සර අපිට ගොඩක් ආදායම් ලැබුණු තැනක් එතන. ඊට වඩා කතා කරන්න යන්නේ නැහැ. ඔබ සැමට සුභ දවසක් පතමින්, මම නිහඬ වෙනවා. ස්තූතියි.

**ගරු සභාපතිතුමාගේ මූලාසන කතාව**

ගරු උප සභාපතිතුමා ඇතුළු සමස්ත සභාවෙන් අවසරයි. මම පළමුවෙන්ම, අද දින ඉදිරිපත් කළ 2022 වර්ෂයේ අයවැය සම්මත කිරීම පිළිබඳව මුළු මන්ත්‍රී මණ්ඩලයට ස්තූතිවන්ත වෙනවා. විපක්ෂ අදහස් පළ වුවත්, ඔබ සියලු දෙනාම දන්නවා. වර්තමානයේ ඇති වී ඇති අර්බුද හමුවේ වුවත්, අප සභාව විසින් ඉටු විය යුතු සේවාවන්, අපට හැකි උපරිමයෙන් ඉටුකරන බව. කොහොම නමුත් ධනංජය මන්ත්‍රීතුමා ප්‍රකාශ කළ පරිදි, කිසිම ආණ්ඩුවකට, කිසිම ජනාධිපතිවරයෙකුට මුහුණදෙන්න නොවූ තත්ත්වයක් දැන් තියෙන්නෙ. එයට මමත් තවත් දෙයක් එකතු කරන්නම්. ඒ තමයි මේ

ප්‍රාදේශීය සභාවේ, මෙතෙක් සිටි සභාපතිවරුන්ට මුහුණ දෙන්න සිදු නොවූ කරුණු කාරණාවලට මට මුහුණ දෙන්න සිදු වීම පිළිබඳව. මන්ද ඔබතුමාල දන්නවා. පෙර සභාපතිවරුන් වග කීවේ මන්ත්‍රීවරු දොළොස් දෙනකුට පමණයි. දැන් මන්ත්‍රීවරු 27 දෙනෙක් බවට පත්වෙලා. පාලක පක්ෂයේ සභාපතිවරු මෙතුවක් තම සභාව පාලනය කළේ, තමන්ගේම පක්ෂ ආණ්ඩු යටතේ. නමුත් මට වුනේ ඊට හාත්පසින්ම වෙනස් දෙයක්. 2018 වර්ෂයේ දී අපි සභාව ජයග්‍රහනය කරන විට තිබුනේ එක්සත් ජාතික පක්ෂ ආණ්ඩුවක්. අවුරුදු දෙකක් ඔවුන් යටතේ සිටි අපි අපේ ආණ්ඩුවක් පිහිටුවාගෙන තවම අවුරුදු එකයි ගත වුණේ. අපේ ජනාධිපති වරයෙකු පත්කරගෙන අපි බලාපොරොත්තු ඉටු කරගෙන යන විට, ලෝකයම වෙලාගත් කොවිඩ් වසංගතයට මුහුණ දෙන්න සිදුවුණා. එදා ඉඳලා අද වෙනකන් අපිට ඒ වසංගතයෙන් මිදෙන්න බැරි වුනත්, අපි අපේ සංවර්ධන ක්‍රියාදාමයන් අඩුවක් නැතිව කරගෙන යනවා. ඒ අනුව ඔබතුමාලා දන්නවා මෙතෙක් කල් සිටි සභාපතිවරුන්ට කරගත නොහැකි වූ ව්‍යාපෘති දෙකක්, අපගේ උනන්දුව මත ඉටුවන බව. ඒ ආදාහනාගාරය සහ වෙළෙඳ සංකීරණය. අනිකුත් පොදු අවශ්‍යතා අපට පුළුවන් ආකාරයෙන් ඉටු කරන බවත්, ඔබතුමාලා දන්නවා. වීදි ලාම්පු සවි කිරීම්, අලුත්වැඩියාවන් ආදිය වර්තමානයේ මිල අධික වුවත්, ඒවා ද අඛණ්ඩව කරගෙන යනවා. ඉස්සර කම්කරුවන් විසිගණනක් සිටිය සභාවෙ වර්තමානයෙහි කම්කරුවන් හත් දෙනකුගෙන් කරගෙන යන්නේ. එයින් තුන්දෙනෙක් සභා කාර්යාලයේ වැඩ. මේ සියලු දේවල් ගැන කල්පනා කරන විට මම පෞද්ගලිකව සිතනවා. මා ඉදිරිපත් කළ අයවැය වර්තමානයට ගැලපෙන අය-වැයක් ලෙස. ඉදිරි වර්ෂයේදී මෙම අයවැයෙන් ඉදිරිපත් කොට ඇති සියලු සංවර්ධන ක්‍රියාවලියන් ඉටුකිරීමට ඔබතුමාලගේ සහය අපේක්ෂා කරමින්, අද දින මන්ත්‍රීවරුන් ඉදිරිපත් කළ අදහස් වලට පිළිතුරක් ලබා දීමටත් මම බලාපොරොත්තු වෙනවා.

ගරු මන්ත්‍රීවරුනි, වර්තමානයේ ඇතිවී තිබෙන ආර්ථික අර්බුදය පිළිබඳව අත දරුවාගේ ඉඳලා දන්න කාරණයක්. අද පත්තරේ තියෙනවා වසර 41 කට පසු ඇමරිකාවේ ඛනිජ තෙල් මිල 58% කින් ඉහළ ගියා කියලා. බලගතුම රට මෙහෙමනම්, මෙවැනි ලෝක වාතාවරණයක් තියෙද්දි මේ පුංචි රටේ ප්‍රශ්න මේ ආකාරයෙන් යන එක සම්බන්ධයෙන් අපි සතුටු වෙන්න ඕන. ඔබතුමාලා දන්නවා. 2004 සුනාමි ආවා. රට විනාශයට පත්වුණා. එවිටත් ලෝකෙ කුරිරු ත්‍රස්තවාදීන්, එල්ටීටීඊ සංවිධානය, එයාලා මොකද කළේ. අවස්ථාවෙන් ප්‍රයෝජන ගත්තෙ නැහැ. එයාලත් අවි ආයුධ බිම තියලා, මේ රටට වෙච්ච විපත්තිය දැකලා එකතුව වැඩ කළා. ඇයි අපට අද එකතුවෙලා වැඩ කරන්න බැරි? ඇයි දේශපාලන මතිමතාන්තර එක්ක ගැටුම් ඇති කරගන්නේ? අපි ගිනි ගොඩක ඉන්නේ. කවුරුත් ඒක දන්නවා. පවතින තත්ත්වයට අනුගත වෙලා කටයුතු කරනවා මිසක් එක එක්කෙනාට බෝලෙ පාස් කරන්නෙ නැතුව ඉන්නවනම්, රටට යහපතක් වෙනවා. ඒ නිසා අවංකව ඔබතුමාල හිතට ගන්න. අපි බලාපොරොත්තු වුණේ, වංචා දූෂණයෙන් තොර රටක්. ඒ නිසා තමයි 69 ලක්ෂයක් ජනතාව, ගෝඨාභය මහත්තයට ඡන්දය දුන්නේ. මාස හයක් යනකන් කරගෙන ආවා. කොවිඩ් වසංගතයක් එක්ක මුළු ලෝකයම කඩා වැටුනා. අපි හදවතින් එය දන්නවා. ඒ අවස්ථාවෙන් ප්‍රයෝජන ගන්න නරකයි.

ගරු සහබන්දු මන්ත්‍රීතුමා ඇප්තොප්වත්තේ දර පිළිබඳව කතා කළා. ඔබ කවුරුත් දන්නවා. අප සභාව විසින් කොම්පෝස්ට් අංගනය පවත්වාගෙන යන ඇප්තොප්වත්ත පිළිබඳව. මේ වන විට මෙහි අයිතිය සභාව සතු කොටගෙන, අක්කර පහ භූමි ප්‍රමාණයේ තිබුණු වල් ගස් කපා, සුද්ධ පවිත්‍ර කළ බව. එහි කපා බිම හෙලූ වල් දර අසල ඇති මහලියද්දට මිළගණන් කැඳවා, ලබාදී තියෙනවා. එහි බිල්පත් සහ තල්ගස්වල පොළ භූමිය එළි කිරීමේදී ඉවත් කල දර වල විකිණීම පිළිබඳවත්, බිල් ඉදිරි සභාවට ඉදිරිපත් කිරීමට කටයුතු සිදු කරනවා. මේ සියලු දේ විනිවිදව කරන බව ප්‍රකාශ කරන්න කැමතියි.

ගරු මන්ත්‍රී වසන්ත කුමාරගේ මහතා ප්‍රකාශ කළා. ආදාහනාගාර ප්‍රවිෂ්ට මාර්ගයේ ගලක් බෝර ගැසීම සම්බන්ධයෙන් ඔබතුමාගේ ප්‍රකාශය ගැන පිළිබඳව කණගාටුයි. ඔබතුමා මෙම සභාවේ මා සභාපති ධූරය දරන කාලවකවානුව තුළ යම් අයත් හා මුදල් ගනුදෙනුවක් හෝ වෙනත් අයථා දෙයක් සිදු වූ

බවට ඔප්පු කළොත්, මම ඒ අවස්ථාවෙම මෙම ධුරයෙන් මෙන්ම මන්ත්‍රීධුරයෙන් ද ඉල්ලා අස්වන බව ප්‍රකාශ කරන්න කැමතියි. ඔය ගල කඩා ඉවත් කරන්න (කෙමිකල් දමා) රුපියල් ලක්ෂ හතරක් පමණ යන බව කේ ඩී ඒ ඩබ්ලිව් සමාගමෙන් මා සමග පැවසුවා. ඒ තරම් මුදලක් අපට වියදම් කිරීම අපහසු නිසා, සාමාන්‍ය ක්‍රමයට ගල කැඩීමට ලක්ෂ 1 1/2 ක් පමණ බවත්, අවට ගෙවල් තියෙන නිසා අනතුරුදායක බවත් නිසා තමයි කෙමිකල් දමා ගල පිපිරවීම කළ යුත්තේ කියලා ඔවුන් කිව්වේ. ඔවුන් මීට ප්‍රථම මගේ ඉල්ලීම පිට ආදාහනාගාර භූමියේ තිබුනු ගල් තුනක් නොමිලයේම පුපුරවා දුන්නා. ඊනනම් මට එයටද බිලක් දමන්න තිබුණා. මගේ එවැනි දෙකේ පන්තියේ වැඩ නැහැ. ඒ නිසා මම කියන්න කැමතියි. මගේ කාලයේ නෙවෙයි. මෙතෙක් හිටිය කිසි කෙනෙකුට නොදැවිනි මතක සිටින යමක් කොට තමයි මම සභාවෙන් යන්නේ.

ඒ වගේම නාගොඩ පෙර පාසල පිළිබඳව, ඔබතුමාලා දන්නවා. නාගොඩ පෙර පාසල තිබුණු තැන නායයෑමේ අවදානම නිසා, මීට අවුරුදු 15 ක පමණ සිට පවත්වාගෙන යන්නේ පෞද්ගලික ස්ථානවල බව. අඩුම ගණනේ වැසිකිලියක්වත් හදන්න බිම් කොටසක් නැති නාගොඩ, පෙරපාසලක් හදන්නේ කොහොමද කියලා ඔබතුමලා කියන්න. මම හෙටම ඒ සඳහා යොමු වෙනවා. මෙම අඩුපාඩු දැකපු නිසා තමයි මම් අතිගරු ගෝඨාභය රාජපක්ෂ ජනාධිපතිතුමා, උඩුගමට පැමිණි දින, පළමු යෝජනාව ලෙස නාගොඩ සංවර්ධන යෝජනාව ඉදිරිපත් කළේ. ඒ අනුව මේ වන විට එහි අදාළ පවරා ගැනීම් කටයුතු සිදු වෙනවා.

ගරු මන්ත්‍රීවරුනි සභාවේ ඉදිරිපත් කළ කරුණු කාරණා අනුව උඩුගම පුරනැගුම ශාලාව රජයේ සංවර්ධන ක්‍රියාවලි දැනුවත් කිරීම් වල දී, අවශ්‍යතාවය අනුව, නොමිලේ ලබාදීමට සිදුවෙනවා. ඒ වගේම සමහර රජයේ ආයතන වෙනස් ක්‍රියාවලි සඳහා ද මෙය නොමිලයේ ඉල්ලා සිටින අවස්ථාද තියෙනවා. එතනදී මා අපහසුතාවයට පත් වන අවස්ථා ඇති වෙනවා. ඒ අනුව තමයි මම උඩුගම සමෘද්ධි බැංකුවෙහි ඉල්ලීම, සභාවට ඉදිරිපත් කළේ. ඔබතුමන්ලාගේ අදහස් අනුව හ උප සභාපතිතුමා ගේ අදහස් අනුව, සහන ක්‍රමයකට, එම ඉල්ලීම ඉටු කිරීම කරන්නම්. මෙම ස්ථානය සභාවට ආදායමක් උත්පාදනය කරන ස්ථානයක් ලෙස නවීකරණය කොට, සභාවට ආදායමක් ලබා ගන්න පුළුවන් ආකාරයට සංවර්ධනය කිරීමට බලාපොරොත්තු වනවා. මම ඔබතුමාගෙන් ඉල්ලා සිටිනවා. මෙය නොමිලේ ලබාදීමට ඉල්ලීම් කිරීම නෙකරන ලෙස. තව ද මම මේ සභාවේ ගරු මන්ත්‍රීවරුන් ගෙන් ඉල්ලා සිටිනවා. ඉදිරියේදී නව යෝජනා, සංවර්ධන ඉල්ලීම්, නොකරන ලෙස. මන්ද මම ඒ පිළිබඳව ප්‍රායෝගිකව දන්න නිසා. මමත් 2002 වර්ෂයේ සිට අඛණ්ඩව මේ සභාව නියෝජනය කරනවා. මමත් මේ සභාවට යෝජනා සිය ගණනක් ඉදිරිපත් කරලා ඇති. නමුත් ඉටු වීම බින්දුවයි. මෙය තමයි ඇත්ත තිත්ත. ඒ අනුව ඔබතුමන්ලා මෙතුවක් ඉදිරිපත් කොට ඇති යෝජනා පිළිබඳව මූලිකත්වය දීලා, ඒවා පිළිබඳව පසු විපරමක් කොට, සභාවේ මූල්‍ය තත්ත්වය අනුව, ඒවා ක්‍රියාත්මක කරමු. නන්දන මන්ත්‍රීතුමා ප්‍රකාශ කළ පරිදි 2022 වර්ෂයේ සභා ආදායම් තත්ත්වය පිළිබඳව දැඩි ව විමසිලිමත් වන්න වෙනවා. අනවසර වෙළඳාම් කරන ස්ථාන වලින් නීත්‍යානුකූල බද්දක් ගැනීමට මෙන්ම, ආදායම් ඇහිරී ඇති ස්ථාන පිළිබඳව පසුවිපරම් කිරීමටත්, බලාපොරොත්තු වෙනවා. ප්‍රදේශයේ සෑම තැනම එළවළු වෙළඳාම් කරන බැවින්, අපේ පොළවල්වල ආදායම අඩුවී ඇති නිසා, පොළ බදු කරුවන් පොළවල් ටෙන්ඩර් ගැනීමට මැලිකමක් දක්වන බව පේනවා. එහෙම වුනොත් පොළවල් සභාව මගින් පවත්වාගෙන යෑම ද සිදුවෙනවා. කොහොම නමුත් මේ ලබන 2022 වර්ෂයේ දී සියලුම මන්ත්‍රීවරුන්ට මෙන්ම මන්ත්‍රීවරියන්ට තමන්ගේ බල ප්‍රදේශයේ යමක් කිරීමට අවශ්‍ය සහයෝගය සභාවෙන් ලබා දීමට මා අදහස් කරනවා.

නමුත් මගේ අඩුපාඩු තියෙනවා ඇති. මම කාටවත් අතීතය මතක් කරලා, නින්දා අපහාස කරන්න කැමැති නැහැ. දේශපාලන වශයෙන් බෙදුනට, අපි එලියෙදි එහෙම නැහැ. එක අම්මගෙ දරුවෝ වගේ අපි ඉන්නෙ. මම විපක්ෂයේ අය කියලා එහෙම වෙන් කරලා නැහැ. මට මේ තනතුර මහමෙරක් නොවෙයි. මම මෙම ආයතනයෙන් කා වඩාගන්න උත්සාහ කරලා නැහැ. සමහර දේවල් පසුවිපරම්

කරන්න අවස්ථාවක් ලැබෙන්නේ නැහැ. ඔබතුමාලා දොස් නගන්නේ ඒකයි. මට පලපුරුදු නිලධාරීන් නොමැති වීම ප්‍රශ්නයක්. ඒ වගේම පහළ ශ්‍රේණි අයගෙත් අඩුපාඩු බොහොමයි. ඔවුන්ගේ සේවාවන් නිසි අයුරින් වනවාද? ඔවුන් නිසියාකාරව රාජකාරියට වාර්තා කරනවාද කියා බලන්න නිලධාරීන් නොමැතිවීම විශාල ප්‍රශ්ණයක්. වාහන නඩත්තුව පිළිබඳවත් ප්‍රශ්ණකාරීයි. මෙවැනි වූ අඩුපාඩු රැසක තමයි සභාව පවත්වා ගෙන යන්නෙ. ඉදිරියේදී යම් යම් තීරණයන් ගැනීමට මා හට සිදු වේවි. ඔබතුමන්ලා මට දොස් නගන්නේ එවැනි තීරණ නොගන්නා නිසා බව මා දන්නවා. ඒ වගේම සමන් මන්ත්‍රීතුමාගේ ඉල්ලීම්, ඇස්තමේන්තු යවලා, නිලධාරීන් ඕන බලන්න. මොනවද වුනේ කියලා, මට මේ හැමදේම කරන්න බැහැ. වෙන සභාපතිවරුන් සභාවට එන්නේ නැහැ. නමුත් මම දවස් පහම සභාවට එනවා. උදේ වාඩි උනාම සවස 4:30 ට විතර යන්නේ. සමහර දිනයන්වලදී මගේ පෞද්ගලික දුරකථනයෙන් මා කතා කරන්නේ. මම මේ පුටුවට ගරු කරනවා. මෙහි ගරුත්වය තියලා තමයි මම යනවා නම් යන්නේ. ඒවගේම අයවැයට පක්ෂව, විපක්ෂව ඡන්දය ප්‍රකාශ කළ සියලුම සභිකයින්ට මාගේ එක හා සමාන ගරුත්වයත්, ස්තුතියත් පුදකරමින් අවුරුදු හතරක් පුරාවට අපට සහාය දැක්වූ ලේකම්තුමිය ඇතුළු නිලධාරී මණ්ඩලයේ සියලුම දෙනාම, මේ අවස්ථාවේ සිහිපත් කරමින්, හැමදෙනාටම ස්තුතිවන්ත වෙමින්, ලබන්නා වූ 2022 නව වර්ෂය සියළුම දෙනාට දුක් කරදරවලින් තොර වාසනාවන්ත වසරක් වේවායි පතමින් මම නිහඬ වෙනවා.

**සභා වාර්තාව ස්ථිර කිරීම පිළිබඳ ගරු සභාපතිතුමාගේ ප්‍රකාශය**

2021.12.14 දින පවත්වන ලද සභා වාරයේ රැස්වීම් වාර්තාවේ විරෝධතා නිවැරදිකිරීම් වලට යටත්ව සම්මත කරන ලද බව ගරු සභාපතිතුමා විසින් පිළිගන්නා ලදී.

සභාපති,
නාගොඩ ප්‍රාදේශීය සභා රැස්වීම් ශාලාවේදී දිනය:-